# මධ්‍යම සංස්කෘතික අරමුදල
# மத்திய கலாசார நிதியம்
# CENTRAL CULTURAL FUND

**වාර්ෂික වාර්තාව**
**ஆண்ட றிக்கை**
**ANNUAL REPORT**

# 2017

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය රැකගැනීමට අත දෙන්න
இலங்கையின் மேன்மையைப் பாதுகாப்பதற்கு உதவுங்கள்
**Help save the Glory that is Sri Lanka**

# මධ්‍යම සංස්කෘතික අරමුදල
# மத்திய கலாசார நிதியம்
# CENTRAL CULTURAL FUND

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය රැකගැනීමට අත දෙන්න
**இலங்கையின் மேன்மையைப் பாதுகாப்பதற்கு உதவுங்கள்**
Give A Hand To Protect Sri Lanka Glory

## වාර්ෂික වාර්තාව
## ஆண்ட றிக்கை
## ANNUAL REPORT
## 2017

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**MINISTRY OF EDUCATION**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01 | ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01-06 |
| 02 | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 07-52 |
| 03 | වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය | 53-95 |
| 04 | කාර්ය සාධන දර්ශකය | 96 |
| 05 | තිරසර සංවර්ධනය (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය | 97-98 |
| 06 | මානව සම්පත් පැතිකඩ | 99 |
| 07 | අනුකූලතා වාර්තාව | 100-106 |


# பொருளடக்கம்


| | | பக்கம் |
|---|---|---|
| 01. | நிறுவன விபரம்/நிறைவேற்றுச் சுருக்கம | 107-112 |
| 02. | முன்னேற்றம் மற்றும் முன்னோக்கு | 113-159 |
| 03. | வருடத்தின் மொத்த நிதிச் செயலாற்றுகை | 160-216 |
| 04. | செயற்றிறன் குறிகாட்டிகள | 217 |
| 05. | நிலைபேறான அபிவிருத்தி இலக்குகளைப் (SDG) பூர்த்தி செய்வதற்கான செயற்றிறன | 218-220 |
| 06. | மனித வள விவரம | 221-222 |
| 07. | இணக்கப்பாட்டு அறிக்கை | 223-229 |


# Contents


| | | Page |
|---|---|---|
| 01. | Corporate Profile/ Execution Summary | 230-234 |
| 02. | Progress and the Future Outlook | 235-285 |
| 03. | Total Financial Performance in the year | 286-330 |
| 04. | Performance Indicators | 331 |
| 05. | Performance in Achieving the Sustainable Development Goals (SDG) | 332-333 |
| 06. | Human Resource Profile | 334 |
| 07. | Compliance Report | 335-342 |

# 01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක ප්‍රවර්ධනය කිරීම සඳහා ද ශ්‍රී ලංකාවෙහි හා විදේශයන්හි සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී, ප්‍රතිසංස්කරණය කිරීමේ දී, ආරක්ෂා කිරීමේ දී සහ ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේ දී දරන ලද වියදම් පියවීම පිණිස ද කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයින්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැපයීම පිණිස ද සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද අරමුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මඟින් මධ්‍යම සංස්කෘතික අරමුදල ස්ථාපිත කර ඇත.

එවකට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ තිබූ මධ්‍යම සංස්කෘතික අරමුදල 2015.09.21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පැවරුණි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරනු ලබන අතර, 2017 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මෙහි පරිපාලන කටයුතු සිදුවිය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පරිපාලන ව්‍යුහය අනුව සංවර්ධන, පාලන හා මුදල් යන ප්‍රධාන අංශ 03 කින් සමන්විත වන අතර, එම අංශවල ප්‍රධානීන් ලෙස අධ්‍යක්ෂවරු තිදෙනෙකු කටයුතු කරනු ලබයි. එමෙන්ම ආගමික ස්ථානයන් සංවර්ධනය හා සංරක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් 2017 වර්ෂයේ ජූලි මාසයේ සිට ආගමික හා කලා කටයුතු අංශය නමින් නව අංශයක් පිහිටුවන ලදි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරන අතර, අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ලැබේ. මෙයට අමතරව නීති හා ප්‍රවාහන යන අංශයන් ද ක්‍රියාත්මක වන අතර, එය පාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක නොවන මධ්‍යම සංස්කෘතික අරමුදල, ඓතිහාසික උරුම ස්ථානවල දේශීය විදේශීය සංචාරක ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම තුළින් ආදායම් උපයන අතර, ඒ මඟින් සේවක පඩිනඩි ගෙවීම හා අනෙකුත් වියදම් පියවීම සිදුකරනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ ආදායම් වශයෙන් (ප්‍රවේශපත්‍ර හා අනෙකුත් ආදායම්) රුපියල් 4,428,079,228.09 ක මුදලක් අරමුදල වෙත ලැබී ඇති අතර, වියදම් ලෙස රුපියල් 4,110,177,745.35 ක මුදලක් වැය කර ඇත.

2017 වර්ෂයේ දී මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ව්‍යාපෘති 26 ක්‍රියාත්මක විය.

ඒ අනුව 2017 වර්ෂය සඳහා, කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ කාර්යයන් 138 ක් ද, සංරක්ෂණ වැඩබිම් 265 ක් ද වශයෙන් වැඩබිම් 403 ක් යෝජනා වී තිබුණි. මේ අතරින් වැඩබිම් 365 ක වැඩ ආරම්භ කිරීමට හැකි වූ අතර, වර්ෂ අවසානයේ දී කැණීම් වැඩබිම් 50 ක් හා සංරක්ෂණ වැඩබිම් 48 ක් වශයෙන් වැඩබිම් 98 ක වැඩ අවසන් කිරීමට හැකි විය.

මෙම වර්ෂය තුළ දී අපේක්ෂා කළ වැඩ ඒකක 287,134.80 ප්‍රමාණයෙන් වැඩ ඒකක 202,974.90 ක් අවසන් කර ඇති අතර, ඒ අනුව භෞතික ප්‍රගතිය 70.7% කි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා වියදම් වශයෙන් රු. 743,625,847.55 ක් වැය කළ අතර, මුළු වියදම්වල මූල්‍ය ප්‍රගතිය 51.7% කි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ගෝලීය ආශ්චර්යය බවට පත් කිරීම

- **මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය, සංවර්ධනය, ප්‍රවර්ධනය හා තිරසාර සංස්කෘතික ආර්ථික සාධනය මගින් පෙරදිග සංස්කෘතික උරුම කළමනාකරණය පිළිබඳ විශිෂ්ටත ම ආයතනය වීම

- **අරමුණු**

1. පුරාවිද්‍යාත්මක ගවේෂණ, පර්යේෂණ, කැණීම් හා සංරක්ෂණය සිදු කිරීම
2. ස්පර්ශීය හා අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම
3. ආයතනික මානව සම්පත දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පරිපූර්ණ තෘප්තිමත් පිරිසක් බවට පත් කිරීම
4. ආයතනය සතු තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය, බෙදා හැරීම සහ ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය සහ පවත්වාගෙන යාම
5. සංස්කෘතික අගයයන් රකිමින් පෙර අපර දෙදිග සංචාරක ආකර්ෂණය තුළින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් ප්‍රචලිත කිරීම
6. ආයතනයේ ආදායම් ඉලක්කයන් ඉදිරි වසර හතර තුළදී 30% කින් වර්ධනය කරගැනීම සහ ඒ තුළින් ආයතනික සේවාවන් වඩාත් කාර්යක්ෂම ව සහ උසස් පාරිභෝගික තෘප්තියකින් පවත්වාගෙන යාම
7. හඳුනාගත් සංස්කෘතික අගයන් සහ හර පද්ධතීන් සමාජගත කිරීම
8. බහු ආගමික සහ බහුජන සංහිඳියාවට සහ ජාතික සමගියට උරදීම
9. ජාතික ප්‍රතිපත්තීන්ට අනුව අන්තර්ජාතික සංවිධාන සහ ආයතනික සහයෝගීතාව ගොඩනැගීම
10. නූතන සමාජයට ගැළපෙන අයුරින් ආයතනයේ සේවාවන් නවීකරණය හා විවිධාංගීකරණය

### 1.3 කාර්යයන් හා පරමාර්ථ

- සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇති මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී වන වියදම් දැරීම
- ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ හා සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් දැරීම
- ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
- ආගම නංවාලීම, ආගමික ස්ථාන හෝ ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම
- සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්ගෙන් ජාතියට සේවය කර ඇති අය සඳහා ප්‍රදානයන් පිරිනැමීම
- කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට ආධාර සැලසීම
- මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයන්ට ආධාර ලබා දීම

## 1.4 සංවිධාන සටහන



Board Of Governors
Director General
HM 1-2
HM 1-1
MM 1-1
JM 1-1
MA 3
MA 2-2
MA 1-2
PL 3
PL 2
PL 1
Director (Finance)
Director (Admin)
Director (Development)
Assi. Director (Finance)
Assi. Director (Legal)
Assi. Director (Admin)
Archetecture
Assistant Director (pro.. & Pub.)
Assistant Director (Lab..& Mus..)
Assistant Director (Conservation)
Assistant Director (Archetecture)
Internal Auditer
Supply
Accounts Officer
Administration Officer
Senior Chemi. Conser. (Artifact/ pain.)
Publicity Officer
Musium keeper
Project Manager/ OIC
Senior Conse. Officer
Senior Arche. Officer
Manager (Bataleeya)
Sciennecetific Officer
Internal Audit Officer
Development Assistant
Chemical Con. (Art/ Pai.)
Production/ Archiving Officer
Meritime Arch.. Officer
Con.. Officer
Arch.. Officer
Book Keeper
Transport Assistant
Archivist/ Labararion
Contity Servey
Lab Assistant
Technical Assistant
Instructor (Art./ Scu/Leth/Cer.)
Senior Formen Production
Ticket Seller/ Shrof
Management
Management Assistant (Security)
Video Cameraman/ Photogrape
Sound Recorder
Qurator
Driver
Bulldozer Operator
Crane Operator
Carpenter
Mason
Plumber
Assi.
Grezer
Lab Atte.
Circui Bunglow Keeper
Lorry
Office
Group Leader
Security
Labour

## 1.5 මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පවතින ප්‍රධාන අංශ/ ව්‍යාපෘති

- **අරමුදල යටතේ පවතින ප්‍රධාන අංශ**
  - සංවර්ධන අංශය
  - පාලන අංශය
    i. නීති අංශය
    ii. ප්‍රවාහන අංශය
  - මුදල් අංශය
    i. සැපයුම් අංශය
    ii. ගබඩා අංශය
  - ආගමික හා කලා කටයුතු අංශය
  - අභ්‍යන්තර විගණන අංශය (අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ලැබේ.)

- **අරමුදල යටතේ පවතින ප්‍රධාන ව්‍යාපෘති**
  - අභයගිරිය ව්‍යාපෘතිය
  - ජේතවනය ව්‍යාපෘතිය
  - මහාවිහාරය ව්‍යාපෘතිය
  - සීගිරිය ව්‍යාපෘතිය
  - පොළොන්නරුව ආලාහන පරිවෙන ව්‍යාපෘතිය
  - මහනුවර ව්‍යාපෘතිය
  - දඹුල්ල ව්‍යාපෘතිය
  - යාපහුව ව්‍යාපෘතිය
  - දඹදෙණිය ව්‍යාපෘතිය
  - පඬුවස්නුවර ව්‍යාපෘතිය
  - කුරුණෑගල ව්‍යාපෘතිය

  වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘති

  - තිස්සමහාරාම ව්‍යාපෘතිය
  - මාතර ව්‍යාපෘතිය
  - රම්බා විහාරය ව්‍යාපෘතිය
  - ගාල්ල ව්‍යාපෘතිය

  රුහුණු සංස්කෘතික කලාපය

  - ගම්පහ ව්‍යාපෘතිය
  - කෑගල්ල ව්‍යාපෘතිය
  - කොළඹ ව්‍යාපෘතිය
  - ඉබ්බන්කටුව ව්‍යාපෘතිය
  - බදුල්ල ව්‍යාපෘතිය
  - රත්නපුර ව්‍යාපෘතිය
  - මොණරාගල ව්‍යාපෘතිය
  - යාපනය ව්‍යාපෘතිය
  - අපේගම විශේෂ ව්‍යාපෘතිය
  - අතපත්තු කාර්යාලය (ප්‍රකාශන අංශය)
  - ජාතික අනුරූ පාසල
  - ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය
  - බදුල්ල ව්‍යාපෘතිය

## 1.6 මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පවතින අරමුදල්

2017 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2017.12.31)

| අනු අංකය | විස්තරය | බලාපොරොත්තු වූ ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) |
|---|---|---|---|
| 01 | ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම | 3,900,000,000.00 | 3,829,269,326.00 |
| 02 | අනුරූ අලෙවි ආදායම | 10,000,000.00 | 9,646,237.60 |
| 03 | ප්‍රකාශන අලෙවි ආදායම | 10,000,000.00 | 10,293,662.49 |
| 04 | මුද්‍රණ අලෙවි ආදායම | 26,000,000.00 | 17,894,468.00 |
| 05 | ආයෝජන ආදායම | 470,000,000.00 | 497,842,926.00 |
| 06 | වෙනත් ආදායම | 34,000,000.00 | 63,132,628.00 |

| අනු අංකය | විස්තරය | ප්‍රගතිය (%) |
|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් | 88.37 |
| 02 | ප්‍රාග්ධන වියදම් | 69.41 |
| 03 | ආදායම් | 99.51 |



## 02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 මූල්‍ය ප්‍රගතිය

2016 - 2017 වර්ෂ සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | 2016 වර්ෂය | | 2017 වර්ෂය | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත වියදම (රු.) | සත්‍ය වියදම (රු.) | ඇස්තමේන්තු වූ වියදම (රු.) | සත්‍ය වියදම (රු.) |
| 01 | කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම් | 1,500,000,000.00 | 1,426,124,047.56 | 1,925,000,000.00 | 1,720,163,199.03 |
| 02 | ගමන් වියදම් | 50,000,000.00 | 19,973,852.19 | 27,500,000.00 | 23,542,782.82 |
| 03 | සැපයුම් වියදම් | 300,000,000.00 | 166,301,492.69 | 200,000,000.00 | 196,038,879.31 |
| 04 | නඩත්තු වියදම් | 100,000,000.00 | 62,628,968.10 | 44,500,000.00 | 52,266,602.34 |
| 05 | ගිවිසුම් ගත සේවා වියදම් | 148,000,000.00 | 75,191,242.94 | 1,048,500,000.00 | 875,506,420.91 |
| 06 | වෙනත් වියදම් | 572,000,000.00 | 189,568,606.34 | 500,000.00 | 1,067,095.94 |
| 07 | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් | 480,000,000.00 | 111,231,002.00 | 204,000,000.00 | 141,592,774.00 |

2017 වර්ෂය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කටයුතුවලට අමතරව අනෙකුත් දෛනික කාර්යාල කටයුතු සුපුරුදු පරිදි පවත්වාගෙන යන ලදි. එම කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තු අනුව සිදුකරන ලදි.

අරමුදලේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප්, දීමනා හා අනෙකුත් සුභ සාධන කටයුතු වෙනුවෙන් රු. 1,925,000,000.00 ක මුදලක් වෙන් කරන ලද අතර, ඉන් රු. 1,720,163,199.03 ක ප්‍රමාණයක් වියදම් වී ඇත. එම වියදම ප්‍රතිශතයක් ලෙස ගත්විට 2016 වර්ෂයේ 95.07% ක් වූ අතර 2017 වර්ෂයේ 89.35% ක් වන අතර, 2016 වර්ෂයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම ගමන් වියදම් 2017 වර්ෂයේ දී රු. 23,542,782.82 ක් ද 2016 වර්ෂයේ දී රු. 19,973,852.19 ක් වැය වී ඇත.

ආයතනයේ සැපයුම් කටයුතු වෙනුවෙන් රු. 200,000,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, ඉන් රු. 196,038,879.31 ක මුදලක් වියදම් වී ඇත. 2016වර්ෂයේ දී එය රු. 166,301,492.69 කි. එමෙන්ම නඩත්තු කටයුතු සඳහා රු. 52,266,602.34 ක මුදලක් වැය වී ඇත. 2016 නඩත්තු වියදම ප්‍රතිශතයක් ලෙස 22.14% ක් වන අතර, 2017 දී එය 117.45% ක් වී ඇත.

ගිවිසුම් ගත කටයුතු වෙනුවෙන් 2017 දී රු. 875,506,420.91 (83.50%) ක් වියදම් වී ඇති අතර, 2016 දී එය රු. 75,191,242.94 (50.80%) කි.

එමෙන්ම වෙනත් වියදම් යටතේ 2017 වර්ෂයේ දී කලාකරුවන්, ලේඛකයන් හා කතුවරුන් සඳහා රු. 1,475,000.00 ක් ද පුරාවිද්‍යා උරුම දායකත්වය වෙනුවෙන් රු. 154,138,494.25 ක් ද පරිත්‍යාග ලෙස රු. 19,373,794.16 ක මුදලක් ද ලබා දී ඇත.

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් ලෙස 2017 වර්ෂයේ දී රු. 141,592,774.00 (69.40%) ක මුදලක් වැය කර ඇති අතර, 2016 වර්ෂයේ දී එය රු. 47,161,767.00 (23.17%) කි.

2016 වර්ෂයේ දී විශේෂ අරමුදල් ව්‍යාපෘති ශේෂය රු. 16,821,196.14 ක් ද 2017 වර්ෂයේ දී එය රු. 16,853,701.57 ක් වී ඇත. එමෙන්ම විදේශ අරමුදල් ව්‍යාපෘති ශේෂය 2017 දී රු. 4,817,900.48 ක් ද 2016 දී එය 4,851,984.96 ක් වී ඇත.




| අනු අංකය | විස්තරය | ප්‍රගතිය (%) | |
|---|---|---|---|
| | | 2016 | 2017 |
| 01 | පුනරාවර්තන වියදම් | 72.65 | 88.37 |
| 02 | ප්‍රාග්ධන වියදම් | 23.17 | 69.41 |
| 03 | ආදායම් | 117.44 | 99.51 |

පුනරාවර්තන වියදම් 2016 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් ලෙස 72.65% ක් ද 2017 දී එය 88.37% ක් ද වේ. ප්‍රාග්ධන වියදම් 2016 දී 23.17% ක් වන අතර, 2017 දී එය 69.41% ක් ලෙස වැඩි වී ඇත. ඊට හේතු වී ඇත්තේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති විසින් නව වැඩබිම් ආරම්භ කිරිම හේතුවෙනි.

2016 දී ආදායම්වල ප්‍රගතිය 117.44% ක් වන අතර, 2017 දී එය 99.51% ක් වන අතර, පෙර වසරට සාපේක්ෂව වැඩිවේ යැයි බලාපොරොත්තු වූ ආදායම් ප්‍රමාණයට සාපේක්ෂව සත්‍ය වශයෙන් ම ලද ආදායම් ප්‍රමාණය අඩුවීම මෙසේ ආදායම් ප්‍රගතිය අඩුවීමට බලපා ඇත.



| අනු අංකය | විස්තරය | 2016 වර්ෂය | | 2017 වර්ෂය | |
|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) | ඇස්තමේන්තුගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) |
| 01 | ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම | 3,000,000,000.00 | 3,445,925,208.00 | 3,900,000,000.00 | 3,829,262,911.00 |
| 02 | අනුරූ අලෙවි ආදායම | 30,000,000.00 | 2,608,009.00 | 10,000,000.00 | 4,639,492.00 |
| 03 | ප්‍රකාශන අලෙවි ආදායම | 15,000,000.00 | 8,846,068.00 | 10,000,000.00 | 15,124,620.00 |
| 04 | මුද්‍රණ අලෙවි ආදායම | 15,000,000.00 | 13,155,989.00 | 26,000,000.00 | 17,894,468.00 |
| 05 | ආයෝජන ආදායම | 115,000,000.00 | 233,863,909.00 | 470,000,000.00 | 497,842,926.00 |
| 06 | වෙනත් ආදායම | 25,000,000.00 | 53,661,110.00 | 34,000,000.00 | 62,789,373.00 |

2017 වර්ෂයේ දී දෙස් විදෙස් සංචාරකයින්ට සංචාරක ප්‍රවේශපත්‍ර අලෙවිකිරීම තුළින් රු. 3,829,262,911.00 ක මුදලක් ලැබී ඇති අතර, 2016 වර්ෂයේ දී රු. 3,445,925,208.00 ක් විය. සංචාරක ප්‍රවර්ධන කටයුතු වර්ධනය කිරීම හා සංචාරක පැමිණීම වර්ධනය හේතුවෙන් ප්‍රවේශපත් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනය වීමට ප්‍රබල ලෙසම බලපා ඇත.

2017 දී අනුරූ, ප්‍රකාශන හා මුද්‍රණ අලෙවි ආදායම ලෙස රු. 37,658,580.00 (98.82%) ක් ද 2016 දී රු. 24,610,066.00 (28.63%) ක් ද උපයාගෙන ඇත. එමෙන්ම 2016 සාපේක්ෂව 2017 දී ප්‍රකාශන හා මුද්‍රණ අලෙවි ආදායම වර්ධනය වී ඇත. 2016 වර්ෂයේ දී මුද්‍රණ ආදායම රු. 13,155,989.00 ක් වූ එම අදායම 2017 දී රු. 17,894,468.00 ක් වේ.

එමෙන්ම ආයෝජන ආදායම 2016 වර්ෂයට වඩා රු. 263,979,017.00 කින් වැඩි වී ඇති අතර, වෙනත් ආදායම් ද 2016 වර්ෂයට සාපේක්ෂව රු. 9,128,263.00 කින් වර්ධනය වී තිබේ.

**ආදායම් ප්‍රගතිය**



## 2.2 භෞතික ප්‍රගතිය

ඒ අනුව, 2017 වර්ෂය තුළ දී පුරාවිද්‍යා පර්යේෂණ, කැණීම්, සංරක්ෂණ හා සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ කාර්යයන් ප්‍රධාන ව්‍යාපෘති 26 ක් තුළ සිදු කරන ලදී. ඉකත් වූ වර්ෂය සඳහා යථෝක්ත සියලු ව්‍යාපෘති ආවරණය වන පරිදි කාර්යයන් 403 ක් යෝජනා වූවත් විවිධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් කාර්යයන් 365 ක් ආරම්භ කිරීමට හැකි වූ අතර, ඉන් කාර්යයන් 98 ක වැඩ අවසන් කිරීමට හැකි විය.

දෙසැම්බර් මාසය අවසාන වන විට වර්ෂයට යෝජිත වැඩ ඒකක 287,134.80 කින් ඒකක 202,974.90 එනම්, 70.7% භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. වියදම් ලෙස රු. 743,625,847.55 (51.7%) ක් වැය කර ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඉහත සඳහන් සියලු ම කාර්යයන් කාර්යක්ෂමව හා සාර්ථකව ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් පාලන අංශය යටතේ පවතින ප්‍රවාහන අංශය මඟින් සිදු කෙරිණි.

- **අභයගිරිය ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

කපරාමුල පරීක්ෂණ කැණීම, විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර කැණීම, කපරාමුල පෙත්මඟ කැණීම හා කපරාමුල වයඹදිග ආවාස ගොඩනැගිල්ල කැණීම යන කැණීම් ද පුරාවිද්‍යා කටයුතු මඟින් හමු වී ඇති පුරාවස්තු පිළිබඳ වර්ගීකරණ, විශ්ලේෂණ, විද්‍යාත්මක, ලේඛනගත කිරීම් යනාදිය ද සිදු කරන ලදී.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 26,190,030.90 | 22,402,788.51 | 85.5% | 88.9% |

විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර කැණීම් කිරීමට පෙර

විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර කැණීම් කිරීමට පසු

කපාරමුල වයඹ දිග අවාස
ගොඩනැගිල්ල කැණීම් කිරීමට

කපාරමුල වයඹ දිග අවාස
ගොඩනැගිල්ල කැණීම් කිරීමට පසු

**සංරක්ෂණ හා නඩත්තු**

විජයාරාම ස්තූප සංරක්ෂණය, විජයාරාම බෝධිඝරය සංරක්ෂණය, විජයාරාම නැගෙනහිර දොරටුව හා ප්‍රාකාරය සංරක්ෂණය යන සංරක්ෂණ කටයුතු ද හූ දර්ශන සකස් කිරීම හා නඩත්තු කටයුතු ද සිදුකරන ලදි. තව ද අභයගිරිය විහාර භූමිය පුරාවට දෛනික ව එකතු වන කුණු රොඩු සෞඛ්‍යාරක්ෂිත ව ඉවත් කිරීමේ කාර්යයක් ලෙස අරමුණු කරගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

අභයගිරිය ප්‍රධාන රසායනාගාරය යටතේ 2017 වර්ෂයේ දී තඹ මිශ්‍ර ලෝහ පුරාවස්තු සංරක්ෂණය, තඹ මිශ්‍ර ලෝහ කාසි සංරක්ෂණය, තඹ මිශ්‍ර ලෝහ බුදු පිළිම සංරක්ෂණය, රිදී මිශ්‍ර ලෝහ කාසි සංරක්ෂණය, රිදී මිශ්‍ර ලෝහ පුරා වස්තු සංරක්ෂණය, යකඩ ලෝහ පුරා වස්තු සංරක්ෂණය, මැටි පුරාවස්තු සංරක්ෂණය, ශෛලමය පුරාවස්තු සංරක්ෂණය, වීදුරු පුරාවස්තු සංරක්ෂණය, බෙලිකටු පුරාවස්තු සංරක්ෂණය, අස්ථි පුරාවස්තු සංරක්ෂණය හුණුගල් පුරාවස්තු සංරක්ෂණය, රන්ලෝහ පුරාවස්තු සංරක්ෂණය, රුවන්මැලි සෑ විහාර මන්දිරයේ ඇති ශෛලමය බුදු පිළිමය සංරක්ෂණය, ජේතවන ස්තූපයේ පැරණි හුණු බදාම සංරක්ෂණය, අභයගිරි ව්‍යාපෘතියේ ස්මාරක නියාමනය හා ප්‍රලේඛන ගත කිරීම (ප්‍රථම සමාධිය, දෙවන සමාධිය රත්න පාසාදයේ මුරගල, සඳකඩ පහණ, දීඝපාෂාණ ලෙනෙහි පැරණි හුණු බදාම) කරන ලදි.

ක්ෂේත්‍රයෙන් හමු වූ මැටි බඳුන් ගොඩගැනීම හා පශ්චාත් විශ්ලේෂණය (රුවන්මැලි සෑ වැඩබිම - කාසි සහිත මැටි බඳුන, කපාරාරාම වැඩ බිම, ථූපාරාම දාන ශාලා කැඩීම් බිම, කිරිබත්වෙහෙර කැණීම් බිම - පුරාවස්තු සහිත මැටි බඳුන, වෙස්සගිරි ගුහා අංක 02 සංරක්ෂණ බිම උච්චවාලික ස්තූපයෙන් නමු වූ කාසි සහිත මැටි බඳුන), ක්ෂේත්‍ර සංරක්ෂණ කාර්යයන් (පොළොන්නරු ව්‍යාපෘතියට අයත් මහතලාකොළ වැව බුදු පිළිම සංරක්ෂණය, ත්‍රිකුණාමල ව්‍යාපෘතියට අයත් ලන්දේසි කොටුවේ ඇති කාලතුවක්කු රඳවනයේ මූලික සංරක්ෂණ කටයුතු, පොළොන්නරු ව්‍යාපෘතියට අයත් ගල් විහාර බුදු පිළිම සංරක්ෂණය) යනාදිය ද සිදු කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 119,316,215.96 | 75,361,374.50 | 63.2% | 76.6% |

විජයාරාම ස්තූපය සංරක්ෂණය
කිරීමට පෙර

විජයාරාම ස්තූපය සංරක්ෂණය
කිරීමට පසු

විජයාරාම නැගෙනහිර ප්‍රාකාරය
සංරක්ෂණය කිරීමට පෙර

විජයාරාම නැගෙනහිර ප්‍රාකාරය
සංරක්ෂණය කිරීමට පසු

සිල්වර් වයර් කැබැල්ල
රසායනාගාර සංරක්ෂණයට පෙර

සිල්වර් වයර් කැබැල්ල
රසායනාගාර සංරක්ෂණයට පසු

යකඩ පුරාවස්තු රසායනාගාර
සංරක්ෂණයට පෙර

යකඩ පුරාවස්තු රසායනාගාර
සංරක්ෂණයට පසු

➢ **ජේතවනය ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

JSWMP 2017 පර්යේෂණ කැණීම

මීට පෙර වැලි මළුව ආශ්‍රිතව සිදු කර ඇති පර්යේෂණ කැණීම්වලින් හඳුනාගනු ලැබූ පාංශු ස්ථර හා සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම, එම පාංශු ස්ථරවලින් හමු වූ සංස්කෘතික හා ස්වාභාවික සාධක සමඟ සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම, පූර්ව කැණීමක දී හඳුනා ගෙන තිබූ ජේතවන ස්තූප සලපතල මළුවේ බටහිර කොටසේ පැවති ඉදිකිරීම් සාධක දකුණු වැලිමළුව දෙසට ද ව්‍යාප්ත වන්නේ දැයි විමර්ශනය කිරීම හා නිරපේක්ෂ කාල නීර්ණය මඟින් ජේතවන භූමියේ ඉතිහාසය නිවැරදිව හඳුනා ගැනීම ජේතවන ස්තූප වැලි මළුවේ දකුණු දිශාවෙහි කරන ලද මෙම කැණීමේ ප්‍රධාන අරමුණ විය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා අධ්‍යයනාංශය හා එක් ව ජේතවන ස්තූපයේ වැලිමළුව ආශ්‍රිතව භූ භෞතික ගවේෂණයක් සිදු කොට පර්යේෂණ කැණීම ආරම්භ කළ අතර ජීර්ණයට ලක් වෙමින් පවතින මව් පාෂාණය හමු වීමෙන් අනතුරුව කැණීම් කටයුතු අවසන් කරන ලදී. මෙම කැණීමේ දී පුරාවස්තු ලෙස මැටි බඳුන් කොටස්, පබළු, යබොර කොටස්, තඹ නිර්මාණ, අස්ථි කොටස්, බෙල්ලන්, උළු කැබලි, ගඩොලු අවශේෂ හා අඟුරු කොටස් හමුවිය.

ජේතවන සලපතල මළුවේ නිරිතදිග කාර්තුවේ ශිලා ලේඛන අධ්‍යයනය

මෙම කොටසේ ශිලා ලිපි 300ක් පමණ හඳුනාගත් අතර, මේවායේ අක්ෂර පශ්චාත් බ්‍රාහ්මීය අක්ෂර බවත්, ඒවා ක්‍රි. පූ. 8-10 සියවස් වලට අයත් බවත් හඳුනාගෙන ඇත. නමුත් ඇතැම් ඒවායේ අක්ෂර මෑත කාලීන අක්ෂර බවට ද හඳුනා ගන්නා ලදී. අක්ෂර කියවා ගත නොහැකි ලෙස පැවතියත් පිටපත් කරන ලද ශිලා ලිපි අධ්‍යයනයේ දී පෙනී යන්නේ ප්‍රදානය කිරීම් සඳහා කරන ලද වියදම් ප්‍රමාණය, තනතුරු නාම වැනි තොරතුරු ය.

වෙස්සගිරි ගුහා පර්යේෂණ අධ්‍යයනය

ඉදිරි පර්යේෂණ සඳහා මූලික තොරතුරු රැස් කිරීම, ලෙන් ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් හඳුනාගැනීම, ලෙන් නිර්මාණ තාක්ෂණය හා එහි සුවිශේෂීතා හඳුනා ගැනීම, ලෙන් නිශ්චිත කොටු දැල් සිතියමකට අනුව වාර්තා කිරීම, ලෙන් ආශ්‍රිත වත්මන් තත්ත්වය වාර්තා කිරීම යන කරුණු අරමුණු ඇතිව මෙම පර්යේෂණය සිදු කරන ලදී.

මීට අමතරව ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පැවැත්වීම හා පුරාවස්තු විශ්ලේෂණය සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 15,810,705.00 | 11,476,043.00 | 72.6% | 80.6% |

**JSWMP 2017 පර්යේෂණ කැණීමට පෙර**

**JSWMP 2017 පර්යේෂණ කැණීමට පසු**

**ජේතවන සලපතල මළුවේ ශිලා ලිපි පිටපත් කරමින්**



**වෙස්සගිරිය ගුහා පර්යේෂණය අතරතුර**

**සංරක්ෂණ හා නඩත්තු**

උච්චවාලික රජමහා විහාර ස්තූප සංරක්ෂණය

ස්තූපයට උතුරු දිශාවෙන් ස්තූපයට සම්බන්ධ කරමින් ඉදි කරන ලද බුදු කුටිය පසු කාලීන ඉදි කිරීමක් විය හැකි බැවින් හා ස්තූපයේ අගයයන් ආරක්ෂා කිරීමේ දී මෙය අවහිරයක් වූ බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේත් මධ්‍යම සංස්කෘතික අරමුදලේත් අනුමැතිය ඇති ව විහාරාධිපතිගේ අවසරය ද ඇති ව බුදු කුටිය ඉවත් කර සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. අටපට්ටම් වේදිකාව සහිත ගර්භයේ සතර දිශාවේ පියගැටපෙළ සහ ප්‍රාකාර බැමි කොටස්, පේසාව, ගර්භය, යන කොටස් සංරක්ෂණය කරන ලදී.

වෙස්සගිරිය “සී” පර්වතය සංරක්ෂණය

වෙස්සගිරිය ස්මාරක භූමියේ S9, W3 ග්‍රිඩ් අංක යටතේ පිහිටි මෙම ලෙන වල් බිහි වී පැවතුණි. ඒ අනුව ලෙන ඇතුළත දකුණු දිශාවේ ගඩොල් බැම්ම සංරක්ෂණය, ලෙන ඇතුළත බටහිර දිශාවේ ගඩොල් බැම්ම සංරක්ෂණය, ලෙන ඉදිරිපිට පිල කොටස හා සක්මන් කොටස සංරක්ෂණය, ලෙන ඇතුළත උතුරු දිශාවේ ගඩොල් බැම්ම සංරක්ෂණය, ලෙන ඇතුළත නැගෙනහිර දිශාවේ ගඩොල් බැම්ම සංරක්ෂණය, ලෙන ඉදිරිපිට පිල කොටස හා සක්මන් කොටස සංරක්ෂණය, ලෙන ඇතුළත වේදිකාව සහිත කොටස සංරක්ෂණය, ලෙන ඇතුළත ගෙබිම සකස් කිරීම, ගෙම්දුලෙහි සිව් දිශාවෙහි අත්තිවාරම සැකසීම, ගෙම්දුලෙහි දකුණු දිශාවේ පිවිසුම් දොරටුව සහ පඩිපෙළ සැකසීම හා භූ දර්ශනය සැකසීම සිදුකරන ලදි.

ජේතවන ස්තූපයේ පැරණි බදාම සංරක්ෂණය, ආරාම "කේ" ප්‍රාකාර බැමි සංරක්ෂණය හා නඩත්තු කටයුතු සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 58,928,763.15 | 38,417,419.26 | 65.2% | 68.1% |

**උජ්ජවාලික රජමහා විහාරයේ ස්තූපය සංරක්ෂණයට පෙර**

**උජ්ජවාලික රජමහා විහාරයේ ස්තූපය සංරක්ෂණයට පසු**

**වෙස්සගිරිය "සී" පර්වතය සංරක්ෂණයට පෙර**

**වෙස්සගිරිය "සී" පර්වතය සංරක්ෂණයට පසු**

**කෞතුකාගාරය**

සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම හා අධ්‍යාපන ප්‍රවර්ධන වැඩ සටහන් පවත්වාගෙන යාම මීට අමතර ව සිදු විය.

➢ **මහාවිහාර ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

ථූපාරාම දාන ශාලාව කැණීම හා රුවන්මැලි සෑය නැගෙනහිර පිවිසුම දකුණු අර්ධය කැණීම මෙහිදී සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 7,045,039.50 | 7,558,412.00 | 107% | 104% |

**සංරක්ෂණ හා නඩත්තු**

ශ්‍රී මහා බෝධි පිටත ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, අංක 17 පොකුණ සංරක්ෂණය, මහා විහාර නැගෙනහිර සීමා ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, ඇතුළු නුවර සිට රුවන්මැලි සෑය දෙසට දිවෙන ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, රුවන්මැලි සෑ වැලිමළුව සංරක්ෂණය, රුවන්මැලි සෑ දකුණු පෙත්මග ඉදි කිරීම, රුවන්මැලි සෑ උතුරු පෙත්මග ඉදි කිරීම, රුවන්මැලි සෑ නැගෙනහිර පෙත්මග ඉදි කිරීම, රුවන්මැලි සෑ බෝ කොටුව ඉදි කිරීම, හේවිසි මණ්ඩපය ඉදි කිරීම, වැඩබිම් අංක 2 ii 4 ගොඩනැගිල්ල සංරක්ෂණය, වැඩබිම් අංක 2 ii 3 ගොඩනැගිල්ල සංරක්ෂණය, වැඩබිම් අංක 2 ii 1 A ගොඩනැගිල්ල සංරක්ෂණය, වැඩබිම් අංක 2 ii 1 B ගොඩනැගිල්ල සංරක්ෂණය, වැඩබිම් අංක 2 ii 1 C ගොඩනැගිල්ල සංරක්ෂණය, රුවන්මැලි සෑ නැගෙනහිර දොරටුව දකුණු අර්ධය ඉදිරිපිට ප්‍රාකාර කොටස් සංරක්ෂණය, රුවන්මැලි සෑ ඉතිහාස පුවරු නැවත ස්ථාපනය, රුවන්මැලි සෑ පුරාවස්තු තැන්පත් කිරීම, පහන්ගෙය ප්‍රතිස්ථාපනය, රුවන්මැලි සෑ නැගෙනහිර භූ දර්ශනය සකස් කිරීම,ආරක්ෂක මුරකුටිය හා රියදුරු විවේකාගාරය ඉදි කිරීම හා වාහන අංගණය ඉදි කිරීම සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 85,270,732.00 | 48,373,119.00 | 56.7% | 86.6% |

➢ **සීගිරිය ව්‍යාපෘතිය**

**සංරක්ෂණ හා නඩත්තු**

ගල මුදුන විද්‍යාත්මක නඩත්තු
පර්වත මස්තකයේ හෙක්ටයාර් 1 1/2 ක පමණ භූමියේ පවතින මාලිගයේ හා ඊට අනුබද්ධ උද්‍යානයේ නටබුන් විවිධාකාරයෙන් හානියට පත්ව ඇති බැවින් නැවත සංරක්ෂණය කිරීම මෙ යටතේ සිදු විය. ඒ අනුව අංක 01 බැම්ම සංරක්ෂණය, අංක 02 බැම්ම සංරක්ෂණය, අංක 03 බැම්ම සංරක්ෂණය, අංක 04 බැම්ම සංරක්ෂණය, අංක 05 බැම සංරක්ෂණය, අංක 06 බැම්ම සංරක්ෂණය, අංක 07 බැම්ම සංරක්ෂණය කිරීම කරන ලදි.

ජල උද්‍යානයේ විද්‍යාත්මක නඩත්තු

ජල උද්‍යානයේ ගඩොල්මය නිර්මාණයන් සඳහා පවතින හායන තත්ත්වයන් නිසි ආකාරයෙන් හඳුනාගනිමින් එම හායන තත්ත්වයන්ට සුදුසු පිළියම් යොදමින් දීර්ඝකාලීන පැවැත්ම තහවුරු කිරීමට කටයුතු කරන ලදි.

සිතුවම් සංරක්ෂණය

ආසන ගුහාව පැරණි සිතුවම් හා බදාම සංරක්ෂණය, B4 ගුහාව පැරණි බදාම ස්ථර සංරක්ෂණය, B14 ගුහාව පැරණි බදාම ස්ථර සංරක්ෂණය, B15 ගුහාව පැරණි බදාම ස්ථර සංරක්ෂණය, ශෛලමය ආරුක්කුව පැරණි බදාම ස්ථර සංරක්ෂණය, පහන්ගල පැරණි සිතුවම් බදාම ස්ථර සංරක්ෂණය, සිංහ පාදයේ ඇල්ගී මර්ධනය කිරීම හා නියාමන කටයුතු යටතේ ලයිකන මර්දනය හා කැටපත් පවුර හා සිතුවම් ගුහාවේ නියාමන කටයුතු සිදුකරන ලදි.

මැද මිදුල කලු ගල් බැම්ම සංරක්ෂණය හා විකල්ප මාර්ගයට කලුගල් ඇතිරීම (සීගිරිය ඇතුල් නගරයට අයත් උතුරු දොරටුවේ සිට බෝධිසරය දෙසින් මාලක උද්‍යාන ඔස්සේ දිවෙන විකල්ප මාර්ගය ලෙස හඳුන්වන මෙම මාර්ගය බොරළු පස යොදා සකස් කර තිබෙන්නකි. අඩි 12 ක පළලකින් මාර්ගයේ කළුගල් අතුරා අඩියක් පළලකින් කාණු කපා මාර්ගය සකස් කරන ලදී.)

නව ඉදිකිරීම් (මොරගහමුල වැසිකිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු, බටහිර දොරටුව අසල වැසිකිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු, අප්සරා කබානා 03 ඉදි කිරීම් කටයුතු) අභ්‍යන්තර මාර්ග පද්ධතිය නඩත්තු කටයුතු (බොරළු මාර්ගය, පෙත්මං) ද සිදුකරන ලදි.

දෛනික නඩත්තු කටයුතු සහ උද්‍යාන අලංකරණය හා නඩත්තු කටයුතු ද සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 282,545,157.68 | 109,452,943.76 | 38.7% | 59.8% |

ගලමුදුන පියගැටපෙළක් සංරක්ෂණයට පෙර

ගලමුදුන පියගැටපෙළක් සංරක්ෂණයට පසු



**ගිරිකුල නැගෙනහිර පොකුණ වටා බැමි සංරක්ෂණයට පෙර**

**ගිරිකුල නැගෙනහිර පොකුණ වටා බැමි සංරක්ෂණයට පෙර**

**ලයිකන මර්ධනය අතරතුර**

**ලයිකන මර්ධනයට පසු**

**කෞතුකාගාරය**

අධ්‍යාපනික හා සංස්කෘතික වැඩසටහන් යටතේ පාසල් සිසුන් හා ප්‍රජාව මුල් කරගනිමින් ශාස්ත්‍රීය මෙන් ම සමාජීය තේමා යටතේ දේශන පැවැත්වීම, සංස්කෘතික සංදර්ශන යටතේ වෙසක් පොහෝ දින පහන් කූඩු සංදර්ශනයක් හා පොසොන් පොහෝ දින බැති ගී ප්‍රසංගයක් ද නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි දී වීදි නාට්‍ය සංදර්ශනයක් හා අවිදා කලායතනය මඟින් සංස්කෘතික සංදර්ශනයක් ද පවත්වන ලදී.

මීට අමතර ව සීගිරිය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් වැඩි වෙලාවක් රඳවා ගැනීමට හා ඔවුන්ට විනෝදාස්වාදය සැපයීමේ අරමුණින් චිත්‍ර ඇඳීම හා සීගිරි කැටපත් පවුරේ ආකෘතියක් සකස් කර ඒ මත ඔවුන්ගේ අදහස් ලිවීමට හැකි වන සේ සකස් කිරීම කර ඇත.
සීගිරිය නැරඹීමට පැමිණෙන සංචාරකයින් වෙනුවෙන් සීගිරියට සමීප අලිගල ස්වාභාවික සංචරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ප්‍රේක්ෂකයින් හට වැඩි දැනුමක් ලබා දීමේ අරමුණින් ක්‍රියාකාරකම් හා බැඳුණු තාවකාලික ප්‍රදර්ශන කටයුතු පැවැත්වීම යනාදිය සිදුකරන ලදි.

- **පොළොන්නරුව ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

දෙමළ මහා සෑය කැණීම, නැගෙනහිර බටහිර පැරණි වීදිය පර්යේෂණය, ශිව දේවාල අංක 02 අසල වට ප්‍රාකාර බැම්ම කැණීම, ධනංජය පුරාණ විහාරය ස්තූප කැණීම, ශිව දේවාල අංක 01 පර්යේෂණ කැණීම, මහතලාකොලවැව ප්‍රතිමා ගෘහය කැණීම සිදුකරන ලදි.

කැණීම් අංශයේ කැණීම් වාර්තා සකස් කිරීම, මැටි බඳුන් වර්ගීකරණය යන කාර්යයන් ද සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 26,370,227.00 | 21,194,968.92 | 80.4% | 89.1% |

**දෙමළ මහා සෑය කැණීම අතරතුර**

**නැගෙනහිර බටහිර පැරණි වීදිය පර්යේෂණ කැණීමෙන් හමු වූ පුරාවස්තු කිහිපයක්**

**කන්දෙගම ධනංජය පුරාණ විහාර ස්තූප කැණීමෙන් හමු වූ පුරාවස්තු කිහිපයක්**

**සංරක්ෂණ හා නඩත්තු**

ඇතුළු නුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්මේ ඉතිරි වැඩ

බැම් කොටස් පාදා ගඩොල් පිරිසිදු කර, බැම් වල ගැලවී ඇති ගල් ඉවත් කර බැම් සැකසීම සිදු කරන ලදි.

දෙමළ මහා සෑය කැණීම් කළ කොටස තහවුරු කිරීම

2014 වර්ෂයේ ආරම්භ කරන ලද දෙමළ මහා සෑයේ කැණීම් කටයුතු මඟින් එම ස්තූපය ගඩොල්මය ස්තූපයක් ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වී ඇත. මේ අනුව කැණීම් කර ඇති කාර්තුව විධිමත් ලෙස සංරක්ෂණය සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.

වටදාගෙය සලපතලමළුව සංරක්ෂණය කිරිම.

වටදාගෙය පහළ මළුවේ ගල් ඇතිරුම, ඉහළ මළුවේ නැගෙනහිර දොරටුව කොටස නඩත්තු කටයුතු සිදු කිරීම හා නියමිත මට්ටමට වඩා පහතින් තිබූ ගල් පුවරු තෝරා ඒවායේ කස්තුර හොඳින් පාදා පිරිසිදු කර ජලය ගලා යාමට සකස් කර ගල් පුවරු නියමිත මට්ටමට ඔසවමින් සංරක්ෂණ කටයුතු සිදු කරන ලදි.

කන්දෙගම ධනංජය රජමහා විහාරය පැරණි චෛත්‍යය සංරක්ෂණය කිරීම

දිරාපත් වූ ගඩොල් ස්ථර අයනෙත් පැරණි ගැඩොල්වලට හානි නොවන සේ ක්‍රමානුකූල ඉවත් කර හුණු, උළුකුඩු සහ වැලි මිශ්‍ර බදාමයෙන් තහවුරු කර ඇත. ස්තූපය ආසන්නයේ ඇති විශාල බොරදමට සමාන ගඩොල් යොදා වරි තුනකින් නැවත ප්‍රතිනිර්මාණය කරන ලදි.

මීට අමතරව දෙමළ මහා සෑය කැණීම් අගල් සඳහා පුරගෙය ඉදිකිරීම හා මහතලාකොල වැව පිළිමගෙය සංරක්ෂණය කිරීමේ කටයුතු ද දළඳා මළුවේ හා පබළු වෙහෙර ස්මාරක විද්‍යාත්මක නඩත්තු, මැණික් වෙහෙර ස්මාරක විද්‍යාත්මක නඩත්තු, ලංකාතිලකය අවට ස්මාරක හා බැම් විද්‍යාත්මක නඩත්තු, කුමාර පොකුණ පඩිපෙළ සංරක්ෂණය කිරීම, රන්කොත් වෙහෙර සිට බද්ධ සීමා පාසාදය දක්වා ස්මාරක විද්‍යාත්මක නඩත්තු යනාදි විද්‍යාත්මක නඩත්තු කටයුතු ද සිදුකරන ලදි.

වටදාගෙය පිවිසීම සඳහා ඉදිකර ඇති පෙත්මග ඉදිරිපස ආබාධිතයන්ගේ රෝද පුටු තැබීමට තාවකාලික ආවරණයක් සැකසීම, වටදාගෙය ප්‍රධාන දොරටුව ඉදිරිපස සේදී යාම වළක්වා ගැනීම සඳහා තාවකාලික කලුගල් බැම්මක් බැඳ කාණු පද්ධතිය සැකසීම, ගල් විහාර වැසිකිළි සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු, රන්කොත් වෙහෙර රථගාල සේදී ගිය ස්ථාන අලුත්වැඩියා කිරීම, ආදිත්‍ය සංචාරක බංගලාවේ සිට ප්‍රධාන ගබඩාව දක්වා සේවක මහතුන් හට පානය කිරිම සඳහා ජලනල පද්ධතිය සකස් කිරීම හා ඉදිරිපස භූමිය සකස් කිරීම, ගල් විහාර පන්සලේ පහන්ගේය ඉදි කිරීම, ව්‍යාපෘති කළමනාකාර නිල නිවාසය අලුත්වැඩියා කිරීම, ව්‍යාපෘති කාර්යාලයේ තීන්ත ආලේප කිරීම, ගල් විහාර රථගාලේ සිට පඩිපෙළ දක්වා පෙත්මග ඉදි කිරීම, ගල් විහාර වැසිකිළි පද්ධතියේ බිම සැකසීම හා ගල් පොත වටා දම්වැල් දමා තීන්ත ආලේප කිරීම ද සිදුකරන ලදි.

ඇතුළුවීමේ දොරටුව, ගල් විහාරය, තිවංක පිළිමගෙය, පිට වීමේ දොරටුව, කෞතුකාගාරය ඉදිරිපස හා සියවස මුරකුටිය වශයෙන් නව ආරක්ෂක මුරකුටි කිහිපයක් ඉදිකිරීම, ගල් විහාර පන්සලේ භික්ෂු විශ්‍රාම ශාලාව අලුත්වැඩියා කිරීම, විදුලි ආලෝකකරණය, ගල් විහාර පන්සලේ නව ජල ටැංකි ඉදිකිරීම, කෞතුකාගාරයේ වැසිකිළි සංකීර්ණය ඉදිකිරීම, කෞතුකාගාරය අසළ ආපන ශාලාව ඉදිකිරීම, ගල් විහාරයේ පිවිසුම් මාර්ගය අලුත්වැඩියා කිරීම යනාදි නව ඉදිකිරීම් කටයුතු ද 2017 වර්ෂය තුළ දී සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 111,029,906.55 | 64,312,088.56 | 57.9% | 72.2% |

ඇතුළු නුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පෙර

ඇතුළු නුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පසු

මහතලාකොළවැව පිළිමගෙය සංරක්ෂණයට පාදා ගැනීමෙන් පසු

මහතලාකොළවැව පිළිමගෙය සංරක්ෂණය අතරතුර

අංක 2 ශිව දේවාලයේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පෙර

අංක 2 ශිව දේවාලයේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පෙර

**කෞතුකාගාරය**

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන පවත්වා ඇත.

- **මහනුවර ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේශණ**

මහනුවර ලෝක උරුම නගර ආශ්‍රිත ඩිජිටල් වාර්තාකරණය.

මහනුවර නගරය වර්තමානය වන විට යාවත්කාලීන නොවූ දත්ත ගොනුවක් යටතේ ක්‍රියාත්මක වන සංකල්පයක් නිසා කාලීනව සිදු වන වෙනස් වීම් වාර්තාකරණය කිරීම අත්‍යවශ්‍ය බැවින් දළදා මාළිගය සිට කිලෝමීටර එකක අරයකින් යුතු භූමිය ඩිජිටල් දත්ත ගොනුවක් යටතේ වාර්තා කිරීම සිදු කරන ලදී. ඒ අනුව, මහනුවර නගරය නගරයක් ලෙස ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා සිදු වූ වර්ධනය, වෙනස්වීම වාර්තාවක් ලෙස සකස් කිරීම සිදු කරන ලදී.

ශිලා මෙවලම් විශ්ලේෂණ කටයුතු.

මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බඹරගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ගවේශණ හා කැණීමෙන් හමු වූ ශිලා මෙවලම් අදියර දෙකක් යටතේ ආචාර්ය ශිරාන් දැරණියගල හා ආචාර්ය නිමල් පෙරේරා යන අයගේ විශේෂඥ සහාය ලබාගෙන විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී.

බෝගම්බර බන්ධනාගාර භූමිය ආශ්‍රිත ගවේශණය.

ක්‍රි.ව. 1786 දී එන්.ආර්. සොන්ඩන් නම් පොලිස් කොමසාරිස්වරයාගේ මැදිහත්වීවමන් මහනුවර නගරයේ ඉදි කරන ලද බෝගම්බර බන්ධනාගාරය ආශ්‍රිත විධිමත් ගවේෂණයක් අංශ කිහිපයකින් අවධාරණය වන පරිදි සිදු කරන ලදී. පුරාවිද්‍යා වටිනාකමකින් යුත් බන්ධනාගාරය පිළිබඳ නිවැරදිව හා විධිමත්ව දත්ත වාර්තා කිරීම, බෝගම්බර බන්ධනාගාරයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හා ඒ සඳහා යොදා ගත් තාක්ෂණය පිළිබඳ අධ්‍යනය කිරීම, බෝගම්බර බන්ධනාගාරය හා සබැඳි ජනප්‍රවාද හා මූලාශ විමර්ශණය කිරීම, බන්ධනාගාර රැඳිවියන් විසින් නිර්මානය කරනු ලැබූ චිත්‍ර, වඩු නිර්මාණ, කුරුටු ගී මගින් ඔවුන් තුළ පැවති ආකල්ප අධ්‍යනය කිරීම මෙම ගවේෂණයේ ප්‍රධාන අරමුණු විය.

පුස්කොළ පොත් අධ්‍යයනය.

මධ්‍යම පළාතේ පැරණි විහාරස්ථාන සතුව පවතින පුස්කොළ පොත් අධ්‍යයනය කිරීමේ අරමුණින් කටාරංගල රජ මහා විහාරය හා මැණික්හින්න පොත්ගුල් විහාරය සතුව පවතින පුස්කොළ පොත් අධ්‍යයනය කරන ලදී.ඒ අනුව, මෙම අධ්‍යයනයේදී පුස්කොළ පොත් පරීක්ෂා කිරීම, වර්ග කිරීම, නාමාවලිය සකස් කිරීම, අධ්‍යනය කිරීම, සිතුවම් පිටපත් කිරීම, ඡායාරූපගත කිරීම, වාර්තා ලිවීම, පරිගණක ගත කිරීම සිදු කරන ලදී.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 11,036,246.00 | 5,707,968.09 | 51.7% | 54.4% |

**සංරක්ෂණ හා නඩත්තු**

දියකෙලිනාව රජමහා විහාරයේ ධර්මශාලාව සංරක්ෂණය, නිත්තවෙල රජමහා විහාරයේ සංඝාවාස සංරක්ෂණය කිරීම, දෙගල්දොරුව රජමහා විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, අස්ගිරි විජේසුන්දරාරාම පොහොය ගෙය සංරක්ෂණය, පොල්ගොල්ල බෝධිමල්කඩ රජමහා විහාරයේ ආරක්ෂිත බැම්ම සංරක්ෂණය, අස්ගිරිය මඩුගල්ල විහාරස්ථානය අළුත්වැඩියා කිරීම හා ශාන්ත පාවුළු දේවස්ථානයේ බිත්ති හා ගෙබිම සංර්කෂණය ආදී සංරක්ෂණ කාර්යයන් සිදුකරන ලදි.

හිදගල රජමහා විහාරයේ ගම්පළ යුගයට අයත් හිටි බුද්ධ ප්‍රතිමාව සංරක්ෂණය, කතරගම දේවාලයේ පැලැක්කිය සංරක්ෂණය, නරේන්ද්‍රසිංහ රජමහා විහාර පිළිමගෙය සංරක්ෂණය, මාලගම්මන රජමහා විහාර පිළිමගෙය සංරක්ෂණය හා කඩිගමුව නාගවනාරාම රජමහා විහාරයේ සංරක්ෂණය යනාදි බිතුසිතුවම් සංරක්ෂණ කාර්යයන්ද සිදුකර ඇත.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 58,532,660.00 | 28,463,708.23 | 48.6% | 59.9% |

**කෞතුකාගාරය**

මහනුවර මැදවාසල කෞතුකාගාරය මගින් ශ්‍රී ලංකාවේ බිතුසිතුවම් උරුමය, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ඇසුරුම් ක්‍රම හා බඹරගල සහ එහි තදාශ්‍රිත ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම යනාදි මාතෘකාවන් යටතේ තාවකාලික ප්‍රදර්ශන තුනක් පවත්වන ලදී.

- **දඹුල්ල ව්‍යාපෘතිය**

**සංරක්ෂණ හා නඩත්තු**

සිතුවම් කෞතුකාගාරයේ සිතුවම් ගබඩාවේ ගබඩා කරන ලද කැන්වස් චිත්‍ර සංරක්ෂණය හා ආරක්ෂක කටයුතු, ගලිකිරියාව වනසිංහාරාමය ප්‍රතිමා සංරක්ෂණය හා දඹුල්ල ලෙන් විහාර සිතුවම් හා ප්‍රතිමා සංරක්ෂණය බිතුසිතුවම් සංරක්ෂණය යටතේ සිදුකරන ලද අතර, උකුවෙල වැලිගල පුරාණ රජමහා විහාරය හා ප්‍රකාශන ගබඩාව අළුත්වැඩියා කටයුතු වාස්තුවිද්‍යාත්මක සංරක්ෂණ යටතේ ද සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 102,196,281.75 | 25,153,924.64 | 24.6% | 34.3% |

**කෞතුකාගාරය**

කෞතුකාගාරයේ දෛනික නඩත්තු කටයුතු හා පිටත භූ දර්ශන සැකසීම හා නඩත්තු කිරීම් සිදු කිරීම හා පාසල් සිසුන්, ගුරුභවතුන් කාර්යය මණ්ඩල නිළධාරීන්, විශ්වවිද්‍යාල සිසුන් අරමුණු කොට ගෙන විවිධ තේමා යටතේ දේශනමාලා සංවිධානය කරන ලදි.

- **යාපහුව ව්‍යාපෘතිය**

**කැණීම් හා සංරක්ෂණ**

විසිතුරු දොරටුවට වම් පසින් ඇති මණ්ඩපය කැණීම.
යාපහුව බලකොටුවේ ඇතුල් නගරයේ විසිතුරු සෝපානයට දකුණු දිශානුගත ව සිදු කරන ලද මෙම කැණීම අදියර දෙකක් යටතේ සිදු කරන ලදී. පළමු අදියරයේදී පියගැට පහක්, බැම් පාදම් කොටස් , ගඩොල් හා උළු විසිරුමක සාධක පාදා ගැනීමට හැකි වූ අතර, දෙවන අදියරයේදී පියගැටපෙළ දෙපසින් පිටත ශීලාමය බැම්ම, ඇතුළත ශීලාමය බැම්ම, උළු හා ප්‍රමාණ කිහිපයකින් යුතු ඇණ හමු විය.

බංගලාපිටිය පනා බැමි පාදා ගැනීමේ කැණීම්.

අගල් ක්‍රමය, කොටු දැල් ක්‍රමය හා පර්යේෂණ වල ක්‍රමය යව ක්‍රම යටතේ කැණීම් කරන ලදි. පනා බැම්මෙන් කොටු දැල් පෙරලී ගියා යැයි අනුමාන කළ හැකි ගල් හා ගඩොල් කිහිපයක් කැණීමෙන් ප්‍රධාන ලෙසම අනාවරණය කර ගැනීමට හැකි වූ අතර, පුරාවස්තු කිහිපයක් ලෙස මැටි බඳුන් කැබලි, චීන මැටි බඳුන් කැබලි, යකඩ ඇණ, යබොර කොටස් උළු කැබලි අනාවරණය කර ගන්නා ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 9,835,663.60 | 4,649,532.15 | 47.3% | 48.4% |

**බංගලාපිටිය පනා බැමි පාදා ගැනීමට පෙර**

**බංගලාපිටිය පනා බැමි පාදා කැණීම් කිරීම් අතරතුර**

**සංරක්ෂණ හා නඩත්තු**

ප්‍රාකාර බැම්ම සංරක්ෂණය කොටස් කිහිපයක් යටතේ සිදු විය. ඒ අනුව, පිටත ප්‍රාකාර බැම්ම උතුරු සීමාවේ සිට නැගෙනහිර දොරටුව දක්වාත්, දකුණු දොරටුවේ සිට බටහිර දොරටුව දක්වාත් සංරක්ෂණය කරන ලදී. මෙහි ඇතැම් ස්ථාන හායනයට ලක් වී ඇති අතර එම ස්ථාන සංරක්ෂණය කර භූ දර්ශනය සැකසීම ද සිදු කරන ලදි.

**පිටත නගරයේ ස්ථූප සංරක්ෂණය**

බංගලාපිටිය ආරාමික සංකීරණයෙහි පිහිටා ඇති මෙම ස්ථූපය අවම මැදිහත් වීමක් යටතේ සංරක්ෂණය කිරීම කරන ලද අතර, පේසාව බැඳීමේ දී ගලවා ඉවත් කරන ලද ගඩොල්ම ඒ සඳහා භාවිතා කරන ලදි. සිමෙන්ති, පදම් කරන ලද හුණු, මෘදු වැලි, හුඹස් මැටි මිශ්‍රණය යොදා කුස්තුර පිරවීම සිදු කරන ලදී. සංරක්ෂණය සඳහා කරන ලද පාදා ගැනීමේදී ස්ථූපය මධ්‍යයේ යටිකුරුව නමා තිබූ හා කොටස් වලට කැඩී ගිය මැටි බඳුනක්, ස්ථූපයට ප්‍රවිෂ්ඨ වන සඳකඩ පහන, පියගැට දෙපස ගඩොලින් කල අත් වැට, මල් ආසනයක් යන සාධක මතු කර ගැනීමට හැකි විය. වර්ෂය අවසානයේ මෙහි සංරක්ෂණ කටයුතු තාවකාලිකව නවතා තබන ලදි.

පිට දිය අගල සංරක්ෂණය, නියදවනේ ලෙන් විහාරය අංක 01 ගෙබිම හා වහලය අලුත්වැඩියා කිරීම, ගුරුගොඩ ස්ථූප සංරක්ෂණය, විසිතුරු දොරටුව වම් පසින් ඇති පඩිපෙළ හා මණ්ඩපය සංරක්ෂණය කිරීම, නාගොල්ල ජන්තාඝරය වටා ඇති ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, D 13 ගුහා සංරක්ෂණය, බංගලාපිටිය පනා බැමි සංරක්ෂණය යනාදි සංරක්ෂණ කටයුතු ද නව ඉදිකිරීම් දේවරක්ඛිතාරාමයේ කලුගල් බැම්ම ඉදි කිරීම, යාපහුව පිට ප්‍රාකාරයේ නැගෙනහිර, දකුණු හා බටහිර යන ප්‍රධාන දොරටු තුන මුල් කර ගනිමින් මුර කුටි 03ක් ඉදි කිරීම, යාපහුව ව්‍යාපෘතියේ දේශන ශාලාව හා VIP වැසිකිළි ගොඩනැගිල්ල ඉදි කිරීම හා ව්‍යාපෘතියේ වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම කාර්යයන් සිදු කරන ලදී.

පුරාවස්තු යකඩ ලෝහ, පාෂාණ, අස්ථි, දැව,පබළු, මැටි, තඹ මිශ්‍ර ලෝහ කාසි,තඹ මිශ්‍ර ලෝහ පුරාවස්තු සංරක්ෂණය කිරීම හා නඩත්තු කටයුතු සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 47,455,580.00 | 35,575,758.82 | 75% | 86.6% |

**පිට ප්‍රාකාර බැම්මේ විද්‍යාත්මක නඩත්තු ආරම්භ කිරීමට පෙර**

**පිට ප්‍රාකාර බැම්මේ විද්‍යාත්මක නඩත්තු ආරම්භ කිරීමට පසු**

➢ **දඹදෙණිය ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

රුවන්ගිර කන්ද ආරණ්‍ය සේනාසනය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක ගවේෂණය - දෙවන අදියර, මැටියගනේ මයුරාවතී රජමහා විහාරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක ගවේෂණය (මෙම ගවේෂණය මඟින් පැරණි චෛත්‍ය ගොඩැල්ලක්, පැරණි සංඝාවාසය, බණමඩුව, ආසනඝරයක් යැයි අනුමාන කරන ස්මාරකයක් හා ලෙන් කිහිපයක් ආවරණය කර ගන්නා ලදි.), දඹදෙණිය ඓතිහාසික මැටි ප්‍රාකාර බැම්ම ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක ගවේෂණය හා රුවන්ගිරි කන්ද පැරණි ගොඩනැගිල්ල කැණීම යනාදිය සිදු කරන ලදි.

2017 වර්ෂයේදී කැණීම් වලින් හමු වී ඇති පුරාවස්තු පිරිසිදු කිරීම, ලියාපදිංචි කිරීම සහ ආරක්ෂිතව ගබඩා කිරීම මේ යටතේ සිදු විය.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 6,105,225.73 | 5,047,648.62 | 82.7% | 62.9% |

**රුවන්ගිරි කන්ද ගවේෂණයෙන් වාර්තා ගත කරන ලද ලෙන් කිහිපයක්**

**මැටියගනේ රජමහා විහාරය ආශ්‍රිත ගවේෂණයෙන් වාර්තාගත කරන ලද ස්මාරක කිහිපයක්**

- **පඬුවස්නුවර ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

දෙටියමුල්ල (මණ්ඩපොල) ජෙට්ඨතිස්සාරාමය ආශ්‍රිත ගවේෂණය.

පඬා වැව ආසන්න ව පිහිටා ඇති විහාරයක් වන මෙහි පුරාවිද්‍යාත්මක ස්ථාන රැසක් පවතින අතර මේවායේ ඇතැම් ඒවා ආවරණයක් නොමැති වීම හේතුවෙන් විනාශයට පත් ව ඇත. එම පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනා ගැනීම මෙහිදී සිදුවිය.

පඬුවස්නුවර ව්‍යාපෘතියේ සංරක්ෂිත ස්මාරකවල වාස්තු විද්‍යාත්මක අධ්‍යයනය හා හඳුනා ගැනීම පිළිබඳ ගවේෂණය

දැනට සංරක්ෂණය කර අවසන් කර ඇති ස්මාරකයන් සඳහා අදාළ නාමයන් සඳහන් පුවරු සකස් කර ඇතත් ඒවායේ ඇතැම් ස්මාරක හඳුනා ගැනීම පිළිබඳ ව ගැටලු පවතී. මේ නිසා මහනුවර, අනුරාධපුරය පොළොන්නරුව හා වෙනත් ස්මාරකවල පවතින ප්‍රදේශ හා සංසන්දනය සිදු කර විස්තරාත්මක නිගමනයන් ලබා ගැනීම මෙහිදී සිදුකරන ලදි.

පඬුවස්නුවර රාජමාළිගා පරිශ්‍රයේ ප්‍රාකාරයෙන් පිටත කැණීම.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඒකාබද්ධ වැඩ සටහනක් වශයෙන් මෙම කැණීම දිය අගල හරහා අගල් කැණීමක් හා ප්‍රවේශ දොරටුව දෙපස කැණීම් පරිශ්‍ර දෙකක් වශයෙන් කරනු ලැබීය. මෙම කැණීමෙන් අනාවරණය කරගත් තොරතුරු අතර ප්‍රවේශ දොරටුවේ ආයත චතුරස්‍රාකාර කොටස මෙන් ම වට ප්‍රාකාරය එකම අවධියක නිර්මාණය කළ ද මෙය සහස්‍රාධික කාලයක් ගරා වැටීමෙන් පසු විසිවන සියවසේ මැද භාගයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සංරක්ෂණය කිරීමේ දී යම් යම් වෙනස්කම්වලට ලක් වී ඇති බව අනාවරණය කරගත හැකි විය.

පුරාවස්තු ලේඛනගත කිරීම හා වර්ගීකරණය

අරමුදලේ පඬුවස්නුවර ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේ සිට මේ දක්වා කරන ලද කැණීම් හා ගවේෂණවලින් හඳුනාගන්නා ලද පුරාවස්තු ලේඛනගත කිරීම සිදු කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1,929,897.15 | 1,870,841.38 | 96.9% | 96.8% |

**සංරක්ෂණ හා නඩත්තු**

දණ්ඩගමුව සුදර්ශනාරාම විහාරස්ථානයේ ධර්මශාලාව ප්‍රතිසංස්කරණය, නාථගනේ ස්ථූපය සංරක්ෂණය, මණ්ඩපොල මහේන්ද්‍රාරාම විහාරස්ථානයේ සීමාගෙය සංරක්ෂණය, බෝපිටිය විහාරස්ථානයේ සංරක්ෂණ කටයුතු යන විද්‍යාත්මක සංරක්ෂණ කටයුතු ද බලදොර විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය, බිංගිරිය කිණිගම සුගතාරාම විහාරස්ථානයේ බිතුසිතුවම් සංරක්ෂණය, පොක්ඛණි විහාරස්ථානයේ බිතුසිතුවම් සංරක්ෂණය, යාකරවත්ත ශෛලගිරි

මුනීන්ද්‍රාරාම විහාරස්ථානයේ බිතුසිතුවම් සංරක්ෂණය යන බිතුසිතුවම් සංරක්ෂණ කටයුතු ද සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 33,802,129.87 | 25,005,313.74 | 74% | 77.5% |

- **කුරුණෑගල ව්‍යාපෘතිය (රිදීගම)**

**කැණීම් හා ගවේෂණ**

ඇම්තොටින් මලය රටට දෙපාවාරුවෙන් ගවේෂණය කිරීම.

ඇම්තොට සිට මලය රට දක්වා වූ පැරණි මාර්ගය අනාවරණය කර ගැනීම උදෙසා ගවේෂණයක් සිදු කළ අතර මේ සඳහා ප්‍රධාන සාධකය බවට පත් කර ගනු ලැබුවේ මාර්ගය දෙපස පිහිටි අම්බලම් ය. ඒ අනුව, අම්බලම් හා ජනප්‍රවාද ගත තොරතුරු මත පදනම්ව රිදීගම සිට කන්ද උඩරට දක්වා යෙදී තිබූ කෙටිම පැරණි මාර්ගය අනාවරණය කර ගැනීමට හැකි විය.

රිදී විහාරය ආශ්‍රිත පැරණි ලෙන් පිළිබඳ ගවේෂණය

මෙම ගවේෂණයේ දී ලෙන් හතලිහක ප්‍රමාණයක් හඳුනාගත හැකි වූ අතර, මේ අතුරින් ලෙන් කිහිපයක ශිලා ලේඛන අක්ෂර යැයි හඳුනාගත හැකි සංකේත සහිත ලෙන් කිහිපයක් සොයා ගන්නා ලදී.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 3,089,805.14 | 956,427.80 | 31% | 39.6% |

**සංරක්ෂණ හා නඩත්තු**

මාස්පොත රජමහා විහාරය බණ මඩුව සංරක්ෂණය, මොරපාය රජමහා විහාරයේ ස්ථූප මළුව සංරක්ෂණය, ඉබ්බාගල රජමහා විහාරයේ විහාරගෙය සංරක්ෂණය, රිදීවිහාර පැරණි ආවාසගෙය සංරක්ෂණය ස්මාරක සංරක්ෂණය යටතේ ද රිදීවිහාර පොත් අලෙවිසැල ඉදි කිරීම නව ඉදි කිරීම් යටතේ ද රිදී විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම බිතුසිතුවම් සංරක්ෂණය යටතේ ද සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 26,721,152.30 | 15,788,417.77 | 59.1% | 58.2% |

මාස්පොත රජමහා විහාරයේ
බණමඩුව සංරක්ෂණයට පෙර

මාස්පොත රජමහා විහාරයේ
බණමඩුව සංරක්ෂණය අතරතුර

- **මොණරාගල ව්‍යාපෘතිය**

2017 වර්ෂයේ දී මොණරාගල ව්‍යාපෘතිය යටතේ මූලිකව ම සිදු වූයේ 2016 වර්ෂයේ දී යෝජනා කරන ලද බුදුරුවගල හා මාලිගාවිල පුරාවිද්‍යා පරිශ්‍ර කේන්ද්‍ර කර ගන්නා වූ යෝජිත ප්‍රවර්ධන කාර්යයන් ක්‍රියාවට නැංවීම යි.

2017 පෙබරවාරි 23 දින බුදුරුවගල ප්‍රවේශපත් ඒකකයක් ස්ථාපිත කිරීම, දෛනික නඩත්තු කටයුතු සිදු කිරීම, බුදුරුවගල වැව කේන්ද්‍ර කරගනිමින් සංචාරක ස්ථානයක් ලෙස සැකසීමට යෝජනා සකස් කිරීම, ඔක්කම්පිටිය නගරය ආශ්‍රිතව පැවති ව්‍යාපෘති කාර්යාලය බුදුරුවගල පරිශ්‍රයට ගෙන ඒම හා ඒ අනුව නව ව්‍යාපෘති කාර්යාලය ඉදි කිරීම, බුදුරුවගල මාර්ග පද්ධතිය සකස් කිරීම, පරිශ්‍රය තුළ නළලිං පිහිටුවීම හා රුක් රෝපණ වැඩසටහන යටතේ කුඹුක්, දිවුල්, දඹ, බෝ, සියඹලා ආදී සිසිල ලැබෙන ශාක පිහිටුවීම

මාලිගාවිල පුරාවිද්‍යා පරිශ්‍රය ආශ්‍රිත ව ප්‍රවර්ධන යෝජනාවලියක් ඉදිරිපත් කරන ලද අතර, දෙස් විදෙස් සංචාරකයින්ට උපරිම පහසුම් සැලසීම මින් අපේක්ෂා කෙරේ. එමෙන් ම පාසල්වල ඉතිහාස විෂයයට අදාළව දේශන පවත්වන ලදි.

**කැණීම් හා ගවේෂණ**

කුරුල්ලන්ගල ගවේෂණ කටයුතු සිදු කිරීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 256,576.00 | 80,160.00 | 31.2% | 39.5% |

**සංරක්ෂණ හා නඩත්තු අංශය**

සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කළ යුතු ස්ථානයන් හඳුනාගැනීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 8,670,531.80 | 5,092,753.30 | 58.7% | 77.5% |

## ➢ රම්බා විහාර ව්‍යාපෘතිය

**කැණීම් හා ගවේෂණ**

අංක 03/11 ගොඩැල්ල ගවේෂණය මගින් එය ගොඩනැගිල්ලක් බවට අනුමාන කර පර්යේෂණ කැණීමෙන් පසු කොටුදැල් කැණීම් ක්‍රමය යටතේ මෙහි කැණීම් සිදුකරන ලදි. එම කැණීමේ දී උතුරු හා දකුණු බැම්වල යැයි උපකල්පනය කළ හැකි ගඩොල් බැම් පාදම දක්වා කැණීම් කර හඳුනා ගැනීම කරන ලදි. ඒ සමග ස්මාරකයට ප්‍රවේශ දොරටුව යැයි උපකල්පනය කළ හැකි පඩිගල් සහිත කොටසක් නැගෙනහිර දිශාවෙන් හඳුනාගන්නා ලදි. එම කැණීම සිදුකිරීමෙන් වළලු කැබැල්ලක්, වළං කැබලි කිහිපයක් හා උළු, ගඩොල් හමු වී ඇත.

දිගින් මීටර් 15 ක් ද පළලින් මීටර් 13 ක් පමණ ප්‍රමාණයක පිහිටා ඇති අංක 03/iii ස්මාරක ගොඩනැගිල්ලේ පර්යේෂණ කැණීමෙන් ස්මාරකයේ බටහිර බැම්මේ ගඩොල් වරි 11 ක සාධක හඳුනාගත් අතර නැගෙනහිර ප්‍රවේශ දොරටුව සමග සඳකඩ පහණක සහ පඩිගල් කිහිපයක සාධක සොයා ගන්නා ලදි. ගොඩනැගිල්ලේ අන්තරාලය සහ ගර්භගෘහය ලෙස කොටස් 02 ක් හඳුනාගත් අතර, බුදුපිළිම කොටස්, යකඩ ඇණ, මැටි පහන්, මැටි කොත් හා මැටි බඳුන් කැබලි යනාදි පුරාවස්තු කිහිපයක් ද හමු වී ඇත. එමෙන්ම ගොඩනැගිල්ලේ මධ්‍ය කොටසේ කැණීම තුළින් ආසනයක් මතුකර ගත් අතර, මෙහි හුණු බදාම අතුරා වර්ණාලේපිත ව පැවති බවට සාධක මතුකර ගෙන ඇත.

අංක 03 සංකීර්ණය විවෘත කැණීම මගින් පෙරළී ගිය ගල් කණු කිහිපයක්, විසිරී ගිය ගඩොල්වල සාධකයන් ද, වළං කැබලි හා අස්ථි කැබලි කිහිපයක් ද සොයාගෙන ඇත.

අංක 03 ප්‍රාකාර බැම්ම පර්යේෂණ කැණීමක් සිදුකර උතුරු හා දකුණු ප්‍රාකාර බැම්වලට අදාළ සාධක කිහිපයක් සොයාගන්නා ලදි. දකුණු දිශානුගත බැම්මේ සාධක අනුව එය පාදම දක්වා මතුකර ගැනීම සිදුකරන ලද අතර, එහිදී කැටයම් රහිත සඳකඩ පහණක් හා පියගැට කිහිපයක් හඳුනාගෙන ගන්නා ලදි. මෙම කැණීම සිදුකිරීමේ දී මැටි බඳුන් කොටස්, යකඩමය පුරාවස්තු කිහිපයක් හමු වී ඇත.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 6,213,292.50 | 3,625,583.12 | 58.4% | 83.5% |

අංක **3/ II** ගොඩැල්ල කැණීමට පෙර

අංක **3/ II** ගොඩැල්ල කැණීමට පසු

අංක 3/ III ගොඩැල්ල කැණීමට පෙර

අංක 3/ III ගොඩැල්ල කැණීමට පසු

අංක 3 විවෘත කැණීමට පෙර

අංක 3 විවෘත කැණීමට පසු

**සංරක්ෂණ හා නඩත්තු**

අංක 03 පිටත ප්‍රාකාර බැම්මේ බටහිර දිශාවේ පිහිටි ගොඩනැගිල්ල විද්‍යාත්මක සංරක්ෂණයක් ලෙස සිදුකරන ලද අතර, සංරක්ෂණය සඳහා පාදා ගැනීමේ දී හමු වූ ළිඳ සහිත කොටස හැරෙන්නට සිව් දිශානුගතව විහිදෙන බැම් 04 මෙන් ම ඇතුළත ඇති ස්මාරක පරිශ්‍රයෙහි ද සංරක්ෂණ කටයුතු සිදු කරන ලදි.

අංක 15 සංකීර්ණයේ බිම් සැකැස්ම සිදුකිරීමේ සංරක්ෂණ කාර්යයන් යටතේ, සංකීර්ණය තුළ නැගෙනහිර සහ උතුරු ප්‍රාකාර බැම්මට ආසන්න භූමියේ ගල්කැබලි හා සුන්බුන් ඉවත් කිරීම, විහාරයේ දාගැබ ආසන්නයේ පැවති ගඩොල් සහිත ගොඩැල්ල ඉවත් කිරීම සහ චෛත්‍යය ආසන්නයේ හමු වූ ගඩොල් පාදම සංරක්ෂණය සඳහා සාමාන්‍ය කැණීම් මඟින් අනාවරණය කර ගැනීම, පිළිමගෙය ඉදිරිපස භූමියේ අවිධිමත් ලෙස ජලය හැසිරෙන ස්ථාන විධිමත් ලෙස සකස් කිරීම, නූතන ස්ථූපයට නැගෙනහිරින් පිහිටි භූමියේ පස්කපා ඉවත්කර භූමිය සකස් කිරීම හා තණ පිඩලි ඇල්ලීම හා ප්‍රාකාර බැම්මේ අභ්‍යන්තර ජලය ස්මාරකවලට හානි නොවන ලෙසින් ගලා යාමට සැලැස්වීම යනාදිය සිදුකර ඇත.

අංක 21 සංකීර්ණයේ i, iv, v යන ස්මාරක නඩත්තු කිරීම, අංක 22 පිළිමගෙය සහ පිටත ප්‍රාකාරය, අංක 17, 10 ස්මාරක හා අංක 15 සංකීර්ණයේ ii, iii, iv, vi, vii, xii ස්මාරක විද්‍යාත්මක නඩත්තු කිරීම් කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 21,873,677.85 | 13,658,150.00 | 62.4% | 77.3% |

අංක 3 පිටත ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පෙර

අංක 3 පිටත ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පසු

- **තිස්සමහාරාම ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

යටාලය ආසනඝරය (දෙවන අදියර) කැණීම සිදුකරන ලද අතර, මෙහිදී ගොඩනැගිල්ලක ගඩොල් බැම් සාධක කිහිපයක් හමු විය. එහිදී මැටි නිර්මාණ, සත්ත්ව අස්ථි සාධක, පාෂාණමය නිර්මාණ, තඹ නිර්මාණ, පබළු, කාසි හා යබොර කොටස් ද පුරාවස්තු ලෙස හමුවිය. සත්ත්ව අස්ථි අතර, ගවයෙකුගේ සම්පූර්ණ අස්ථි පද්ධතියක් ද හමු වී ඇත.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 7,577,255.25 | 5,770,485.01 | 76.2% | 79.6% |

යටාලය ආසනඝරය සහිත ගොඩනැගිල්ල කැණීමට පෙර



යටාලය ආසනඝරය සහිත ගොඩනැගිල්ල කැණීම අතරතුර

යටාලය ආසනඝරය සහිත ගොඩනැගිල්ල කැණීමෙන් හමු වූ පුරාවස්තු කිහිපයක්

**සංරක්ෂණ හා නඩත්තු**

පොහොයගෙය, යටාලය ආසනඝරය සංරක්ෂණය කරන ලදි. ඊට අමතරව ජන්තාඝරයට ප්‍රවේශවන මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම, තිස්ස විහාරයේ අවාසගෙය වහළ ප්‍රතිසංස්කරණය කිරීම, තිස්ස රජමහා විහාරයේ වාහල්කඩෙහි වහළ නැවත ඉදිකිරීම, කම්මල ඉදිකිරීම, රාමක්‍රිෂ්ණ මඩම ප්‍රතිසංස්කරණය කිරීම, සඳගිරිය තොරතුරු මධ්‍යස්ථානය හා සනීපාරක්ෂක කුටි ස්ථාපිත කිරීම හා රසායනාගාර සංරක්ෂණ කටයුතු සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 42,012,952.92 | 27,141,377.43 | 64.6% | 105% |

බටහිර ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පෙර

බටහිර ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පසු

පොහොයගෙය සංරක්ෂණයට පසු

තිස්ස විහාරයේ ආවාසගෙයි වහලය සංරක්ෂණයට පසු

- **ගාල්ල ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

බස්නාහිර මුහුදු පුරාවිද්‍යා ගවේෂණය

පානදුර සිට කොළඹ දක්වා වූ කලාපය කෙරෙහි මෙහි දී මූලික අවධානය යොමුකරන ලද අතර, 2014 වර්ෂයේ දී සිදුකළ ගවේෂණයෙන් හඳුනාගත් ස්ථාන වාර්තාගත කිරීම හා නව තොරතුරු පරීක්ෂා කිරීම මෙහිදී සිදුකරන ලද අතර, එහි දී මින්පෙර වාර්තා කර නොතිබූ යාත්‍රා කිහිපයක් වාර්තා ගත කරන ලදි.

Four Barges Site

මීටර් 20 කට වඩා දිගින් වැඩි නොවූ හඳුනාගැනුණු ත්‍රිත්වයෙන් එක් යාත්‍රාවක බොයිලේරුවක් දැකගත හැකි වුණු අතර, එක් යාත්‍රාවක් විනාශයට ලක්වී ඇති බව හඳුනාගත හැකි විය.

Lotus Barge යාත්‍රාව

මීටර් 21.65 ක් දිගින් හා මීටර් 06 ක් පළලින් යුත් වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක වන කුඩා ප්‍රමාණයේ යාත්‍රාවකි. මෙහි බොයිලේරුවක් වූ අතර, ඉදිරිපස කොටස කැඩී බිඳී ගොස් තිබුණ ද අවර කොටස අවම වශයෙන් විනාශ වී තිබුණි. බොයිලේරුව හා යාත්‍රාවේ එන්ජිමේ කොටසක් පැහැදිළිව හඳුනාගත හැකි වූ අතර, මෙය බත්තල් ලෙස හඳුන්වන යාත්‍රා වර්ගයට අයත් වේ.

Battery Barge යාත්‍රාව

දිගින් මීටර් 19.36 ක් හා පළලින් මීටර් 3.5 ක් වන වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක වන 19 වන සියවසේ දී පමණ ගිලී යන්නට ඇතැයි සිතිය හැකි නෞකාවකි. මෙහි එක් බොයිලේරුවක් පමණක් දැකගත හැකි විය.

වයඹ මුහුදු පුරාවිද්‍යා ගවේෂණය

කුඩාව යාත්‍රාව

මෙම යාත්‍රාව කුඩාව වෙරළේ සිට මීටර් 400 ක් පමණ දුරින් පිහිටා ඇත. මෙහි අවශේෂ හෝ නැව තිබූ ස්ථානය සොයා ගැනීමට නොහැකි විය. දින කීපයක් මිනුම් කටයුතු සිදුකළත් ජලයේ දෘශ්‍යතාවය හේතුවෙන් එය සොයා ගැනීමට නොහැකි විය.

Broben Anchor Site

කුඩාව දකුණු මුහුදු තීරයට වන්නට මීටර් 12 ක් පමණ ගැඹුරෙහි වූ ගල් පරයක තැන්පත් වී තිබූ තරමක කුඩා ප්‍රමාණයේ නැංගුරමක් වන අතර, එය දෙකට වෙන් වී තිබුණි.

Reef Anchor යාත්‍රාව

මීටර් 12 ක් පමණ ගැඹුරු මුහුදේ තැන්පත් වී ඇති තරමක් කුඩා ප්‍රමාණයේ නැංගුරමකි. සැලසුම් සඳහා මිනුම් ලබා ගැනීම සිදු කරන ලදි.

Anchor Point Roof

කුඩාව මුහුදු තීරයට උතුරට වන්නට මසුන් බහුල ගල් පරයේ මධ්‍යයෙහි වැල්ලෙහි ස්ථානගතව ඇති මෙම නැංතුරම තරමක් විශාල ප්‍රමාණයේ එකක් වන අතර, මෙම නැංගුරම ලංකාවේ හමු වූ අනෙකුත් නැංගුරම් හා සැසඳීමේ දී පැරණි ස්වරූපක් දිස් වේ.

කුඩාව Large Anchor

කුඩාව මුහුදු වෙරළේ සිට කිලෝමීටර 1-2 පමණ දුර ප්‍රමාණයකින් මෙම නැංගුරම ස්ථානගත වී තිබූ අතර, එහි විශාලත්වය අනුව විශාල යාත්‍රාවක් සඳහා මෙම නැංගුරම භාවිතා කර ඇති බවට නිගමනය වී ඇත.

උච්චමුණේ Anchor

කුඩාව වෙරළ තීරයේ සිට උච්චමුණේ ප්‍රදේශයට වන්නට ස්ථානගත වී ඇති මෙම නැංගුරමේ කොටසක් මුහුදු පතුලේ වැල්ලට යට වී පවතින අතර, ඉතිරි කොටස ඉහළට එස වී පැවතිණි. ඉහළට එස වී තිබූ කොටසේ සැළසුම් ඇඳීම සඳහා මිනුම් ලබා ගැනීම, ඡායාරූප හා වීඩියෝ ලබා ගැනීම සිදු කරන ලදි.

සින්නපාඩු ප්‍රදේශයේ ගවේෂණ

Cannon Site

මෙම ප්‍රදේශයේ GPS දත්ත අනුව පරීක්ෂා කිරීමේ දී වැල්ලෙන් මඳක් යට වූ මීටර් 1.92 ක් පමණ දිගින් යුත් යකඩ බට 05 ක් පමණ තැනින් තැන සොයා ගන්නා ලද අතර, පර්යේෂණ සඳහා රසායනාගාරය වෙත ඉදිරිපත් කරන ලදි.

නොරොච්චෝලේ Large Anchor

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ඉදිරියෙන් පිහිටා ඇති මෙම ස්ථානයන් මෙම විශාල ප්‍රමාණයේ නැංගුරම සොයා ගන්නා ලදි.

Stone Anchor

සෘජුකෝණාස්‍ර හැඩයක් ගත් ක්‍රමයෙන් සිහින් හැඩයකින් යුක්ත පාෂාණයෙන් නිමවන ලද නැංගුරමකි. එහි හතරැස් පැත්තෙහි ප්‍රතිවිරුද්ධ නොවන දිශාවන්ට වන්නට චතුරස්‍රාකාර සිදුරු දෙකක් වන අතර, එය නැංගුරමට ලී සවි කිරීම සඳහා භාවිතා කරන ලද ඒවා වේ.

මුලතිව් නෞකාව කැණීම හා උතුරු මුහුදු තීරය ගවේෂණය

මෙම නෞකාව ගවේෂණ කටයුතු 2013 වර්ෂයේ සිට ආරම්භ කරන ලද අතර, 2017 වර්ෂයේ දී වැඩි දුරටත් සිදුකරන ලදි. මෙම නෞකාවේ තේ කොළ රැගෙන ගිය බව වාර්තාවල සඳහන් වුව ද ඒ පිළිබඳ වැඩිදුර පරීක්ෂා කිරිම සඳහා නියැදි ලබා ගන්නා ලදි. ඉදිරි පර්යේෂණ සඳහා නෞකාවේ ගැඹුර මීටර් 2.2 ක ප්‍රමාණයක් කැණීම් කරන ලද අතර, ඒ තුළින් සුදු පැහැ පෝසිලේන් කොටස්, නෞකාවේ ජනෙල් සඳහා භාවිත වීදුරු කොටස්, වීදුරු බෝතල් කොටස්, ටයිල් කැට කිහිපයක් වශයෙන් හමු විය.

මුලතිව් සහල් නෞකාව

මුලතිව් නගරයට කිලෝමීටර් 03 ක් උතුරින් හා fara 03 නෞකාවට ගිණිකොණ දිගින් නෞකාවක සොයා ගැණුනු මීටර් 100 ක් පමණ දිග මෙම නෞකාව යුධ සමයේ දී කොළඹ හා යාපනය අතර භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගෙන ඇත.

මුලතිව් බයිසිකල් නැව

යුධ සමයේ දී සිවිල් ජනතාවට අවශ්‍ය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යය ප්‍රවාහනය කරමින් තිබිය දී ත්‍රස්තවාදීන් විසින් ගිල්වා ඇති මෙම නෞකාව මීටර් 100 ක් පමණ දිගින් යුතු නෞකාවකි. මෙහි යතුරු පැදි අමතර කොටස් විශාල ප්‍රමාණයක් විවිධ ද්‍රව්‍ය පිරවූ බෑග්, විවිධ වර්ගයේ ටයර් හඳුනාගත හැකි විය.

දකුණු මුහුදු තීර ගවේෂණය

මලබාර් නෞකාව (පොල්කොටේ)

දිගින් මීටර් 59.90 ක් වන මෙම නෞකාවේ ඉදිරිපස කොටස බිඳී ගොස් තිබූ අතර, පසුව සිදුකරන ලද පරීක්ෂා කිරීමේ දී මීටර් 08 ක ප්‍රමාණයක් සොයා ගත හැකි විය. ඒ අනුව නෞකාවේ මුළු දිග මීටර් 68.49 ක් පමණ වේ. මෙම නෞකාව සම්බන්ධ මතුපිට ගවේෂණයේ දී අක්ෂර සහිත ගඩොලක්, පෝසිලේන් බඳුනක කොටසක්, වීදුරු කැබලි ද්විත්වයක් හමු විය.

Site 25

දිගින් මීටර් 98 ක් පමණ වන වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක මෙම නෞකාව කොටස් වශයෙන් වෙන්කර මිනුම් ගත කරන ලදි. නැවට ආසන්නව බඳ කොටස පිහිටා තිබූ අතර, ජනෙල් කවුළු වැනි කොටස් හඳුනාගැනීමට හැකි විය.

Iron wreck no 01 වැඩබිම

දිගින් මීටර් 12 ක් පමණ වන මෙම නෞකාව බොහෝ කොටස්වලට කැඩී ඇත. නෞකාවේ යකඩ කැබලි තැන්තැන්වල විසිරී පවතින අතර, අක්ෂර සහිත බෝතලයක්, තඹ තහඩු වැනි පුරාවස්තු හා බොයිලේරු හමු වී ඇත.

නැගෙනහිර මුහුදු තීර ගවේෂණය

කායන්කේනි ආශ්‍රිත මුහුදු ගවේෂණය

2016 වසරේ දී වැඩ ආරම්භ කරන ලද පාසිකුඩා අංක 04 නෞකාවේ සහ මඩකලපුව අංක 02 නෞකාවේ මිනුම් කටයුතු අවසන් කිරීම, පාසිකුඩා වෙරළ තීරයට කි.මී. 07 ක් දුරින් ඇති බවට තොරතුරු ඇති දෙවන ලෝක යුධ සමයට අයත් ගුවන් යානයක් පරීක්ෂා කිරීම, කායන්කේනි කලපුවේ ඇති ගල් පාලම හා අවට පුරාවිද්‍යා අවශේෂයන් පිළිබඳව විධිමත් පර්යේෂණ දියත් කිරීම හා වාර්තා කිරීම, කදිරවෙලි හා මඩකලපුව මුහුදු තීරයේ ඇති බවට තොරතුරු ලැබී ඇති ගිළුණු නෞකා හෝ අවශේෂ පිළිබඳව පරීක්ෂා කිරීම, කායන්කේනි හා කොටිවිගල අතර ප්‍රදේශයෙහි ඇති අප්‍රකාශිත නටබුන් හා පුරාවිද්‍යා අවශේෂ පිළිබඳ සොයා බැලීම කරන ලදි.

ත්‍රිකුණාමලය ආශ්‍රිත මුහුදු ගවේෂණ

කෝණේෂ්වරම් තුඩුව පාමුල ඇති මුහුදු පත්ලේ පුරාවිද්‍යා අවශේෂ සොයා කිමිදුම් කටයුතු කිරීම, දෙවන ලෝක යුධ සමයේ ගිලී ඇති ගුවන් යානය නෞකා සහ පාවෙන ජැටිය (Floating Doc) ආශ්‍රිතව කිමිදුම් කටයුතු සිදු කිරිම හා වාර්තා කිරිම, උප්පුවෙලි හා ඉරක්කණ්ඩි ප්‍රදේශයේ ඇති ගිලී ගිය නෞකා පරීක්ෂා කිරීම හා වාර්තා කිරිම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 14,812,679.15 | 8,504,550.43 | 57.4% | 74.9% |

Four Barges නෞකාව

Lotus Brrge නෞකාව ගවේෂණය

Iron wreck No 01 වැඩබිම
ගවේෂණ කටයුතු

මුලතිව් බයිසිකල් නෞකාව

**සංරක්ෂණ හා නඩත්තු**

සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර ගොඩනැගිල්ල, කතළුව පූර්වාරාම විහාරයේ විහාරගෙයි පොළොව, දොඩන්දූව ශ්‍රී ශෛලබිම්බාරාම මහා විහාරයේ සංඝාවාස ගොඩනැගිල්ල, රත්ගම සනානන්දාරාමය විහාරගෙය, කලුවැල්ල වර්ධනාරාම විහාරයේ පැතිබැම්ම හා බලපිටිය සුභද්‍රාරාම විහාරයේ ධර්මශාලාව සංරක්ෂණය කිරීමේ කටයුතු කරන ලදි. ඊට අමතරව කතළුව පූර්වාරාම විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරිම කරන ලදි.

කැණීම් වලින් හමු වූ යකඩ ලෝහමය පුරාවස්තු, දැවමය පුරාවස්තු, ගඩොල් හා වීදුරු පුරාවස්තු, රිදී කාසි හා අනෙකුත් පුරාවස්තු සංරක්ෂණය කිරීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 24,251,952.00 | 12,304,241.16 | 50.7% | 76.6% |

කතළුව පූර්වාරාම විහාරගෙයි පොළොව සංරක්ෂණය අතරතුර

දොඩන්දූව ශෛලබිම්බාරාම මහා විහාරයේ සංඝාවාස ගොඩනැගිල්ල
සංරක්ෂණය අතරතුර

- **මාතර ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

මාතර දිස්ත්‍රික්කය තුළ පවතින ඓතිහාසික, පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ ගවේෂණයක් සිදුකරන ලද අතර, ඒ අනු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 ක් ගවේෂණය කරන ලදි. ඒ අනුව ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශයට යමින් පවතින ස්මාරක හඳුනාගෙන ඉදිරි සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 3,332,987.55 | 1,452,425.90 | 43.6% | 42.4% |

**සංරක්ෂණ හා නඩත්තු**

වැලිගම අග්‍රබෝධි විහාරයේ පිළිමගෙය, අහංගම ගොවියාපාන ජයසුමනාරාම විහාර ධර්මශාලාව, මහාමන්තින්ද පිරිවෙණ පොත්ගුල, මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ ආවාසගෙය, කෝට්ටගොඩ සුදර්ශනබිම්බ පුරාණ විහාරයේ පිළිමගෙයි පොළොව හා හිත්තැටිය රජමහා විහාරයේ පහන් බැම්ම සංරක්ෂණය කරන ලදි.
මිරිස්ස සමුද්‍රගිරි විහාරයේ බිතුසිතුවම්, වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ බිතුසිතුවම්, ගන්දර පුරාණ විහාරයේ බිතුසිතුවම් හා කනංකේ රජමහා විහාරයේ බිතුසිතුමව් සංරක්ෂණය කිරීම ද කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 49,115,604.50 | 20,861,380.32 | 42.4% | 71.1% |

වැලිගම අග්‍රබෝධි විහාරයේ පිළිමගෙය සංරක්ෂණයෙන් පසු

මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ ආවාසගෙය සංරක්ෂණයෙන් පසු

මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ සිතුවම් සංරක්ෂණයට පෙර

මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ සිතුවම් සංරක්ෂණයට පසු

- **ගම්පහ ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

දනවිකන්ද හා ඒ ආශ්‍රිත අක්කර 900 කින් යුත් ප්‍රදේශය ආශ්‍රිතව සිදුකරන ලද ගවේෂණ මගින් පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක 21 හඳුනාගන්නා ලදි.

හැමිල්ටන් ඇළ දෙපස කිලෝමීටර් 1 ½ ක පමණ වපසරියක සිදුකරන ලද ගවේෂණය මගින් ස්මාරක කිහිපයක් හඳුනාගන්නා ලද අතර, ඒවා දේවස්ථාන, විහාරස්ථාන හා වෙනත් ස්මාරක ලෙස වෙන්කර හඳුනා ගන්නා ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 2,772,435.00 | 771,450.34 | 27.8% | 37.7% |

**සංරක්ෂණ හා නඩත්තු**

හෙයියන්තුඩුව රජමහා විහාරයේ බිතුසිතුවම්, ප්‍රතිමා කඩතොළු වීම හා හායනයට ලක්වීම බදාමයේ පිපිරුම් ප්‍රතිකර්ම යෙදීම, වර්ණ ස්ථරයේ පළුදු ප්‍රතිකර්ම යෙදීම, වර්ණ ස්ථරයේ පෙති ගැලවීම, වර්ණ ස්ථරය දුර්වර්ණ වීමට ප්‍රතිකර්ම යෙදීම, පිළිමයේ කැඩී ගිය කොටස් නැවත සැකසීම, කෙස් කැරලි ප්‍රතිනිර්මාණය හා සිවුරේ රැළි හා පළුදු පිරවීම සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 2,418,660.00 | 971,955.00 | 40.2% | 50.7% |

හෙයියන්තුඩුව රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණයට පෙර



හෙයියන්තුඩුව රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණයට පසු

- **කෑගල්ල ව්‍යාපෘතිය**

සංරක්ෂණ හා නඩත්තු

ඉතා දැඩි ලෙස හායනයට පත් වී ඇති එරමිණිගම්මන ටැම්පිට විහාරය සහ පාදම ශක්තිමත් කිරීම, බිත්තිවල බදාම පිපිරීම් හා හායනයට ලක්වීම, වහලයේ උළු දිරාපත් වී තිබීම, ගොඩනැගිල්ලේ ගෙබිම ජරාජීර්ණ වීම ආදී ලක්ෂණයන්ගෙන් යුතු වූ ශ්‍රී ශෛලතලාරාමයේ පැරණි ධර්ම ශාලාව සංරක්ෂණය කළ යුතු බවට හඳුනා ගැනීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1,692,168.80 | 1,097,998.86 | 64.9% | 64.9% |

## ➢ කොළඹ ව්‍යාපෘතිය

**සංරක්ෂණ හා නඩත්තු**

බේරුවල සපුගොඩ ශ්‍රී මහා විහාරයේ පොහොය සීමාගෘහය හා විහාර මන්දිරය අසල රැඳවුම් බැම්මක් ඉදිකිරීම, පයාගල සමනක්කන්ද පුරාණ විහාර මන්දිරය හා පොකුණුවිට කිත්සිරි මෙවන් රජමහා විහාරයේ ආවාස ගෘහය සංරක්ෂණය සඳහා තත්ත්ව වාර්තා සහ ඇස්තමේන්තු සකස් කිරීම හා කොළොන්නාව රජමහා විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 3,030,547.50 | 1,587,041.55 | 52.4% | 94.3% |

විශේෂ ව්‍යාපෘති

සේදවත්ත වෙහෙරගොඩ පුරාණ රජමහා විහාරයේ ආවාසගෘහය හා දානශාලාව සහ කොල්ලුපිටිය වාළුකාරාම මහා විහාරයේ විහාර මන්දිරය ප්‍රතිසංස්කරණය සඳහා වාර්තා සකස් කිරීම, වාද්දුව ශ්‍රී සමුද්‍රාරාම විහාරයේ නව සංඝාවාස ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කලුතර සිරිකුරුස දේවාස්ථානය හා රාජගිරිය සිරිඅමර විහාරය ප්‍රතිසංස්කරණය කිරීම, ආගමික සිද්ධස්ථාන 150 සංවර්ධනය කිරීමේ පළමු අදියර යටතේ කොළඹ හා කලුතර දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 14 ක් නිරීක්ෂණය කර පුරාවිද්‍යාත්මක වාර්තා සකස් කිරීම, ආගමික සිද්ධස්ථාන 1000 සංවර්ධනය කිරීමේ පළමු අදියර යටතේ කොළඹ හා කලුතර දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 131 ක් නිරීක්ෂණය කර පුරාවිද්‍යාත්මක වාර්තා සකස් කිරීම කරන ලදි.

## ➢ ඉබ්බන්කටුව ව්‍යාපෘතිය

දඹුල්ල ව්‍යාපෘතිය යටතේ කැණීම් කරන ලද 2015 ඉබ්බන්කටුව මෙගලිතික සුසානයේ ක්ෂේත්‍රයෙන් හමු වූ පුරවස්තු සංරක්ෂණය කිරීම කරන ලද අතර, පුරාවස්තු 55 ක සංරක්ෂණ කාර්යයන් අවසන් කරන ලදි.

## ➢ බදුල්ල ව්‍යාපෘතිය

**සංරක්ෂණ හා නඩත්තු**

ආදිවාසි ගම්මානයට අයත් පාරම්පරික වෙදහල හා බෙහෙත් ගබඩාව සංරක්ෂණය කර පාරම්පරික වෙදකම් පවත්වාගෙන යාම උදෙසා ගොඩනැගිලි ද්විත්වයක් ඉදිකිරීම, වලපනේ නිල්දණ්ඩාහින්න තිබ්බටුගොඩ ශ්‍රී සුදර්ශනාරාමයේ ආරක්ෂිත බැම්ම ඉදිකිරීම, විල්වල රජමහා විහාරයේ පැරණි පියගැටපෙළ හා අත්වාරු බැමි සංරක්ෂණය හා දඹාන ජල ව්‍යාපෘති වැඩබිම ආරම්භ කිරීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 8,870,550.00 | 5,151,007.30 | 58.1% | 69.1% |

ආදිවාසි ගම්මානයට අයත් වෙදහල සංරක්ෂණයට පෙර

ආදිවාසි ගම්මානයට අයත් වෙදහල සංරක්ෂණයට පසු

විල්වල රජමහා විහාරයේ පැරණි පියගැටපෙළ හා අත්වාරු බැමි සංරක්ෂණය අතරතුර

විල්වල රජමහා විහාරයේ පැරණි පියගැටපෙළ හා අත්වාරු බැමි සංරක්ෂණයට පසු

- **යාපනය ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

කට්ටුක්කරෙයිකුලම්, වරමාරච්චි හා සංගියම් උද්‍යානය ගවේෂණය කිරීම, කන්තරෝඩෙයි හා යාපනය කොටුව ලන්දේසි දේවාලය කැණීම කරන ලදි. මෙම දේවාලය යුධ සමයේ දී දැඩි ලෙස හානියට පත් ව ඇති අතර, භූමියේ ක්‍රියාකාරකම්, පාංශු ස්ථර හඳුනාගැනීම සඳහා මෙහි පර්යේෂණ කැණීමෙන් බලාපොරොත්තු විය. මෙම කැණීමෙන් පාෂාණ වර්ග, කොරල්, ගඩොල්, උළු, පෝසිලේන්, ලෝකඩ, ඇඳුම් කොටස් හා වෙඩි බෙහෙත් ආදී පුරාවස්තු කොටස් හමු විය.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 14,471,320.91 | 2,813,348.50 | 19.4% | 80.5% |

**සංරක්ෂණ හා නඩත්තු**

යාපනය කොටුව සංරක්ෂණය කිරීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලදි. ඊට අමතරව යාපනය නගුලේෂවරම් මඩම, පූනහරි හින්දු කෝවිල, යාපනයේ රජිනගේ මාළිගය හා යාපනය කොටුවේ ලන්දේසි පල්ලිය ප්‍රතිසංස්කරණය කරන ලදි. ඩෙල්ෆ් දූපතේ ලන්දේසි රෝහල අළුත්වැඩියා කිරීම කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 23,689,034.75 | 7,996,877.00 | 33.8% | 31.4% |

- **අපේ ගම විශේෂ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13 හා 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලද අපේගම විශේෂ ව්‍යාපෘතිය 2016.06.16 දිනැති ව මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරන ලදි. එතැන් සිට අපේ ගම මධ්‍යම සංස්කෘතික අරමුදලේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස පරිපාලන කටයුතු සිදුකරමින් පවත්වාගෙන යනු ලැබේ.මෙහි සාම්ප්‍රදායික ගම්මානය, විවිධ ශිල්ප කුටි හා විවිධ උත්සව සඳහා මුදල් ගෙවා වෙන් කරවා ගත හැකි ශාලා පහසුකම් ද වේ.

2017 වර්ෂය තුළ දී අපේ ගම ව්‍යාපෘතිය සංවර්ධන කටයුතු සඳහා රු. 23,395,870.31 ක මුදලක් වැය කර ඇති අතර, රු. 3,899,000.00 ක මුදලක් උපයාගෙන ඇත.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 18,092,361.65 | 8,057,013.52 | 44.5% | 53.5% |

- **රත්නපුර ව්‍යාපෘතිය**

**කැණීම් හා ගවේෂණ**

ඇහැලියගොඩ, කුරුවිට, රත්නපුර, ඇලපාත හා නිවිතිගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිළිබඳ පළමු අදියර යටතේ ගවේෂණ කටයුතු සිදුකරන ලද අතර, එහිදී රජමහා විහාර, පුරාණ විහාර, ගල්ලෙන්, ඓතිහාසික ක්ෂේත්‍ර (නටබුන් ස්ථාන), දේවාල, ලෙන් විහාර, වලව්, ඓතිහාසික පාරිසරික ක්ෂේත්‍ර, යටත් විජිත යුගයේ නිර්මාණ, පිරිවෙන් විහාර ආදී වශයෙන් වර්ග කීපයක් යටතේ වාර්තා කරන ලදි.

පාසල් ශිෂ්‍යයින්, රාජ්‍ය ආයතනවල නිලධාරීන් ආදී විවිධ අංශයන් ආවරණය වන පරිදි වැඩමුළු, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ පැවැත්වීම ද බලංගොඩ ප්‍රදේශය තුළ පවතින අලුත්නුවර හා කුඹල්ගම යන ග්‍රාමයන් තෝරා ගනිමින් මානව වංශ අධ්‍යයනය කිරීම සිදුකරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 3,732,770.00 | 2,613,703.00 | 70% | 76.9% |



**රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තා කරන ලද ස්මාරක කිහිපයක්**



**ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තා කරන ලද ස්මාරක කිහිපයක්**

**සංරක්ෂණ හා නඩත්තු**

රත්නපුර මහ සමන් දේවාලයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම හා වෙහෙර විහාර සංරක්ෂණය කිරීම අදියර 1 ට හා අදියර 2 ට අදාළව පුරාවිද්‍යා වාර්තා සකස් කරන ලදි.

| ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම) | වැය වූ වියදම (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 4,637,691.50 | 609,091.00 | 13.1% | 21% |

## ➢ බටලීය ජාතික අනුරූ පාසල

**අධ්‍යයන අංශය**

වසර දෙකක අධ්‍යයන කාලයකට යටත්ව බඳවා ගනු ලබන සිසුන් න්‍යායාත්මක හා ප්‍රායෝගික යන අංශ ද්විත්වයෙන් ම අධ්‍යයන කටයුතු සිදුකරන ලදි. එම වසර දෙකක කාලය තුළ දී නිර්මාණය කරනු ලබන අනුරූ ආයතනය සතුකර ගනු ලැබේ.

ප්‍රායෝගික පුහුණු අධ්‍යයනය සඳහා සිසුන් ඒ ඒ නිර්මාණ සිදුකරනු ලබන ආයතන වෙත යාම සිදුවිය. ඒ අනුව සෙරමික් නිර්මාණ - වරාගොඩ, ලී කැටයම් - යටියන්තොට, පිත්තල නිර්මාණ - නත්තරම්පොත හා ලාක්ෂා නිර්මාණ - මාතලේ යන ස්ථාන වෙත සිසුන් රැගෙන ගොස් ප්‍රායෝගික අධ්‍යයනය ලබාදෙන ලදි. ඊට අමතරව දේශණ හා වැඩමුළු පවත්වන ලදි.

**නිෂ්පාදන අංශය**

සිමෙන්ති, ෆයිබර්, දැව, පාෂාණ හා පිත්තල යන ද්‍රව්‍යයන් යොදා ගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදල සතු ප්‍රකාශන හා අනුරූ අලෙවිසැල්වල අලෙවි කිරීම සඳහා අනුරූ නිෂ්පාදනය කරනු ලබයි.

**අලෙවි අංශය**

මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදල හා බාහිර ආයතන මඟින් ලැබෙන ඉල්ලීම් අනුව විවිධ තොරණ්, සැරසිලි, සමරු තිළිණ, වේදිකා සැරසිලි සකස් කරනු ලබන අතර අනුරූ සහිත ප්‍රදර්ශන කුටි පවත්වනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ සමස්ථ අලෙවි ආදායම රු. 4,280,242.30 ක් වේ.

**අධ්‍යයන කටයුතුවල නිරත වන සිසුන්**

**අනුරූ නිෂ්පාදනය අතරතුර**

- **ප්‍රකාශන අංශය**

මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන සියළුම කැණීම් හා සංරක්ෂණ වාර්තා, අත්පත්‍රිකා, මාර්ගෝපදේශ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ග්‍රන්ථ, පෝස්ටර්, පින්තූර තැපැල්පත්, මූර්ති ග්‍රන්ථ යනාදි ප්‍රකාශනයන්, දේශීය සහ විදේශීය ප්‍රවේශපත්‍ර හා බාහිර ආයතනවල ප්‍රකාශන ද මුද්‍රණය කරනු ලබන්නේ ප්‍රකාශන අංශය මඟිනි.

ඡායාරූප හා ප්‍රලේඛන අංශයක් ද පවතින මෙහි මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදුකරනු ලබන විවිධ කාර්යයන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝගත කිරීම කරනු ලබයි.

රසායන විද්‍යා, භූ විද්‍යා හා ක්ෂුද්‍ර ජීව පර්යේෂණ යන අංශවලින් ද සමන්විත වන අතර, මෙම අංශ මඟින් විවිධ පර්යේෂණ හා ගවේෂණ කටයුතු කරමින් කැණීම් හා සංරක්ෂණ කටයුතු වලට අදාළ සහාය ලබාදෙනු ලබයි. අනුරාධපුර අශෝකාරාම සමාධි බුද්ධ ප්‍රතිමාව, පොළොන්නරුව ගල් විහාරය, කුරුණෑගල වරකා වැළඳු විහාරය හා සීගිරිය (සීගිරිය කැටපත් පවුර හා සීගිරි සිතුවම්) යන ස්ථානවල පර්යේෂණ සිදුකරන ලදි.

පුස්කොල පොත් සංරක්ෂණය හා සුවිගත කිරීමේ ඒකකය මඟින් ලංකාව පුරා ව්‍යාප්තව ඇති විහාරස්ථානවල ඇති පුස්කොල පොත් සංරක්ෂණය කිරීමේ කටයුතු කරනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ දී කැලණිය විද්‍යාලංකාර පිරිවෙන, යටගම නාලවනාරාම පුරාණ විහාරය, පල්ලේවෙල ආලෝකාරාමය යන විහාරස්ථානවල පුස්කොළපොත් සංරක්ෂණය කිරීමේ කටයුතු සිදුකරන ලදි.



**මුද්‍රණය කරන ලද ග්‍රන්ථ කිහිපයක්**

- **ආගමික හා කලා කටයුතු අංශය - ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින 13000 කට අධික ආගමික ස්ථානයන් සංවර්ධනය හා සංරක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංකල්පයකට අනුව 2017 වර්ෂයේ ජුලි මාසයේ දී මධ්‍යම සංස්කෘතික අරමුදලේ නව අංශයක් ලෙස ආගමික හා කලා කටයුතු අංශය ආරම්භ කරන ලදි.

ඒ අනුව පහත සඳහන් ව්‍යාපෘතීන් සඳහා අරමුදල් ලබාදෙන ලදි.

- ආගමික ස්ථාන 150 ක් සංවර්ධනය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
- ආගමික ස්ථාන 815 ක් සංවර්ධනය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
- ශ්‍රී ලංකාව ඇතුළත හා විදේශයන්හි ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ හුවමාරු වැඩසටහන - අදියර 01
- කඨින පිංකම්, පෙරහැර, කුලදරුවන් පැවිදි කිරීම, ආදාහන, බෞද්ධ ස්ථාන විවෘත කිරීම් ආදිය සඳහා ප්‍රතිපාදන ලබා දීම
  මේ යටතේ රිදී විහාරයේ පෙරහැර සඳහා ආධාර ලබාදීම, පානදුර දිබ්බැද්දර නාරම්පිටිය ශ්‍රී අමරාමුණා විහාරයේ මිහිඳු පෙරහැර සඳහා ආධාර ලබාදීම, වැල්ලම්පිටිය සේදවත්ත වැල්ලම්පිටිය වෙහෙරගොඩ පුරාණ විහාරයේ කඨින පිංකම සඳහා ආධාර මුදල් ලබාදීම, අතිපූජ්‍ය හබරකඩ ඉන්දරතන නාහිමිපාණන්ගේ ආදාහන පූජෝත්සවය සඳහා ආධාර ලබා

දීම හා කතරගම උපාලි ධර්මාශ්‍රම විහාරයෙහි දානමය පිංකම සඳහා ආධාර මුදල් ලබා දීම යනාදිය සිදුකරන ලදි.

- ගුණාත්මක කලා නිර්මාණ දායක කළ කලාකරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් කලා නිර්මාණ එළි දැක්වීම හා ඇගයීම, විවිධ කලා උත්සව සිදුකිරීම හා විශේෂ ව්‍යාපෘති සිදුකිරීම

**ශ්‍රී ලංකාව ඇතුළත හා විදේශයන්හි ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ හුවමාරු වැඩසටහනේ දී ලබාගත් ඡායාරූපයක්**

~~සසුනෝදය ජාතික වැඩසටහනේ උත්සව අවස්ථාවේ ඡායාරූප කිහිපයක්~~

**සසුනෝදය ජාතික වැඩසටහනේ උත්සව අවස්ථාවේ ඡායාරූප කිහිපයක්**

## ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

### භෞතික ප්‍රගතිය

**කැණීම් හා ගවේෂණ**




**සංරක්ෂණ හා නඩත්තු**



## 2.3 අභියෝග හා ඉදිරි දැක්ම

**අභියෝග**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක ප්‍රවර්ධනය, ප්‍රතිසංස්කරණය කිරීම හා ආරක්ෂා කිරීම මඟින් අනාගත පරපුරට දායාද කරදීමයි. ලංකාව පුරා පිහිටුවා ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති මඟින් ඒ ඒ ප්‍රදේශයන් පුරා ව්‍යාප්තව ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීමට අදාළ කාර්යය කිරීමේ දී බොහෝ අභියෝග හා ගැටළු රාශියකට ලක්වීමට සිදු වී ඇත. එම අභියෝග හා ගැටළු පහත පරිදි වේ.

- පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආශ්‍රිතව වර්තමානය වන විට ජනාවාස ඇතිවීම වර්ධනය වීමත් සමඟ බොහෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශයට හා හායනයට ලක්වීමේ ප්‍රවණතාව වර්ධනය වීම
- ආරක්ෂණ ක්‍රමවේදයන්වල පවතින දුර්වලතා
- ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාව විසින් අදහනු ලබන විවිධ ආගමික ක්‍රමවේදයන් හා සංස්කෘතික ගැටළු
- ජනතාවගේ මිත්‍යාමත හා නොදැනුවත් බව
- විශේෂඥ දැනුමේ සාපේක්ෂ හිඟය
- අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම
- ඉතා කඩිනමින් කළ යුතු සංවර්ධන තත්වයන් සඳහා නිර්දේශ ලබා ගැනීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටළු
- ස්වභාවික ආපදා හා විවිධ සත්ත්ව කාණ්ඩයන් විසින් කරනු ලබන ක්‍රියාකාරකම්

**ඉදිරි දැක්ම**

අරමුදල මුහුණ දෙන අභියෝග සාර්ථකව ජයගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දරන උත්සාහයන් තව තවත් ශක්තිමත් කර ගනිමින් අරමුදලේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම ප්‍රධාන කර්තව්‍යය වේ. ඒ අනුව,

- අනුරාධපුර, පොළොන්නරුව පූජා භූමි හා සීගිරිය ලෝක උරුම ස්මාරකයන් ආශ්‍රිතව පිහිටා ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- මධ්‍යම සංස්කෘතික අරමුදලේ දීප ව්‍යාප්ත ව්‍යාපෘති ඔස්සේ මෙතෙක් සිදු කරමින් පවතින සංරක්ෂණ හා නඩත්තු කාර්යයන් අඛණ්ඩව තවදුරටත් පවත්වාගෙන යාම.
- පුරාවිද්‍යා කැණීම් හා පර්යේෂණ කාර්යයන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම.
- දෙස් විදෙස් සංචාරකයින් උදෙසා යටිතල පහසුකම් සම්පාදනය හා සංවර්ධනය
- ශ්‍රී ලංකාව පුරා විසිර පවතින බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගමික සිද්ධස්ථාන සංවර්ධනය හා සංරක්ෂණය කිරීම.
- ගුණාත්මක කලා නිර්මාණ උදෙසා දායක වූ කලාකරුවන්ගේ කලා නිර්මාණ ඇගයීමේ වැඩසටහන් ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකාව ඇතුළත හා විදේශයන්හි ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ස්ථාපිත කිරීම.
- අළෙවිය සඳහා අනුරූ නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ග්‍රන්ථ ප්‍රකාශන මුද්‍රණය හා අළෙවි කටයුතු සිදු කිරීම.

## 2.4 ඉදිරියේදී අරමුදලේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම මහජනතාව, පාසැල් සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන් සහභාගිත්වයෙන් පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීම පිළිබඳ විවිධ ක්‍රියාකාරකම් හා වැඩමුළු සංවිධානය කිරීම, පුරාවිද්‍යා විෂය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම, පාසල් සිසුන්ගේ පුරාවිද්‍යා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පාසල් ආශ්‍රිතව විවිධ වැඩමුළු හා දේශන පැවැත්වීම, දේශීය හා විදේශීය සංචාරකයින් උදෙසා ප්‍රදර්ශන හා ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීම, පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ වැරදි තොරතුරු ප්‍රචලිත වීම වැළැක්වීම උදෙසා මාර්ගෝපදේශකයන්ට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමට විවිධ දේශන, වැඩමුළු හා ක්‍රියාකාරකම් මෙහෙයවීම, පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් විවිධ භාෂාවන්ගෙන් යුත් අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාහැරීම, අන්තර්ජාලය භාවිතා කර පුරාවිද්‍යාත්මක තොරතුරු වඩාත් සිත්ගන්නා අයුරින් ප්‍රචලිත කිරීම, ප්‍රදර්ශන පැවැත්වීම

2. නව පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

3. මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය මගින් වඩාත් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය ආශ්‍රිත කර ගනිමින් විවිධ වැඩමුළු, ක්‍රියාකාරකම් වර්ෂය පුරා විහිදෙන පරිදි ක්‍රියාත්මක කිරීම

4. සේවක සුභසාධනය ඉහළ නැංවීමට අදාළ කටයුතු මෙහෙයවීම

5. පුරාවිද්‍යා ස්ථාන නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් උදෙසා සනීපාරක්ෂක හා යටිතල පහසුකම් ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම

6. ව්‍යාපෘති කාර්යාලවල යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම

7. පුරාවිද්‍යාත්මක ස්ථාන සම්බන්ධව සිදුකරනු ලබන විවිධ හානිදායක විනාශයන් සහ පුරාවස්තු සොරකම් කිරීම, නිදන් හැරීම වැනි ක්‍රියාවන් වැළැකක්වීම උදෙසා පනවා තිබෙන නීති ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම හා නව නීති ඇතිකිරීම

8. පුරාවිද්‍යාත්මක ස්ථාන කැණීම් හා සංරක්ෂණ කටයුතු වඩාත් පුළුල් කිරීම

## 03. වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 03.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ

CENTRAL CULTURAL FUND
STATEMENT OF FINANCIAL POSITION
AS AT 31st DECEMBER 2017

| ASSETS | Notes | 2017 | 2016 |
|---|---|---|---|
| CURRENT ASSETS | | Rs. | Rs. |
| Cash & Cash Equivalents | 1 | 170,189,164 | 139,070,261 |
| Receivable | 2 | 307,934,960 | 143,494,122 |
| Inventories | 3 | 114,990,282 | 77,602,071 |
| Investments | 21 | 4,152,257,753 | 2,903,502,450 |
| | | 4,745,372,160 | 3,263,668,903 |
| CAPITAL WORK IN PROGRESS | | 84,067,519 | 20,541,024 |
| NON CURRENT ASSETS | | | |
| Receivables | 4 | 180,852,913 | 175,536,423 |
| Foreign Funded Projects- Katharagama | 9 ii | 676,432 | 676,432 |
| Property, plant & Equipments | 5 | 933,362,394 | 954,780,870 |
| Gratuity Investments | 22 | 685,741,723 | 691,102,852 |
| | | 1,800,633,462 | 1,822,096,577 |
| TOTAL ASSETS | | 6,630,073,141 | 5,106,306,504 |
| LIABILITIES | | | |
| CURRENT LIABILITES | | | |
| Payables and Accruals | 6 | 212,118,009 | 140,041,140 |
| NON CURRENT LIABILITES | | | |
| Provision for Gratuity | 7 | 680,154,693 | 678,031,282 |
| Special Funded Projects | 8 | 17,152,874 | 16,821,196 |
| Foreign Funded Projects | 9 i | 4,817,900 | 4,849,969 |
| TOTAL LIABILITIES | | 914,243,476 | 839,743,587 |
| NET ASSETS | | 5,715,829,666 | 4,266,562,917 |
| CAPITAL CONTRIBUTED BY | | | |
| Capital Reserves | | 428,110,000 | 429,160,000 |
| Assets Revaluation Reserves | | - | 251,414 |
| Foreign Resource Fund | | 226,754,060 | 248,050,137 |
| Accumulated Surplus/(Deficit) | | 5,060,965,605 | 3,589,101,366 |
| | | 5,715,829,666 | 4,266,562,917 |

The Accounting policies on page 3 to 9 and Notes on pages 17 to 35 from and integral part of these Financial Statements.
The Board of Directors are responsible for the preparation and presentation of these Financial Statements.
These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Hiruna Fernando
Director Finance
Central Cultural Fund

Prof. P. Gunawardana
Director General
Central Cultural Fund

J.J. Rathnasiri
Secretary
Ministy of higher Edu. & Cultural Affairs

Prof. P.B. Mandawala
Director General
Dept. of Archeology

Prepared By -
M.G Ariyarathna
(Asst Accountant)
Central Cultural Fund

H.M.K.Herath
Working Director
Central Cultural Fund

CENTRAL CULTURAL FUND

STATEMENT OF FINANCIAL PERFORMANCE

FOR THE YEAR ENDED 31st DECEMBER , 2017

| | Note | 2017 (Rs.) | 2016 (Rs.) |
|---|---|---|---|
| **Income** | | | |
| Tickets Sales | 10 | 3,829,262,911 | 3,445,925,208 |
| Contribution from Replicas Sales | 11 | 4,639,492 | 2,608,009 |
| Contribution from Publication Sales | 12 | 15,124,620 | 8,846,068 |
| Contribution of Printing | 13 | 17,894,468 | 13,155,989 |
| Income from Investments | | 497,842,926 | 233,863,909 |
| Deffered Income | | 22,597,491 | 27,097,930 |
| Other Income | 14 | 40,191,882 | 26,563,180 |
| **Total Income** | | **4,427,553,789** | **3,758,060,292** |
| **Expenditure** | | | |
| Wages, Salaries,& Employee Benefits | 15 | 1,670,648,852 | 1,367,626,547 |
| Gratuity | | 46,833,793 | 51,209,952 |
| Depreciation | 5 | 103,387,124 | 110,494,226 |
| Sales Promotion and Public Relations | | 20,819,224 | 10,943,554 |
| Supplies and Consumable Used | 16 | 203,467,193 | 190,157,421 |
| Repaire of Property, Plant & Equipments | 17 | 52,266,602 | 38,773,040 |
| Contractual Services | 18 | 97,344,858 | 74,347,011 |
| Finance Cost | | 450,457 | 344,232 |
| Audit Fees | | 500,000 | 500,000 |
| Bonus | 19 | 26,227,125 | 27,261,401 |
| Other Expenses | 20 | 734,073,016 | 189,568,606 |
| Exchange Rate Variance | | (287,095) | |
| **Total Expenditure** | | **2,955,731,149** | **2,061,225,988** |
| **Surplus/(Deficit) for the year** | | 1,471,822,640 | 1,696,834,303 |

# CENTRAL CULTURAL FUND

## CASH FLOW STATEMENT FOR THE YEAR 31st DECEMBER , 2017

| | 2017 Rs. | | 2016 Rs. | |
|---|---|---|---|---|
| **Cash Flow from Operating Activities** | | | | |
| Surplus/(deficit) for the year | | 1,471,822,640 | | 1,696,834,303 |
| **Adjusments for non cash movements** | | | | |
| Depreciation | 103,387,124 | | 110,494,226 | |
| Amotisation | (22,597,491) | | (27,097,930) | |
| Profit on disposal of fixed assets | (2,637,855) | | | |
| Write-off stock | 499,368 | | | |
| Exchange variance | (147,300) | | | |
| Interest income | (497,842,926) | | (233,863,909) | |
| Provision for Gratuity | 46,832,843 | (372,506,236) | 51,209,952 | (99,257,661) |
| Operating result before changes in items of working capital | | 1,099,316,404 | | 1,597,576,642 |
| **Changes in work in capital** | | | | |
| Increase in Short term Receivables | (133,637,642) | | 73,655,567 | |
| Inventories | (37,388,211) | | 3,022,655 | |
| Payment of gratuity | (44,708,083) | | (31,918,092) | |
| Payables and Accruals | 72,076,894 | (143,657,042) | 63,053,369 | 107,813,499 |
| Net Cash Generated from Operation Activities | | 955,659,362 | | 1,705,390,141 |
| **Cash Flows from Investment Activities** | | | | |
| Increase in Long term Receivables | (77,343,891) | | | |
| Acquisition of PPE | (54,296,866) | | (99,684,366) | |
| Capital WIP | (59,534,127) | | (24,256,652) | |
| Sale proceed of fixed assets | 2,637,855 | | | |
| (Increase)/Decrease in investments | (1,100,000,000) | | (1,600,000,000) | |
| Investment Withdrawals | 362,736,224 | | 100,000,000 | |
| Net cash used in investing activities | | (925,800,805) | | (1,623,941,018) |
| **Cash Flows from Financing Activities** | | | | |
| Accumilated Surplus | 854,616 | | | |
| Special funded projects | 395,470 | | 8,014,311 | |
| Foreign funded projects | 10,260 | | 482,631 | |
| Cash used in financing activities | | 1,260,346 | | 8,496,942 |
| Net cash increase in cash and cash equivalents | | 31,118,903 | | 89,946,065 |
| Cash and cash equivalents at the beginning of year 2017 | | 139,070,261 | | 49,124,196 |
| Cash and cash equivalents at the end of year | | 170,189,164 | | 139,070,261 |

## Statement of Changes in Equity
### for the year ended 31st December 2017

| | Accumulated Fund | Capital Reserves | Revaluation Reserves | Foreign reserve Fund | Accumulated Surplus | Total |
|---|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| Balance as at 01/01/2016 | 19,944,705 | 16,064,386 | 444,422,000 | 286,249,552 | 1,870,227,421 | 2,636,908,064 |
| Prior year adjustments | (19,944,705) | 414,397,614 | (439,670,732) | (16,903,338) | 22,039,642 | (40,081,520) |
| Add:-Surplus for the year | - | - | - | - | 1,696,834,303 | 1,696,834,303 |
| Transfers to/from | - | (1,302,000) | (4,499,854) | (21,296,076) | | (27,097,930) |
| Balance as at 31/12/2016 | 0 | 429,160,000 | 251,414 | 248,050,137 | 3,589,101,366 | 4,266,562,917 |
| Add: Surplus for the year 2017 | - | - | - | - | 1,471,822,640 | 1,471,822,640 |
| Prior year adjustments | | | | | 41,600 | 41,600 |
| Transfers to/from | | (1,050,000) | (251,414) | (21,296,076) | | (22,597,491) |
| Balance as at 31/12/2017 | 0 | 428,110,000 | 0 | 226,754,060 | 5,060,965,605 | 5,715,829,666 |

## 03.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඑස්/බී/සීසීඑෆ්/1/17/78 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 ජනවාරි 24 දින

අධ්‍යක්ෂ ජනරාල්,

මධ්‍යම සංස්කෘතික අරමුදල.

**මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 29(ඇ) ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු රු.9,138,563 ක් වූ විශේෂ අරමුදල් ව්‍යාපෘති 11 ක්, රු.4,817,900 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 05 ක් සහ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.676,432 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 01ක් සම්බන්ධයෙන් එම අරමුදල්වල ස්වභාවය, අරමුදල ලැබුණු වර්ෂය, අරමුදල ලැබුණේ කුමන කරුණක් සඳහාද යනාදී තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල භාරයේ පැවති නීත්‍යානුකූල අයිතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතුවූ පුරාවස්තු 2,139 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 29(ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

#### (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) ප්‍රමිතයේ 09 ඡේදය අනුව මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් තුල කල් පිරෙන ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගතයුතු නමුත් රු.633,450,476 ක් වටිනා කෙටිකාලීන ආයෝජන සහ ප්‍රධාන කාර්යාලයෙහි වූ සුළු මුදල් ශේෂය වන රු.225,217 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද එ.ජ.ඩො 1,460,000ක වටිනාකම වූ රු.221,059,900 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා යාමක් ලෙස සටහන් කිරීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ කාරක ප්‍රාග්ධන විචලනය තුළ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06**

ප්‍රමිතයේ 29 (එ) ඡේදය අනුව හඳුනාගත යුතු සහ 28 වන ඡේදය අනුව වාර්තා කරන දිනෙන් පසු සිදුවන ප්‍රමාණාත්මක, නොගලපන සිදුවීම් ප්‍රභේදයන් පිළිබඳ හෙළිදරව් කිරීම් කළයුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය හුවමාරු අගය අඛණ්ඩව ඉහල යාම හේතුවෙන් අරමුදලේ විනිමය හුවමාරු ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බලපෑමක් ඇති වී තිබුණද එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ප්‍රමිතයේ 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.126,292,230 ක් වූ මෝටර් රථ සහ රු.16,867,630 ක් වූ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 69 වන ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආපසු ක්ෂය කිරීම ආරම්භ කළයුතු අතර වත්කමක් හඳුනා ගැනීමෙන් ඉවත් කළ පසු ක්ෂය කිරීම නවතා දැමිය යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස අරමුදල විසින් දේපළ පිරියත හා උපකරණ මිලදීගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර, පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට පත්වූ දිනය නොසලකා සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් එකතුව රු.81,968,622 ක්වූ ස්ථාවර වත්කම්, සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කර තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

ප්‍රමිතයේ 15 වන ඡේදය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවද ඊට පටහැනිව ව්‍යාපෘති 06 ක අවසන් තොගය ඍජුවම විකුණුම් මිලට අගය කර රු.10,441,493 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රකාශන, අනුරූ හා පරිභෝජන ද්‍රව්‍ය අගය කරනු ලබන පදනම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් ප්‍රවේශ පත්‍ර තොග අගය කරනු ලබන පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන අයනොවන ණයගැති ශේෂය රු.3,388,452 ක් සමාලෝචනය කිරීමකින් තොරව රු.1,964,833 ක අඩමාණ ණය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඇ) අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ සිට පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණද, වර්ෂයට අදාළ වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 15 ඡේදය පරිදි, ප්‍රමිත නිර්මාණය කරන ආයතනවල මෑත කාලීන ප්‍රකාශ කිරීම් අනුව, අනාගත සේවක වැටුප් වැඩිවීම්, වට්ටම් අනුපාතිකය, සේවක පිරිවැටුම හා අනෙකුත් ආයුගණක උපකල්පන පදනම් කරගෙන පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු වුවත් එපරිදි ප්‍රතිපත්තියක් සකස් කර ගැනීමකින් තොරව සේවකයින් විසින් අවසානවරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවකයින් 2,562 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ලෙස එකතුව රු.680,154,693 ක වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඈ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.1 අනුව, මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කරන බවද එම ප්‍රමිතයන් යොදා ගැනීමට නොහැකි අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යොදාගන්නා බවද දක්වා තිබුණි. නමුත් අරමුදල විසින් කුමන අයිතමයන් සඳහා කවර ගිණුම්කරණ ප්‍රමිතයක් භාවිතා කරන්නේද, එහිදී අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය කුමක්ද යනාදී විස්තර මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලිව දක්වා නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය එ.ජ.ඩො 1,460,000 ක් හා ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය එ.ජ.ඩො 246,398 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එදිනට පැවති විදේශ විනිමය හුවමාරු අනුපාතය වන රු.150.9156 ක් පදනම් කරගෙන රුපියල් අගය ගණනය කිරීම වෙනුවට 2017 දෙසැම්බර් 29 දිනට පැවති අනුපාතය වන රු.151.3076 ක් යොදා ගැනීම හේතුවෙන් විදේශ විනිමය හුවමාරු අලාභය රු.668,908 ක් අඩුවෙන් හා විදේශ විනිමය ඉතුරුම් ගිණුමෙහි ශේෂය රු.96,588 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 1985-2012 කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික, රජයේ ආයතන සහ විදේශ රටවලින් අරමුදලට ලැබුණු රු. 428,110,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සහ 1981-2011 කාලපරිච්ඡේදය තුළ අරමුදලට ලැබුණු රු.226,754,060 ක් වූ විදේශ ප්‍රාග්ධන ප්‍රදාන, ක්‍රමානුකූල පදනමක් මත විලම්භිත ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා පැහැදිලි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විලම්භිත ආදායම් ලෙස රු.22,597,491 ක් ගිණුම්ගත කර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.680,154,693 ක් වුවද ඊට අනුරූපීව පවත්වා ගෙන තිබුණු පාරිතෝෂික ආයෝජන ගිණුමේ ශේෂය රු.685,741,723 ක් විය. ඒ අනුව වූ රු.5,587,030 ක වෙනස සසඳා නොතිබුණි.

(ආ) විගණනයේ ගණනය කිරීම් අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති ප්‍රකාශන තොගයේ වටිනාකම රු.17,541,033 ක් වුවද සටහන් අංක 12 අනුව එය රු.32,865,653 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.15,324,620 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) සේවක ණයගැතියෝ | 94,368,893 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) ප්‍රවේශපත් තොගය | 879,350 | තොග සමීක්ෂණ වාර්තා |

## 2.3 ලැබියයුතු ගිණුම්

විගණනයට ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණය අනුව, වර්ෂ 05 ඉක්මවූ නිවාස ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ පිළිවෙලින් රු.18,368,291 ක් රු.433,010 ක් හා රු.87,991 ක් වූ අතර එම ණය අයකර ගැනීමට අරමුදල විසින් ඵලදායී පියවරක් ගෙන නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත | |
| (i) 4 (ඉ) වගන්තිය | පනතේ විධිවිධානයන්ට යටත්ව සියලු කරුණු ඇතුළත් වනසේ විධිමත් රීති මාලාවක් සකස් කිරීමට ආරම්භයේ සිට මේ වන තෙක් අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) 4 (ඊ) වගන්තිය | අරමුදලේ මුදල් ආයෝජනය කිරීමට සහ එම ආයෝජන ආපසු ලබා ගැනීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද 2017 වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු වල ආයෝජනය කළ රු.1,100,000,000 ක් සහ ඇමරිකන් ඩොලර් 1,460,000 (රු.220,343,200) ක් සඳහාද ආයෝජන ආපසු ලබාගැනීම් රු.362,736,222 ක් සඳහාද පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 6 (ඉ) වගන්තිය | සංස්කෘතික ත්‍රිකෝණ වශයෙන් නිරූපණය කරනු ලැබ ඇති ප්‍රදේශයට ඇතුළුවන ආගන්තුකයින්ගෙන් සහ සංචාරකයන්ගෙන් ගාස්තු අයකරනු ලැබිය හැකි බව දක්වා තිබුණු නමුත් ඊට පටහැනිව සංස්කෘතික ත්‍රිකෝණයට අයත් නොවන ගාල්ල, රම්බාවිහාරය, අපේගම, කතරගම, යාපහුව හා බුදුරුවගල යන උරුම ස්ථාන වලින් සමාලෝචිත වර්ෂය තුළ රු.36,082,437 ප්‍රවේශපත්‍ර ආදායම් ලබාගෙන තිබුණි. |
| (ආ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත | |
| (i) 21 (1) වගන්තිය | • පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරිය යටතේ හා එහි කොන්දේසි අනුව හැර හෝ 20 වන වගන්තිය යටතේ අතුළත් වූ ගිවිසුමක් අනුව හැර යම් ආරක්ෂිත ස්මාරකයක් ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව වෙනස් කිරීමේ හෝ අතිරේකව ඉදිකිරීමේ යම් කාර්යයක් ආරම්භ කිරීම නොකළ වුවත් පුරාවිද්‍යා වටිනාකමක් සහිත විහාරස්ථාන 04 ක් සඳහා සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ලබාගත් අවසරය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.906,996 ක් වටිනා පරිත්‍යාග මුදල් ලබාදී තිබුණි.<br>• රුවන්වැලිසෑය වැලිමළුව සංරක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.25,053,596 ක් වැයකර තිබූ නමුත් එම කටයුතු ආරම්භ කිරීමට පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ලබාගත් අවසරය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

---

| | | |
|---|---|---|
| (i) | II පරිච්ඡේදයේ 1:2 වගන්තිය | මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ආයතන සංග්‍රහයට පටහැනිව අධ්‍යක්ෂ (ආගමික), අධ්‍යක්ෂ (සැලසුම්), වැඩ ඉංජිනේරු, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ, පරීක්ෂණ නිලධාරී වැනි නව තනතුරු ඇති කිරීම සහ බඳවා ගැනීම සිදුකර තිබුණි. තවද අරමුදලේ හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරු තුළ ඇතුළත් නොවූ මුරකරුවන් 2271 ක් සහ කම්කරුවන් 1130 ක් වශයෙන් සේවකයින් 3401 ක් පාලක මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගෙන තිබුණි. |
| (ii) | II පරිච්ඡේදයේ 9:1 වගන්තිය | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද පරීක්ෂා කරන ලද පෞද්ගලික ලිපිගොනු 29 කින් ලිපිගොනු 8 කට ආදළ නිලධාරීන් විශ්‍රාමික නිලධාරීන් වූ අතර එකී නිලධාරීන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය. |
| (iii) | II පරිච්ඡේදයේ 13:4 උපවගන්තිය | පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතුය. එසේ වුවද බඳවාගැනීමේ පරිපාටියේ 4.3.4.1 වගන්තිය අනුව සුදුසුකම් නොමැති නිලධාරියකු සීගිරිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා 2017 ඔක්තෝබර් 02 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 381 (1) | අරමුදල විසින් 2017 මාර්තු 28 දින සිට විදේශ ව්‍යවහාර මුදලින් (ඇ.එ.ජ.ඩොලර්) ඉතුරුම් ගිණුමක් ආරම්භකර ගණුදෙනු පවත්වාගෙන යනු ලැබුවද ඒ සඳහා ලබාගත් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

-----------------------------

| | |
|---|---|
| (i) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 (i) චක්‍රලේඛය | • වයස අවුරුදු 60 ඉක්මවූ විශ්‍රාමිකයෙකු රජයේ සේවයේ අනුමත තනතුරක නැවත සේවයේ නොයෙදවිය යුතු වුවද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් බඳවාගත් දිනට වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් 5 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු බව නියැදි පරීක්ෂණයකින් අනාවරණය විය.<br><br>• වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවකු මොනම හේතුවක් නිසා හෝ රාජ්‍ය සේවයේ අනුමත තනතුරකට පත් නොකළ යුතුය. එසේ වුවද පරීක්ෂා කරන ලද විශ්‍රාමික නිලධාරීන් 9 දෙනෙකුගේ ලිපි ගොනු අතරින් වයස 67 ඉක්මවූ විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකු ප්‍රවාහන උපදේශක, සංරක්ෂණ නිලධාරී, කෞතුකාගාර විද්‍යාව පිළිබඳ උපදේශක යන තනතුරු වල සිටින බව නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| | | • විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළදී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනාගනු ලැබිය යුතු අතර, එම නිලධාරියා පුරුදු කිරීමේ කාර්ය නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් වශයෙන් ඔහුට පැවරිය යුතුය. එසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර දිගින් දිගටම එකී නිලධාරීන්ගේ සේවය දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. |
| (ii) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය - 7 ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පාලක මණ්ඩල අනුමැතිය මත අරමුදල විසින් බඳවාගැනීම් සිදුකර තිබුණි. |
| (iii) | 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන චක්‍රලේඛය 15.2 උපවගන්තිය | කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යොදවා ඇති පුද්ගලයින්ගේ වැටුප පවත්නා කොන්ත්‍රාත් කාලසීමාව තුළ සංශෝධනය නොකළ යුතුය. එසේ වුවද ප්‍රවාහන උපදේශක (තාක්ෂණික) නිලධාරියාගේ වැටුප පාලක මණ්ඩල පත්‍රිකාවක් මඟින් රු.15,000 සිට 30,000 දක්වා කොන්ත්‍රාත් කාලසීමාව තුළ සංශෝධනය කර තිබුණි. |
| (iv) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 03 (i) හා 03 (ii) ඡේද | (i) චක්‍රලේඛය ප්‍රකාරව සියයට 20 විශේෂ දීමනාව සහ අන්තර් දීමනාව වන රු.10,000 ක මුදල නව වැටුප් ව්‍යුහය තුළ අන්තර්ගත කර ඇති බව දක්වා තිබුණි. එසේ වුවද අරමුදල විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා නිලධාරීන්ට ඉහත විශේෂ දීමනාව සහ අන්තර් දීමනාව ඇතුළත් කර වැටුප් ගෙවන බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. ඒ අනුව පරීක්ෂා කරන ලද ලිපිගොනු 04 කට අදාළව නිලධාරීන් 04 දෙනෙකු සඳහා 2016,2017 සහ 2018 ජූලි මස දක්වා විශේෂ දීමනා වශයෙන් රු.403,470 ක්ද අන්තර් දීමනා වශයෙන් රු.457,689 ක්ද ඊට අදාල සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර |

අරමුදලට දායකය (12% + 3%) රු.129,185 ක්ද වශයෙන් එකතුව රු.990,334 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) 19.2 ඡේදයට අනුව 2006 ජනවාරි 01 දිනට පසු ලබාදී ඇති පත්වීම් සඳහා අදාළ විය යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවර වේ. එසේ වුවද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද නිලධාරීන් සඳහා ඊට ඉහළ වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පරීක්ෂා කරන ලද ලිපිගොනු 5 ක් අතරින් නිලධාරීන් 04 දෙනෙකුට අදාළව ඉහත වැටුප් පියවරයන් ලබා දී තිබූ අතර ඒ අනුව ඉහත නිලධාරීන් සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.450,821 ක් විය.

(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

---------------------------

| | |
|---|---|
| (i) 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛය 3.1 ඡේදයේ 2 අනු ඡේදය | (i) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිවිය යුතු මාසික ඉන්ධන දීමනාව ලීටර් 150 ක් වුවද 2016 ජනවාරි සිට 2017 අගෝස්තු දක්වා වූ මාස 20 ක කාල සීමාව සඳහා මාසිකව ලීටර් 170 බැගින් ගෙවා තිබුණි. ඒ අනුව සීමාව ඉක්මවා ගෙවා තිබූ ඉන්ධන වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු.51,200 ක් අදාළ නිලධාරියාගෙන් හෝ වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 3.1 ඡේදයේ 4 අනු ඡේදය | 2006 වර්ෂයේ නිකුත් කරන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1 – 1 ශ්‍රේණිය හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරන වෙනත් ඕනෑම නිලධාරියෙකු ලීටර් 120 ක මාසික ඉන්ධන දීමනාවක් ලැබීමට හිමිකම් ලබන බව දක්වා තිබුණි. එසේ වුවද ඊට පටහැනිව නිලධාරීන් 08 දෙනෙකුට අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැඩිපුර රු.243,930 ක් ගෙවා තිබුණු අතර එම මුදල අදාළ නිලධාරියාගෙන් හෝ වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ල) රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>-----------------------<br>2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය ප්‍රකාරව අනුමත අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතුය. එහෙත් අයවැය ඇස්තමේන්තුව මගින් මුදල් වෙන්කර නොතිබියදී අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘති කාර්යය වෙනුවෙන් පරිගණක හා උපාංග සහ ජාල පහසුකම් ලබාගැනීම වෙනුවෙන් අරමුදල විසින් 2017 වර්ෂය තුළ රු. 391,180 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. |
| (ළු) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 ජූලි 21 දිනැති අංක ඩීඑම්එස්/ඊ1/54/9/241 දරන ලිපිය | ලිපියේ 04 ඡේදයට අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව තනතුරු ඇති කිරීම හා 2011 ජූනි 30 දිනෙන් පසුව අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතුය. එහෙත් අරමුදල විසින් විවිධ ව්‍යාපෘති ඇති කරමින් අධ්‍යක්ෂ (ආගමික), අධ්‍යක්ෂ (සැලසුම්), වැඩ ඉංජිනේරු, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ, පරීක්ෂණ නිලධාරී වැනි තනතුරු සඳහා සේවක බඳවා ගැනීම් සිදුකර තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 (ඇ) උපවගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් නිෂ්පාදනය කරන ලද රු.5,548,700 ක් වටිනා අනුරූ හා මුද්‍රණය කළ රු.375,093 ක ප්‍රකාශන පරිත්‍යාග සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,471,822,640 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,696,834,303 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලය රු.225,011,663 කින් එනම් සියයට 13.2 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. 669,493,497 කින් වර්ධනය වී තිබුණද වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ වියදම රු.303,022,305 කින්ද, අනෙකුත් වියදම් රු.544,504,410 කින්ද කොන්ත්‍රාත් සේවා වියදම් රු.22,997,847 කින්ද සැපයුම් හා පරිභෝජන වියදම රු.13,309,772 කින්ද වැඩිවී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.302,069,090 ක්වූ අතිරික්තය 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණ ද 2017 වර්ෂයේදී පිරිහීමට ලක්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.1,065,769,479 ක් වූ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.3,034,217,986 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් 2017 වර්ෂයේදී රු. 2,974,285,411 ක් දක්වා අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව පාර්ලිමේන්තු පනත් මගින් සංස්ථාපිත ආයතන විසින් දිගු කාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. එසේ වුවද අරමුදල විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන

ව්‍යාපෘතීන්ට අදාළ කැණීම්, සංරක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ වැඩ සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

අරමුදල විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්යභාරයන් හා ළඟා කරගත් ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක මණ්ඩල වෙබ් අඩවියෙන් ලබාගත් තොරතුරු වලට අනුව, 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව හා රමුදලේපොත්පත් අනුව, අරමුදල විසින් අලෙවි කළ සංචාරක ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව අතර විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂය | ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව | අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය | අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2013 | 1,274,593 | 504,699* | 39* |
| 2014 | 1,527,153 | 627,136 | 41 |
| 2015 | 1,798,380 | 722,676 | 40 |
| 2016 | 2,050,832 | 923,204 | 45 |
| 2017 | 2,116,407 | 994,556 | 46 |

*එක් සංචාරකයකු විසින් එක් පුරාවිද්‍යාත්මක ස්ථානයක් පමණක් නරඹන්නේ යයි උපකල්පනය කර ගණනය කිරීම් සිදුකරන ලදී.

ඉහත තොරතුරු අනුව 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවට සාපේක්ෂව අරමුදල විසින් අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සියයට 39 ත් සියයට 47 ත් අතර පරාසයක් ගෙන තිබුණි. ඒ අනුව පෞරාණික සංස්කෘතික නටඹුන් සහිත ස්ථාන නැරඹීම හා ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට අලෙවි ප්රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තුළින් තවදුරටත් ආදායම් වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) ආයතනය විසින් සකස් කර තිබුණු වැඩ සැලැස්ම අනුව, වර්ෂය තුළ ආරම්භ කර වර්ෂය තුළ නිම කරන ලද ක්‍රියාකාරකම් 35කට අදාළව ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා සත්‍ය වියදම් සැසඳීමේදී ඉතිරිය සියයට 10 ත් 99 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) අරමුදලේ වාර්ෂික වැඩ සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. 439,938,818 ක් වූ යටිතල පහසුකම් සංවර්ධනය, සංරක්ෂණ කටයුතු වැනි ක්‍රියාකාරකම් 34 ක් අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි.

(ඈ) වාර්ෂික වැඩ සැලැස්මට පරිබාහිරව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 04 ක් ක්‍රියාවට නංවා තිබූ අතර ඒ සඳහා දරන ලද වියදම රු. 6,066,320 ක් විය.

(ඉ) වැඩ සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්වල, අපේක්ෂිත නිමැයුම/ප්‍රතිඵල වැඩ සැලැස්මෙහි දක්වා තිබුණි.

(ඊ) සංස්කෘතික හා ආගමික ස්ථාන අළුත්වැඩියා කටයුතු සඳහා අදියර 1 සහ අදියර 2 යටතේ දිස්ත්‍රික්ක 19 ක් තුළ පිහිටි ආගමික ස්ථාන 965 ක් සඳහා අරමුදල විසින් රු.497,741,581 ක මුදල් පරිත්‍යාගකර තිබුණි. ආගමික ස්ථාන 965 ක් අතරින් ආගමික ස්ථාන 316 ක් එනම් සියයට 33 ක ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන වෙත ලබා දී තිබූ අතර මුළු පරිත්‍යාග වටිනාකම අනුව ගත්කළ එය සියයට 26 ක් පමණ විය. තවද පරිත්‍යාග ලබාදුන් මුළු ආගමික ස්ථාන ප්‍රමාණයට සාපේක්ෂව එක් දිස්ත්‍රික්කයක් සඳහා ලබාදුන් පරිත්‍යාග වටිනාකමේ ප්‍රතිශතය සියයට 1 කට අඩු දිස්ත්‍රික්ක 04 ක්ද සියයට 1ත් 5ත් අතර දිස්ත්‍රික්ක 8 ක්ද සියයට 6ත් 10ත් දිස්ත්‍රික්ක 5 ක්ද 10 ත් 15 ත් අතර 1 ක්ද විය. එමෙන්ම දිස්ත්‍රික්ක 05 ක් සඳහා කිසිදු පරිත්‍යාග මුදලක් ලබාදී නොතිබුණු බවද නිරීක්ෂණය විය. ඒ අනුව පරිත්‍යාග ලබාදීමේදී අරමුදල විසින් සාධාරණ පදනමක් මත සමස්ත දිවයිනම ආවරණය වන පරිදි පරිත්‍යාග බෙදී යන විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාවට නැංවීමට අපොහොසත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතිය අරමුදලට පවරා ගැනීමට 2018 සැප්තැම්බර් 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පැවති අපේගම ආයතනයේ අධීක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරීම සඳහා දෙපාර්ශවය විසින් 2016 ජූනි 16 දිනැති අංක ඊඩී/10/එන්එච්/03/02/01/07 දරන අවබෝධතා ගිවිසුමට අත්සන් තබා තිබුණි. ගිවිසුමේ 08 ඡේදයට අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි අපේගම ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විධිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් භාර

ගැනීමට කටයුතු කළයුතු වුවද අරමුදල විසින්2018 සැප්තැම්බර් 28 දින දක්වා එසේ සිදුකර නොතිබුණි.

(ඈ) අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු, කාර්යයන්, ඊට අදාළ කාල රාමුව, වගකිව යුතු පාර්ශවයන්, මානව හා භෞතික සම්පත්වල අවශ්‍යතාවය හා දැරීමට සිදුවන පිරිවැය පිළිබඳ නිසි හඳුනාගැනීමක් හෝ ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් අරමුදල විසින් සිදුකර නොතිබීම හේතුවෙන් අන්තර්ජාලය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට 2018 අගෝස්තු 30 දින වනවිටද අපොහොසත් වී තිබූ අතර අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීම පමණක් සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය.

(ඈ) 2010 නොවැම්බර් 20 දිනැති අංක පීඑෆ්/4/සීඑම්/1(Cir) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.2 ප්‍රකාරව, විද්‍යුත් මාධ්‍ය හරහා ගෙවීම් ලබාගැනීමට අවශ්‍ය බලය සහ වගකීම සේවකයන් වෙත ලබාදීම හා එම ගෙවීම් සඳහා උචිත අභ්‍යන්තර පාලන පද්ධතියක් හා ආරක්ෂක පද්ධතියක් ඇතිකිරීම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් සිදුකළ යුතු වේ. ඒ අනුව අන්තර්ජාලය හරහා විද්‍යුත් ප්‍රවේශපත් නිකුත් කිරීමේ පද්ධතියක් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්යමණ්ඩලයක් අරමුදලේ සේවයේ යෙදවීම අත්‍යවශ්‍ය වන නමුත් එවැනි කාර්යමණ්ඩලයක් බඳවාගැනීමට අරමුදල විසින් මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) දැනට ක්‍රියාත්මක වන අන්තර්ජාලය මගින් ගෙවීම් කිරීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා දැනුමැති කාර්යමණ්ඩලයක් අරමුදල තුළ නොවූයෙන් පද්ධතියේ පාලන කටයුතු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් සිදුකරනු ලබන අතර එය අරමුදලේ තොරතුරුවල රහස්‍යභාවය කෙරෙහි බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය වේ.

(ඊ) මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා කැබ්රථ මිලදී ගැනීමට අදාළව 2016 වර්ෂයේදී පවත්වන ලද මූලික පරීක්ෂණයේදී නිලධාරීන් 11 දෙනෙකු චෝදනා ලබාතිබූ නමුත් ඒ අතුරින් තෝරාගත් නිලධාරීන් තිදෙනෙකුට පමණක් විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර තිබූ අතර එම විධිමත් විනය පරීක්ෂණ 2018 නොවැම්බර් 06 දින වන විටද නිමකිරීමට අරමුදල අපොහොසත්ව තිබුණි. අනෙකුත් නිලධාරීන් 08 දෙනා සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර නොතිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(උ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ත්‍රිකුණාමලය ව්‍යාපෘතියේ සේවය කළ සේවකයකු වෙත ගෙවිය යුතු පාරිතෝෂිත මුදල අඩුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් අධිහාර ලෙස රු.30,423 ක් අරමුදලින් දැරීමට සිදු වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන හා මුද්‍රණ යන අංශ වල නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ සෘජු වියදම් පමණක් සැලකිල්ලට ගෙන තිබුණු අතර වක්‍ර පිරිවැය පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි. ඒ අනුව අනුරූ නිෂ්පාදනයන්හි නිෂ්පාදන පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමෙන් පසුව විකුණුම් මිල තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා ප්‍රගති වාර්තා අනුව අනුරාධපුර මහාවිහාර ව්‍යාපෘතියේ ගොඩනැගිලි නඩත්තුව, විද්‍යාත්මක නඩත්තුව හා දෛනික නඩත්තු කටයුතු හා රුවන්වැලිසෑය වැලි මළුව සංරක්ෂණය කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත මිනිස් දින ගණන 13914 ක් වූ අතර වැඩකළ මිනිස් දින ගණන 20358 ක් වී තිබුණි. මේ අනුව ඇස්තමේන්තු ඉක්මවා මිනිස් දින 6443 ක් වෙනුවෙන් රු.11,920,937 ක් වැයකර තිබූ අතර ඇස්තමේන්තුවේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) අරමුදල විසින් උරුම ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර අරමුදලේ කොළඹ 07 පිහිටි මුද්‍රණ අංශයේ මුද්‍රණය කරනු ලැබේ. ඒ සඳහා 300 GSM ඝනකම සහිත දිග හා පළල පිළිවෙලින් මිලිමීටර් 900 ක් හා 600 ක් වූ කඩදාසියක් භාවිතා කරමින් මිලිමීටර් 285 ක් දිග මිලිමීටර් 88 ක් පළල ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරනු ලැබේ. අනුරාධපුර, පොළොන්නරුව හා සීගිරිය යන උරුම ස්ථාන සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයක භෞතික ප්‍රමාණය අනුව කඩදාසියකින් මුද්‍රණය කළයුතු ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සහ මුද්‍රණය කර තිබූ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවේදී 2015 සිට 2017 දක්වා වූ වර්ෂ සඳහා ප්‍රවේශපත්‍ර 319,794 ක අඩුවක් නිරීක්ෂණය විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 10 දිනැති අංක අමප/11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අරමුදල විසින් උපයා ගනු ලබන ප්‍රවේශ පත්‍ර ආදායමින් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් පුරාවිද්‍යා කළමනාකරණ භාරය වෙත ලබාදිය යුතු වේ. ඒ අනුව 2017 වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු.3,829,262,911 කින් සියයට 25 ක් ලෙස රු.957,315,728 ක් එම භාරය වෙත ලබාදිය යුතු වුවද ලබාදී තිබුණේ රු.193,060,865 ක් පමණි.

(ආ) මාස 03 කින් කල්පිරීමට නියමිත රු.582,489,594 ක් වූ ස්ථාවර තැන්පතු 06 ක් සහ රු.50,960,882 ක් වූ මාසයකින් කල්පිරෙන ස්ථාවර තැන්පතුවක් තිබියදී අරමුදල විසින් මාස 12 කින් කල්පිරෙන එකතුව රු.125,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීම හේතුවෙන් 2017 වර්ෂය තුළදී අරමුදල වෙත රු.13,150,343 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 4.5 වෙනත් බාහිර පාර්ශවයන් හා රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අරමුදලේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දී රු.මිලියන 4.2 කට තක්සේරු කර ඇති අරමුදලේ දේපළක් වූ මහනුවර පිහිටි ප්‍රිම්රෝස් ඉඩම 2013 වර්ෂයේ සිට මහරගම ශාසන සේවක සංගමයේ නුවර සංගමය ලෙස ගොඩනැගිලි ඉදිකර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන නමුත් එම දේපළ අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලට අයත් හන්තාන පිහිටි වටිනාකම රු.මිලියන 4 ක්වූ ගොඩනැගිලි 02ක්, 2012 වර්ෂයේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මුත් එම ගොඩනැගිලි අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.7 කාර්යමණ්ඩල පරිපාලනය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩල පරිපාලනය දුර්වල මට්ටමක පවතින අතර වසර කිහිපයක සිට නියමිත ක්‍රමවේදයන් අණපනත් සහ රෙගුලාසිවලට පටහැනිව බඳවා ගැනීම් පත්කිරීම් සහ උසස් කිරීම් සිදුකරන බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නොවූ නීති නිලධාරි තනතුර සඳහා 2016 අගෝස්තු 26 වන දින සිට මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන තිබුණු අතර එම කොන්ත්‍රාත් කාලයෙන් පසුව නැවතත් 2017 පෙබරවාරි 27 සිට මාස 06 ක කාලයක් දීර්ඝ කර තිබුණි. 2017 අගෝස්තු 27 වන දින සිට වසරක කාලයක් සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් වූ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට කොන්ත්‍රාත් පදනම මත එම නිලධාරියාවම පත්කර තිබුණි. තවද රු.45,930 ක් සහ රජයේ අනුමත අනෙකුත් දීමනා ද ඇතුළත් මාසික දීමනාවක් ලෙස 2016 අගෝස්තු 26 සිට 2018 පෙබරවාරි මාසය දක්වා රු. 1,164,229 ක් අරමුදල විසින් මෙම නිලධාරියාට ගෙවා තිබුණි. එසේම අරමුදල විසින් "සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)" තනතුර සඳහා ස්ථිර පදනම මත නිලධාරියෙකු බඳවාගැනීමට 2018 සැප්තැම්බර් 28 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ 5.4 උපවගන්තිය අනුව සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට බඳවා ගනු ලබන්නේ වයස අවු.22 ට නොඅඩු අවු.45 ට නොවැඩි බාහිර අයදුම්කරුවන් වුවද සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන අවස්ථාව වන විට මෙම නිලධාරියා එම උපරිම වයස් සීමාව ඉක්මවාගොස් තිබුණි. ඒ අනුව අනුමත බඳවාගැනීමේ පරිපාටියට පටහැනිව මෙම පත්කිරීම කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) නීති නිලධාරී/සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට අදාළ රාජකාරී ලැයිස්තුවට අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල වෙනුවෙන් අධිකරණවල නඩු කටයුතුවලට හා විමර්ශනවලට පෙනී සිටීම සහ බේරුම්කරණ ක්‍රියාදාමයන්ට සහභාගී වීම, මානව හිමිකම් කම්කරු විනිශ්චය සභා හා අනෙකුත් විමර්ශන වලදී පෙනී සිටීම, උත්තරවාද විරෝධතා හා අනෙකුත් අධිකරණ කටයුතුවලට අවශ්‍ය වන ලේඛන පිළියෙල කිරීම නීති නිලධාරී/සහකාර අධ්‍යක්ෂ (නීති) ගේ කාර්යයභාරය වී තිබුණි. ඒ අනුව අරමුදලේ නීති කෘත්‍යයන් වෙනුවෙන් ක්‍රියාකිරීමට නිලධාරියෙකු පත්කර සිටියදී බාහිර නීතිඥයන්ගෙන් සේවා ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැති වුවද එම කාර්යයන් බාහිර නීතිඥවරුන් මගින් ඉටුකරවා ගෙන සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් රු. 1,070,100 ක් ඒ සඳහා වැය කර තිබුණි.

(ඈ) විගණනය විසින් වරින් වර පෙන්වා දී තිබුණද අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු වලට මෙන්ම බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති විවිධ තනතුරු නාම මත බඳවාගැනීම් සිදුකර තිබුණි. ඒ අනුව බඳවා ගැනීමේ පරිපාටියේ අනුමත තනතුරු 08 කට අදාළව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් 10 ක්ද, බඳවා ගැනීමේ පරිපාටියේ අනුමත තනතුරු 05 කට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත්

පදනම මත බඳවා ගැනීම් 184 ක් බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරු 21 කට අදාළව බඳවා ගැනීම් 79 ක්ද වශයෙන් 273 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඉ) අරමුදල විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට අනියම් හා පුහුණු පදනම මත නිලධාරීන් / සේවකයින් 403 ක්, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් / සේවකයින් 251 ක්, දිස්ත්‍රික් රේට සඳහා කම්කරුවන් 632 ක් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා බඳවාගත් නිලධාරීන් / සේවකයින් 934 ක්, සඳහා ගෙවූ වැටුප් හා දීමනා වල එකතුව රු.500,589,684 ක් විය.

(ඊ) ඉහත (ඉ) නිරීක්ෂණයේ සඳහන් බඳවා ගැනීම් වලට අතිරේක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් අරමුදලේ පාලක මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා සහායකයින් සහ මුරකරුවන් සමාලෝචිත වර්ෂය තුළදී බඳවාගෙන තිබුණි. 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ එම පුරාවිද්‍යා සහායකයින් හා කම්කරුවන් සඳහා ගෙවූ වැටුප්, සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට ගෙවූ මුදල රු.37,228,036 ක් විය.

(උ) අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන) තනතුර සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ 4.2.1.1 උපවගන්තියට පටහැනිව සුදුසුකම් නොමැති, 4.3 උපවගන්තිය අනුව අදාළ වයස් සීමාව ඉක්මවූ නිලධාරියකු 2017 අප්‍රේල් 07 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2018 මැයි 31 දින දක්වා රු.1,253,343 ක් වැටුප් ගෙවා තිබුණි.

(ඌ) අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටියේ 4.2.3.1 (ආ) උපවගන්තියට පටහැනිව 2017 අප්‍රේල් 19 දින කොන්ත්‍රාත් පදනම මත සුදුසුකම් නොමැති නිලධාරියෙකු බඳවාගෙන 2018 මැයි 31 දින දක්වා රු.1,253,343 ක් වැටුප් ගෙවා තිබුණි.

(එ) අරමුදලේ බඳවාගැනීම් පරිපාටිය තුළ ඇතුළත් නොවූ අධ්‍යක්ෂ (ආගමික) තනතුර සඳහා 2017 ජුනි 21 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියකු සඳහා රු.1,060,521 ක් වැටුප් ගෙවා තිබුණි.

(ඒ) බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කමිටුව විසින් නව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය, ව්‍යාපෘති හා කාර්යාල සඳහා පිළියෙල කරන සේවක සංඛ්‍යා ලේඛනය හා ආයතනයේ නව සංවිධාන ව්‍යුහය ඇතුළත් වාර්තාව 2018 පෙබරවාරි 14 දිනැති ලිපිය මගින් අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2018 සැප්තැම්බර් 28 දින දක්වා එම පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා අරමුදල විසින් ඉදිරිපත් කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 උප වගන්තිය ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 5 දින 23 ක ප්‍රමාදයකින් පසුව 2018 අගෝස්තු 23 දිනදීය.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපදේශකවරුන් තෝරාගැනීමේ හා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් වූ 2007 මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් අරමුදල විසින් සේවා පැවරුම් කොන්දේසි ලේඛනයක් (TOR) පිළියෙල කර නොතිබුණි.

(ආ) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 වගන්තිය ප්‍රකාරව, 2017 මැයි 30 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 202.17.01 මගින් නිලධාරීන් 03 දෙනෙකුගේ නම් යෝජනා කර එම තිදෙනා අරමුදලේ බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමේ කමිටුවට පත්කර තිබුණි. එහෙත් මෙම නිලධාරීන්ගේ පළපුරුද්ද, එම නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමට ඇති සුදුසුකම් යනාදිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔවුන් පත් කරනු ලැබුවේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) උපදේශන සේවා සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.6 වගන්තිය ප්‍රකාරව, පාරිශ්‍රමික, සෘජු වියදම්, නිවාඩු,රක්ෂණ, දෛනික දීමනා හා සේවා පැවරුම් කොන්දේසි ලේඛනයක් (TOR) යනාදිය ආවරණය වන සේවා කොන්දේසි ඇතුළත් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට හැකි අවස්ථාවලදී අත්සන් තැබිය යුතුය. එහෙත් බඳවා ගැනීමේ පරිපාටිය සකස්කිරීමේ කමිටුව සමග එවැනි ගිවිසුමකට අත්සන් තැබීමට අරමුදලට හැකියාව තිබුණද අරමුදල විසින් එවැනි ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි.

(ඈ) උපදේශන සේවා සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.4 වගන්තිය ප්‍රකාරව, පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට විස්සක (20%) ක උපරිමයක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් නොමැතිව අරමුදල විසින් කොන්ත්‍රාත් මුදලින් සියයට 40 ක් වූ රු.360,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) කොළඹ 07 පිහිටි, අරමුදලේ ප්‍රධාන කාර්යාලය අලුත් වැඩියා කටයුතු සිදුකරන තෙක් අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යාමට ස්ථානයක් තෝරාගැනීමේදී අරමුදල විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණු අතර සී/ස/නාගරික

අයෝජන හා සංවර්ධන (පුද්ගලික) සමාගමට අයත් සෙත්සිරිපාය II වන අදියරෙහි 4 වන මහලෙහි "ඩී" පර්යන්තය අරමුදලේ කාර්යාලය කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම හේතුවෙන්, විකල්ප අවස්ථා ඇගයීම් තුළින් අවම පිරිවැය සහිත ස්ථානයක් තෝරාගැනීමට තිබූ අවස්ථාව අරමුදල විසින් අහිමිකරගෙන තිබුණි. ඒ අනුව ගොඩනැගිලි කුලිය , සනීපාරක්ෂක කටයුතු සඳහා ගාස්තු සහ විදුලි ගාස්තු ලෙස පිළිවෙලින් රු. 18,308,924 ක්, රු. 325,283 ක් හා රු. 1,040,076 ක් 2017 මාර්තු මාසයේ සිට 2018 අප්‍රේල් මාසය දක්වා අරමුදල විසින් ගෙවා තිබුණි. නමුත් 2018 සැප්තැම්බර් 28 දින වන විටද ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට අරමුදල විසින් අපොහොසත්ව තිබුණි.

(ල) සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල වෙනුවෙන් පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්මෙහි, ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කර නොතිබුණි.

## 6.3 අයවැය පාලනය

2017 වර්ෂය සඳහා වූ සංශෝධිත අයවැය ලේඛනය මඟින් පරිත්‍යාග ලෙස රු.3,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් රු.19,373,794 ක් ලබා දී තිබුණි.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013 වර්ෂයේ සිට 2016 දක්වා වූ වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2018 සැප්තැම්බර් 28 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) අනුරූ, ප්‍රකාශනවල නිෂ්පාදන පිරිවැය හඳුනාගෙන නොතිබීම. |

(ii) ඇතැම් ණය ශේෂවල ගැලපුම්වලට අදාල ජ'නල් සටහන් ඉදිරිපත් කර නොතිබීම.

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම.

(ii) බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම.

(iii) පෞද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු නොකිරීම

(iv) නිලධාරීන් බඳවාගැනීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම.

(ඇ) ප්‍රසම්පාදනය

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම.

(ii) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ අඩුපාඩු පැවතීම.

(ඈ) අයවැය පාලනය

ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු පැවතීම.

(ඉ) ණයගැති පාලනය

දිගුකලක සිට පවතින ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**03.3 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ විගණන වාර්තාව සම්බන්ධ කරුණු දැක්වීම**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2017/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔබගේ අංක සීඑස්/බී/සීසීඑෆ්/1/17/78 අංක දරන වාර්තාවේ සඳහන් විගණන විමසුම් පිළිබඳව කරුණු දැක්වීමයි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) 2021 වර්ෂයේ සිට ඉදිරි විශේෂ අරමුදල් හා විදේශ අරමුදල් ව්‍යාපෘතිවල තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දැනුම්දෙමි.

(ii) 2024 වර්ෂයේ ගිණුමෙන් මේ පුරාවස්තු පිළිබද හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) වර්තමානයේ සාදනු ලබන ගිණුම් වල කෙටි කාලීන ආයෝජන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දැනුම්දෙමි.

(ii) වර්තමාන ගිණුම්වල මෙය නිවැරදි කර ඇති බව කාරුණිකව දැනුම්දෙමි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06**

ශේෂ පත්‍ර දිනට පසු සිද්ධි සටහන් මගින් හෙළිදරව් කිරීමට වර්තමානයේදී කටයුතු කර ඇති බව කාරුණිකව දැනුම්දෙමි.

**(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර පොත් පත් මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ii) අරමුදල අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය කිරීම සිදුකරමි.

**(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

සියළුම තොග පිරිවැයට අගය කිරීමට කටයතු කර ඇති බව කාරුණිකව දන්වමි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**(අ)** ප්‍රවේශපත්‍ර තොගය අගය කරනු ලබන පදනම මේ වන විට ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති බව කාරුණිකව දන්වමි.

**(ආ)** අඩමාන ණය වෙන් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිය මේ වන විට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති බව කාරුණිව දන්වමි.

**(ඇ)** වර්තමාන වැටුප් පරිමානයන් පදනම් කරගෙන ගිණුම්කරන ප්‍රමිත අංක 19 අනුව 2022 වර්ෂයේ සිට පාරිතෝෂිත වෙන්කිරීම් ගැලපීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.

**(ඈ)** රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත භාවිත කර අරමුදල මූල්‍ය ප්‍රකාශන පිළිවෙල කරයි. ඒවායෙහි පැහැදිලිව දක්වා නොමැති අවස්ථාවලදී පමණක් වෙනත් ශ්‍රී ලංකා හෝ අන්තර්ජාතික ප්‍රමිත අනුගමනය කරයි. වෙනත් ගණකාධිකරණ ප්‍රමිත අනුගමනය කරන අවස්තාවලදී ඒ බව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** වර්තමානයේදී පිළියෙල කරනු ලබන සියළුම ගිණුම් ප්‍රකාශ දෙසැම්බර් 31 දිනට අදාලවන විදේශ විනිමය හුවමාරු අනුමාතය අනුව සියළුම විදේශ මුදල් රුපියල් බවට පරිවර්කතනය කර මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති බව කාරුණිකව දන්විමි.

**(ආ)** මෙම අරමුදල් ගිණුම් පොත් වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.4 පැහැදිළි නොකළ වෙනස්කම්**

**(අ)** අරමුදල පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු වල වටිනාකම් අනුව ගැලපීම සිදුකිරිමට අපහසුවේ. නමුත් වෙනස අවම වන පරිදි ඉදිරියේදී දැක්විමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** ඉදිරියේදී මෙවැනි වැරදි ඇති නොවීමට කටයුතු කර ඇති බව හා උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වමි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) සේවක ණයගැතියේ 2022 වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි.

**(ආ)** ප්‍රවේශපත්‍ර තොගය
මේ වන විට ප්‍රවේශපත්‍ර තොගය සඳහා තොග සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කරන බව කාරුණිව දන්වමි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

ඉදිරි මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට ඉල්ලා සිටින තොරතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**(අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත**

**(i) 4(ඉ) වගන්තිය**

රීති සකස් කිරිමට කටයුතු යොදා ඇත.

**(ii) 4 (ඊ)** වගන්තිය

පාලක මණ්ඩල පත්‍රිකා අංක-217.04.20 අනුව ආයෝජනය කිරීමේ බලය ප්‍රධාන පරිපාලන නිළධාරී වන රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාට පවරා ඇත. ඒ අනුව සියළුම ආයෝජන කිරීමේ බලය ලේකම් මඟින් ලබාගෙන ආයෝජනය කරන බව කාරුණිකව දන්වමි. වර්තමානයේ වන විට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්වය යහපත් අතට හැරී ඇති බැවින් ආයෝජන ආපසු ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැති බව කාරුණිකව දන්වමි.

**(iii) 6 (ඉ) වගන්තිය**

පනත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත**

**(i) 21 (1) වගන්තිය**

මෙම විහාරස්ථාන 4 සසුනෝදය වැඩසටහන යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කොට සංවර්ධනය කර ඇති ව්‍යාපෘති 4 කි. මුල් අවස්ථාවේදී ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොමැති වුවද මෙම ඉදිකිරීම් සිදු කිරීමට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ නිරීක්ෂණ ලබා ගෙන අදාළ සංවර්ධන කටයුතු සිදු කර ඇත. මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව සංවර්ධන කටයුතු සිදු නොකරන බව කාරුණිකව දන්වමි.

රුවන්වැලිසෑය වැලිමළුව සංරක්ෂණය කිරීමේ කාර්යය සඳහා 2016 වර්ෂයේදී මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් කරන ලද ඉල්ලීමට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් MAI/NCP/4/1 අංක දරන 2016.07.13 වන දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇත.

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

**(i) II පරිච්ඡේදයේ 1 :2 වගන්තිය**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ විෂය පථය පුළුල්වීමත් සමඟ සංවර්ධන කටයුතු වඩා විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යාමේ අරමුණින් අධ්‍යාක්ෂ (ආගමික), අධ්‍යක්ෂ (සැලසුම්), වැඩ ඉංජිනේරු, ව්‍යාපෘති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ, පරීක්ෂණ නිලධාරී වැනි නව තනතුරු ඇති කර බඳවා ගැනීම් සිදුකර ඇත. මෙම පත්කිරීම් සියල්ල කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති අතර, ආයතන සංග්‍රහය හෝ බඳවාගැනීම් පරිපාටියේ සඳහන් කරුණු කෙරෙහි පාලක මණ්ඩලය විසින් විශේෂ අවධානයක් යොමුකර නොමැත. එමෙන්ම මෙලෙස බඳවා ගන්නා ඇතැම් නිලධාරීන්ගේ සේවා කාලය එක් අවුරුද්දකටත්, ඇතැම් නිලධාරීන්ගේ සේවා කාලය අවුරුදු 02 ක කාලයකටත් සීමා වී ඇත. වර්තමානය වන විට මෙලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති නිලධාරීන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයෙන් ඉවත්කර ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ අතිදුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති විනාශවීමේ තර්ජනයට ලක්ව ඇති පුරාවිද්‍යා ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කර නිසිලෙස පවත්වාගෙන යාමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ

ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමක දී ගනු ලැබූ තීරණයක් මත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවක අවශ්‍යතාවය සපුරාලීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් බඳවාගැනීම් සිදුකර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමේ අරමුණින් පුරාවිද්‍යා සහායකයින් 1130 ක් හා මුරකරුවන් 2271 ක් ද වශයෙන් මුළු පිරිස ලෙස සේවකයින් 3401 ක් එක් වසරක කාලයක් සඳහා බඳවා ගෙන ඇත.

සම්මුඛ පරීක්ෂණ පවත්වමින් අවස්ථා 04 ක දී මෙම සේවකයින් බඳවා ගෙන ඇති ඇත. එවකට පැවැති මූල්‍ය අර්බුදය මත වසරක කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2019.12.13 දින අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණයක් අනුව 2019.12.31 දිනට සේවයේ යෙදී සිටි ඉතිරි පුරාවිද්‍යා සහායක (කම්කරු) 903 ක සේවක සංඛාව සහ මුරකරු 537 ක සේවක සංඛ්‍යාවගේ වසරක කොන්ත්‍රාත් සේවා කාලය අවසන් වීමෙන් පසු පහත පරිදි සේවය අවසන් කර ඇත.

| | පුරාවිද්‍යා සහායක කම්කරු | මුරකරු | මුළු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 2020.01.31 | 411 | 237 | 648 |
| 2020.02.13 | 174 | 173 | 347 |
| 2020.02.15 | 39 | - | 39 |
| 2020.04.31 | 279 | 127 | 406 |

**(ii)** කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී රජයේ සේවයෙන් විශ්‍රාමගිය නිලධාරින්ගේ වයස පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමුකර නැත. එමෙන්ම මෙම නිලධාරීන් බඳවාගෙන වසරක් කාලයක් අවසානයේ දී ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමක් කර නොමැත.

(iii) කොන්ත්‍රාත් පදනම මත සිදුකර ඇති මෙම පත්වීම ලබා දීමේ දී මධ්‍යම සංස්කෘතික අරමුදලේ බඳවාගැනීමේ පරිපාටියෙහි සඳහන් කරුණු කෙරෙහි හෝ ඒ සඳහා පත්කරනු ලබන නිලධාරියාගේ අධ්‍යාපන සහ වෘත්තිය සුදුසුකම් පිළිබඳව හෝ පළපුරුද්ද පිළිබඳව හෝ විශේෂ අවධානයක් යොමුකර නොමැත. කෙසේ වුව ද 2019.12.20 දින සිට මෙම සේවාලාභියාගේ සේවා දිගුව ලබා දී නොමැත.

**(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**(i) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 (i) චක්‍රලේඛය**

කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී නිලධාරියාගේ වයස හෝ අනෙකුත් බඳවා ගැනීම් ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත. වර්තමානය වන විට මෙම නිලධාරීන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයෙන් ඉවත් කර ඇත.

**(ii) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය - 7 ඡේදය**

එවකට සිටි පාලන අධිකාරිය 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛයේ 7 ඡේදය කෙරෙහි අවධානය යොමුකිරීමකින් තොරව බඳවාගැනීම් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. ඉදිරියේ දී පුරප්පාඩු පිරවීමට අදාළව කරනු ලබන බඳවාගැනීම් සිදුකිරීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**(iii) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන චක්‍රලේඛය 15.2 උප වගන්තිය**

ප්‍රවාහන උපදේශක (තාක්ෂණික) ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති මෙම නිලධාරියාගේ වැටුප සංශෝධනය කිරීමේ දී චක්‍රලේඛවල සඳහන් කරුණු කෙරෙහි පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැති අතර, ඉදිරියේ දී මෙවන් අතපසුවීම් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**(iv) 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 03(i) හා 03(ii) ඡේද**

(i) මෙම නිලධාරීන්ගේ සේවා සඳහා බඳවාගැනීමේ දී චක්‍රලේඛවල සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර නොමැත.

(ii) කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති ඇතැම් නිලධාරීන් වසර 30 ක පමණ පරිපාලන පළපුරුද්දක් ඇති රජයේ හෝ සංස්ථාවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන අතර, ඔවුන්ගේ වැටුප අදාළ වැටුප් ක්‍රමයේ උපරිමයේ තබා වැටුප් ගෙවා ඇත.

ඉදිරියේ දී මෙවන් අතපසුවීම් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**

**(i) 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛය 3.1 ඡේදයේ 2 අනු ඡේදය**

(i) උක්ත කරුණ සම්බන්ධව විගණන නිරීක්ෂණ මගින් පෙන්වා දී ඇති පරිදි වැඩිපුර ගෙවා තිබූ ඉන්ධන වලින් කොටසක් අයකරගෙන ඇත. ඉතිරි මුදල ද අයකර ගැනීම සඳහා සිහිකැදවීම් සිදුකර ඇත.

**(ii) 3.1 ඡේදයේ 2 අනු ඡේදය**

වැඩිපුර ගෙවා ඇති ඉන්ධන දීමනාවෙන් කොටසක් අයකර ගැනීමට කටයුතු කර ඇත.

**(උ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛය

අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා මෙම ප්‍රාග්ධන වියදම් දරා ඇත.

**(ඌ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 ජූලි 21 දිනැති අංක ඩීඑම්එස්/ඊ1/54/9/241 දරන ලිපිය**

මෙම නිලධාරීන්ගේ සේවා සඳහා බඳවාගැනීමේ දී චක්‍රලේඛවල සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර නොමැත. ඉදිරියේ දී මෙවන් අතපසුවීම් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කිරීමේදී අරමුදල විසින් සංවිධානය කරන ලද විවිධ උත්සව කටයුතු වෙනුවෙන් අනුරූ පාසල මගින් ඉදිකරන ලද තොරණ හා වෙනත් සැරසිලි කටයුතු වෙනුවෙන් දරන ලද පිරිවැය මේ යටතේ දක්වා ඇත.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

පනතේ සඳහන් අරමුණු සාක්සාත් කර ගැනීම ඉලක්ක කරගත් සියළුම ක්‍රියාකරකම් ඇතුලත් ක්‍රියාකාරි සැළැස්මක් මේ වනවිට සකසා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති 27 ක් සඳහා කැණීම්, සංරක්ෂණ, සංවර්ධන හා කොන්ත්‍රාත් කාර්යයන් ඇතුළත් කරමින් සංවර්ධන අංශය මගින් වාර්ෂිකව වැඩ සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. නමුත් සමස්ත ආයතනයට ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙතෙක් ඉටු කර ගැනීමට නොහැකි වී ඇත.

**4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

**(අ)** ආගමික කටයුතු ප්‍රවර්ධනය ඇතුළු පනතේ සඳහන් සියළුම අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය මුදල් වර්ධනය කර ගැනීම සඳහා සංචාරකයන් ආකර්ශනය කර ගැනීමට අලෙවි ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

**(ආ)** කැණීම් හෝ සංරක්ෂණ කාර්යයන් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී ඉලක්කගත ප්‍රමාණයට සාපේක්ෂව වැය වන මුදල අවිනිශ්චිතව ගණනය කිරීම් සිදුවේ. වැඩ ආරම්භ කර පවත්වාගෙන යාමේදී ඉලක්කගත ප්‍රමාණයට වඩා අඩුවෙන් භෞතික ප්‍රගතිය කරා ළඟා වීමට සිදු විය හැකිය.

නිදසුන් ලෙස සංරක්ෂණ ක්‍රියාවලියේදී වහළය, බිත්ති, පොළොව ආදී අයිතම සඳහා අනුමාන ලෙස ඇස්තමේන්තු ගණනය කිරීම් සිදු කෙරේ. කාර්යය කරගෙන යාමේදී අනුමාන කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් කෙරෙන අවස්ථා පවතී. ඒ අනුව ඇස්තමේන්තුගත මුදල හා සත්‍ය වියදම අතර වෙනසක් පැවතිය හැකිය.

**(ඈ)** ව්‍යාපෘති මගින් ඉදිරිපත් කරන වැඩබිම් ප්‍රමාණය ඇතුළත් කරමින් වර්ෂය ආරම්භයේදී වාර්ෂික වැඩ සැලැස්ම සකස් කරනු ලබයි. නමුත් ඇතැම් වැඩබිම් කඩිනමින් අවසන් කිරීමට සිදුවන අවස්ථා පැවතියහොත් ප්‍රමුඛතාගත කිරීම් සිදු වන බැවින් එවැනි අවස්ථාවලදී අදාළ නිශ්චිත වැඩබිම සඳහා වූ මිනිස් ශ්‍රමය එම වැඩබිම් (කඩිනමින් කළ යුතු වැඩබිම්) යෙදවීමට සිදු වේ. එවැනි අවස්ථාවලදී යෝජිත කාර්යයන් සියල්ලම සිදු නොකරන අවස්ථා පැවතිය හැකිය.

එමෙන්ම උපදේශන සේවා ලබා ගැනීමේ අපහසුතා මත ඇතැම් වැඩබිම් සිදු නොවූ අවස්ථා මෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ප්‍රමාද වීම නිසා ද වැඩබිම් නොකරන ලද අවස්ථා ද පවතී.

**(ඈ)** පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්මාරකවල හදිසි සංරක්ෂණ හා නඩත්තු කාර්යයන් පැවතියහොත් එවැනි අවස්ථාවලදී කඩිනමින් මැදිහත් විය යුතු අවස්ථා පවතී. එවැනි අවස්ථාවලදී වාර්ෂික වැඩ සැලැස්මට පරිබාහිරව ක්‍රියාකාරකම් සිදු කෙරෙන අවස්ථා ඇත.

**(ඉ)** අදාළ වර්ෂය සඳහා ඇතුළත් ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵල ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබේ.

**(ඊ)** සසුනෝදය ජාතික වැඩසටහන යටතේ පළමු අදියර යටතේ ආගමික සිද්ධස්ථාන 150 කට ද දෙවන අදියර යටතේ ආගමික සිද්ධස්ථාන 815 කට ද ප්‍රතිපාදන ලබා දී ඇත. විගණන නිරීක්ෂණ මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කය යටතට ගණනය කර ඇති සමහර ආගමික සිද්ධස්ථාන පුත්තලම දිස්ත්‍රික්කයට අයත් වේ. නුවරඑළිය, යාපනය, මන්නාරම, මුලතිව්, හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක සඳහා පරිත්‍යාග ලබා දී නොමැත. ඒ අනුව ආධාර මුදල් ලබා දී නොමැති දිස්ත්‍රික්ක 05 කි. කෙසේ වුවද ඉදිරියේදී මෙම වැඩ සටහන් දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නිර්දේශ හා ඇස්තමේන්තු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් ලබා ගෙන සුදුසු වෙහෙර විහාර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් හා ඒ ආකාරයටම විධිමත් පරිදි ගෙවීම් සිදු කිරීම හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමටත් කටයුතු කරනු ලැබේ.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**(අ)** කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතිය පවතින්නේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්ට වේ. මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

**(ආ)** අන්තර්ජාලය මගින් විද්‍යුත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පූර්ව සාකච්ඡා වට ගණනාවක් සිදුකර ඇත. 2019 මාර්තු මස සිට සීගිරිය ව්‍යාපෘතිය නැරඹීමට පැමිණෙන සියළුම සංචාරකයින් සඳහා මෙම පද්ධතිය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත.

**(ඇ)** විද්‍යුත් මාධ්‍යය හරහා ගෙවීම් ලබාගැනීමට අවශ්‍ය බලය සහ වගකීම සේවකයන් වෙත ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහිත කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. එමෙන්ම උචිත අභ්‍යන්තර පාලන පද්ධති හා ආරක්ෂක පද්ධති ඇති කිරීම සඳහාද කටයුතු කරනු ඇත.

**(ඉ)** ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ ආයතනය තොරතුරු සංනිවේදන කටයුතු සඳහා රජය මඟින් පත්කර ඇති ආයතනය වන අතර, සියළු තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට වැලකීමෙන් බැඳී සිටින බව කාරුණිකව දන්වා සිටිමි.

**(ඊ)** මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා කැබ්රථ මිලදී ගැනීමට අදාළ පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.

**(උ)** මධ්‍යම සංස්කෘතික අරමුදලේ ත්‍රිකුණාමලය ව්‍යාපෘතියේ සේවය කල ආර්.එම්. කරුණාරත්න මහතා විශ්‍රාම ගන්වන අවස්ථාවේදී විනය දඩුවම් පැමිණවීමකට අදාළව රු. 97,704.75 ක මුදලක් ඔහුගෙන් අයකර ගෙවීම් කර තිබුණි. නමුත් මෙම අයකිරීමට විරුද්ධව ඔහු විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සිදුකරන ලද පැමිණිල්ලක් හේතුවෙන් එම අයකල මුදල අධිභාරයද සමග ආපසු ගෙවීමට තීරණය වී තිබුණි. මෙහි දී අධිභාරය වශයෙන් ගෙවා ඇති මුදල රු.19,540.09 කි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**(අ)** අනුරූ නිෂ්පාදන අංශයේ හා මුද්‍රණ අංශයේ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී ඍජු වියදම් පමණක් නොව වක්‍ර වියදම් ද ඇතුළත් කර ඇත. පොදු කාර්ය වියදම් ලෙස ප්‍රතිශතයක් ඍජු වියදම්වලට එකතු කිරීමෙන් වක්‍ර වියදම්, මිල ගණනය කිරීමේ දී සලකා බලා ඇත.

**(ආ)** 2017 වර්ෂයට යෝජිත වැඩබිම් සඳහා ඇස්තමේන්තුගත කිරීමේදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ ස්ථිර සේවක වැටුප උපයෝගි කර ගනිමින් ඒ ඒ කාර්යයට අයත් මිනිස් දින වියදම ගණනය කර ඇත. කාර්යයන් ඉටුකිරීමේදී කාර්යයන් සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින්ගේ පුරප්පාඩු සඳහා ඒ ඒ කාර්යයන් සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ ශ්‍රමිකයින් බඳවා ගනිමින් කාර්යයන් ඉටුකර ඇත.

එහිදී පහත දක්වා ඇති වැඩබිම් සඳහා යෝජිත මිනිස් හා භාවිතමය මිනිස් දින ප්‍රමාණයන් ඇස්තමේන්තු හා වැඩ වාර්තා අනුව පහත දක්වා ඇති පරිදි වේ.

| වැඩබිම | යෝජිත | සත්‍ය | අමතර භාවිතය |
|---|---|---|---|
| රුවන්වැලි සෑ මළුව සංරක්ෂණය | 1749'50 | 3201'00 | 1784'00 |
| ගොඩනැගිලි නඩත්තු | 125'00 | 222'00 | 97'00 |
| විද්‍යාත්මක නඩත්තු | 837'50 | 1004'50 | 167'00 |
| දෛනික නඩත්තු | 8489'00 | 11252'50 | 2763'50 |
| එකතුව | **11201'00** | **15680'00** | **4811'50** |

ඉහත දත්ත අනුව කාර්යයන් ඉටු කිරීමේදී ඇස්තමේන්තුගත මිනිස් දින ප්‍රමාණයට වඩා අමතර මිනිස් දින ප්‍රමාණයන් වැය වී ඇත. ඒ සඳහා හේතු වූ කරුණු පහත දක්වා ඇති පරිදි වේ.

එහිදී පුහුනු ශ්‍රමිකයින් වෙනුවට දිස්ත්‍රික් මිල ගණන් යටතේ ශ්‍රමිකයින් යොදා ගැනිමේ දී ඔවුන්ගේ කාර්යය පිලිබඳ අවශ්‍ය නිපුණතාවය ක්‍රමයෙන් වර්ධනය වීමට අවශ්‍ය පුහුණුව ලබා දෙමින් අවශ්‍ය කාර්ය සාධන මට්ටම ඉහල මට්ටමකට ගෙන ඒමට සිදු වූයෙන් අමතර කාලයක් වැය විය.

සංරක්ෂණ කාර්යයයේදි (වැලි මළුව) කාලගුණික හා දේශගුණික හේතූන් මත පස් කැපීමේ ක්‍රියාවලිය අසීරු වීම හේතුවෙන් වැඩි මිනිස් දින ප්‍රමාණයක් වැය විය.

උදා:- දැඩි හිරු රශ්මිය හේතුවෙන් පස් කපා ඉවත් කිරිමේදි දැඩි ආයාසයක් දැරීම.
පස් තට්ටු ජලය ගසමින් ලිහිල් කරමින් පස් කැපීම සඳහා වැඩි ශ්‍රමයක් වැය විය.
වැසි දිනවලදී භූමිය වගුරු ස්වභාවයක් ගැනීම හේතුවෙන් පස් කැපීම අසිරු වීම ආදිය

ඇස්තමේන්තුවට අයත් නොවූ කාර්යයන් සිදු කිරිමට සිදු වීම.

උදා :- 01. නායක ස්වාමීන් වහන්සේගේ මැදිහත් විම මත වැලි මළුවට අවශ්‍ය වැලි පරිත්‍යාග ලෙස ලැබුනු අතර, වැලි මළුවට සුදුසු ආකාරයට එම වැලි සකසා ගැනීමට සිදු වූ හෙයින් ඒ සඳහා වැඩි ශ්‍රමයක් වැය විය. එනම් වැලිවල අඩංගු වූ තිරිවානා ගල් ඉවත් කිරීම. එහිදී දැල් උපයෝගී කරගෙන පේෂණය කිරීම ද සියළු වැලි පේෂණය කිරීමට ද සිදුවිය. ඒ සඳහා වැඩි ශ්‍රමයක් වැය විය.

02. පස් කපා යෑමේ දි පැරණි ස්මාරක මතුවිමේ දි සියුම් ආකාරයට කැණීම් කටයුතු සිදු කිරිමට වැඩි කාලයක් ගතවීම, භූමිය පුරා විසිරී පැවති පුරා කෘති තෝරා සුදුසු පරිදි ස්ථාන ගත කිරීම වැනි කාර්යයන් වැලි මළුවේ ඇස්තමේන්තුගත මිනිස් දින ප්‍රමාණයන්ට වඩා අමතර මිනිස් දින වැඩි වීමට හේතු වූ කරුනු ලෙස දැක්විය හැකිය.

එහිදි ඇස්තමේන්තුගත වැඩ ප්‍රමාණයට වඩා වැඩි ඒකක 314.30 ක් සිදු කර ඇති අතර, එනම් භෞතික ප්‍රගතිය 30% ක් වී තිබේ. එම කාර්යයන් ඉටු කිරීමේ දී 64% ක කාර්යසාධන මට්ටමක් රඳවා ගෙන ඇත.

ගොඩනැගිලි නඩත්තු යටතේ යෝජිත කර්යයන් ඉටු කිරිමේ දී එයට අමතරව කාර්යයන් ඉටු කර ඇත. වැලි මළුවේ සංරක්ෂණ කටයුතු සඳහා නිරන්තරයෙන් ප්‍රධාන කාර්යාලයේ හා අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ නිරික්ෂණ හා අධික්ෂණ කටයුතු වලට පැමිණිම හේතුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුරාධපුර සංචාරක බංගලාවේ නවාතැන් ගැනීමට අවශ්‍ය පහසුකම් සැළසීමේ දී සංචාරක බංගලාවේ අළුත්වැඩියා කිරිමේ කටයුතු අවශ්‍යතාවය අනුව සිදුකර ඇත. එමෙන්ම රුවන්වැලි සෑ පිරිවෙන පැවති හරිස්චන්ද්‍ර ගොඩනැගිල්ලේ වහළයේ අළුත්වැඩියා කිහිපයක් අමතර කාර්යයන් ලෙස සිදු කර ඇත. ඒ අනුව ඒ සඳහා ද වැඩි මිනිස් ශ්‍රමයක් වැය වී ඇත. එහි දී ඇස්තමේන්තු ගත මිනිස් දින වලට අමතරව මිනිස් දින 97 ක් වැය වී ඇත. ඇස්තමේන්තු ගත වැඩ ප්‍රමාණයට අමතරව වැඩ ඒකක 51.60 ක අමතර වැඩ ප්‍රමාණයක් කර ඇති අතර වැඩි වශයෙන් නුපුහුණු ශ්‍රමිකයන් (දිස්ත්‍රික් මිළ යටතේ බඳවා ගත්) සේවකයන් මෙම අමතර කාර්යන් සඳහා යොදවා ගැනීමට කටයුතු සිදුකර ඇති බැවින් වැඩි ශ්‍රමික කාලයක් ගත වීමට හේතු වී ඇත. නමුත් සමස්ත කාර්යය සඳහා සමස්ථ කාර්යය සාධක මට්ටම 124% ක් රඳවා ගෙන තිබේ.

විද්‍යාත්මක නඩත්තු කාර්යයේ දී එම කාර්යය සඳහා පුහුණු ශ්‍රමියකයන් වෙනුවට දිස්ත්‍රික් සේවකයන් යොදා ගනිමින් කාර්යයන් ඉටු කර ඇති හෙයින් එම කාර්යයන් සඳහා එම සේවකයන් පුහුණු කරවා ගනිමින් කාර්යයන් ඉටු කර ඇත. එහි දී කාර්යය නිපුණතාවය අඩු හෙයින් එම සියුම් කටයුතු සඳහා වැඩි ශ්‍රමයක් වැය වීමට හේතු වී තිබේ.

දෛනික නඩත්තු සඳහා යෝජිත මිනිස් දින ප්‍රමාණයට වඩා 2763.50 ක් වැය කර ඇත. මෙහිදී අමතර වශයෙන් වැඩ ඒකක 589.59 ක් සිදු කර ඇත. කෙසේ වුවත් දෛනික නඩත්තු කටයුතුවලට අයත් කාර්යයන් සඳහා ලබා දී ඇති ශ්‍රමිකයන් කළ යුතු නියමිත වැඩ ප්‍රමාණයන් (norm) සම්පූර්ණ කිරිමට අසීරු වී තිබිම පිළිබඳව වැඩිදුරටත් සැළකිලිමත් වීමට සිදුව තිබේ.

නමුත් 2017 වර්ෂයේ වැලි මළුවේ සංරක්ෂණ කටයුතු අවසන්ව සිදුකර රාජ්‍ය උත්සවය සඳහා අමතර කාර්යයන් හා උත්සව කටයුතු සඳහා සිදුකළ කාර්යයන් සඳහා යෙදවූ මිනිස් දින ද මෙම වැඩ වාර්තාව යටතේ ඉදිරිපත් කර ඇත. ඒ අනුව වැඩි ශ්‍රමික දින වැය වී ඇත.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**(අ)** 2011 පෙබරවාරි මස 2 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/0169/555/004 ට අනුව පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමණාකරනය සඳහා "පුරාවිද්‍යා උරුම කළමණාකරන භාරය"නමින් අරමුදලක් පිහිටුවා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයා ගනු ලබන ආදායමෙන් 25% ක් පුරාවිද්‍යාත්මක ස්ථාන පවත්වාගෙන යාම සඳහා ලබාදිය යුතු බවට තීරණය කර තිබේ.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වනුයේ පුරාවිද්‍යා උරුම ස්ථානයන් නැරඹීමට පැමිණෙන දේශීය/ විදේශීය සංචාරකයින්හට ප්‍රවේශපත්‍ර අලෙවියෙන් ලැබෙන මුදල් වේ. මෙම ආදායමෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2019 වර්ෂයේදී සිටි 3000 කට අධික කාර්යය මණ්ඩලයට වැටුප් ගෙවීමද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත සේවයේ යොදවන ලද කම්කරු හා මුරකරු සේවක මහතුන් 1500 කට අධික ප්‍රමාණයකට වැටුප් ගෙවීම සඳහා දරණ ලද වියදම්ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තු බඳවා ගන්නා ලද පුරාවිද්‍යාත්මක ස්ථාන කැණීම් කර සංරක්ෂණය කර නඩත්තු කරමින් පවත්වාගෙන යාමට හා අනෙකුත් පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් ලෙස විශාල පිරිවැයක් දැරීමට සිදුවිය. එබැවින් සම්පූර්ණ ප්‍රවේශපත්‍ර ආදායමෙන් 25% ක් ලබාදීමට නොහැකි බව පෙනේ. තවද අනාගත අවධානම් තත්ත්වයන්ට මුහුණදීම සඳහා ඉතිරි මුදල් දිගුකාලීන හා කෙටි කාලීන ආයෝජන මාර්ගයන්හී ආයෝජනය කිරීමද සිදු වී ඇත.

එබැවින් පුරාවිද්‍යා උරුම භාරය වෙත 25% ක් ලබාදීම සිදුකරනු ලබනුයේ වරින්වර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ඉල්ලීම් හා එම අවස්ථාව වන විට අරමුදලේ පවතින මූල්‍ය හැකියාවද සලකා බලමිනි. 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රවේශපත්‍ර ආදායම පහළ බැසීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත එම වර්ෂයේ රු.658,954,941.00 ක මුදලක් ගෙවීම් කිරීමෙන් පසුව එම වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුව රු.130,694,443.00 ක හිඟයක් (deficit) පෙන්නුම් කර තිබේ. එසේම 2020, 2021, 2022 වර්ෂයන්හී රටතුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය/ විදේශීය සංචාරක පැමිණීම සීඝ්‍රයෙන් පහළ බැසීම හේතුවෙන් අරමුදලේ ආදායම් තත්ත්වයද සීඝ්‍රලෙස පහත වැටුණි. අරමුදලේ කාර්යය මණ්ඩලයට මාසික වැටුප් ගෙවීමට පවා නොහැකි තත්ත්වයක් උද්ගතවීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයෙන් වැටුප් ගෙවීම සඳහා මුදල් ලබා ගැනීමට පවා සිදුවිය. පසුව මහා භාණ්ඩාගාරයට මුදල් නොමැති වීම හේතුවෙන් ලංකා බැංකුවෙන් රු.මිලියන 1020 ක ණය මුදලක්ද වරින්වර ලබා ගන්නා ලදි. ඒ සඳහා ද මාසිකව ණය වාරික හා ණය පොළී ගෙවීමට සිදුවිය. එසේම එම වර්ෂයන්හී මධ්‍යම සංස්කෘතික අරමුදලේ දැඩි වියදම් පාලනයක් සිදුකර මින් පවත්වාගෙන යන ලදි. මේ හේතුවෙන් එම වර්ෂවල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව 25% ක දායකත්ව මුදල ලබාදිය නොහැකි වී ඇත.

ඉදිරියේදී පහත පරිදි ක්‍රියා කිරීමට සැලසුම් කරගෙන යනු ලබන බව විගණනය වෙත කාරුණිකව දන්වා සිටිමි.

- 2011 වසරේදී අනුමත කරගෙන ඇති මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරයේ ඇති ස්ථාන වලින් උපයන ශුද්ධ ප්‍රවේශපත්‍ර ආදායමෙන් 25% ක් ලෙසට සංශෝධනය කිරීම.

- මෙසේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත වරින්වර කරනු ලබන උක්ත ඉල්ලීම සඳහා ලබාදෙනු ලබන දායකත්ව මුදල් මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ අංක 8 (ආ) උප වගන්තිය

ප්‍රකාරව අදාල වැඩබිම්වල වැඩ අවසන් කිරීමෙන් පසු හෝ කරන ලද වැඩ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලට පියවීම් කිරීමේ පදනමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 25% දායක මුදල් නිදහස් කිරීම.

**(ආ)** වර්තමානය වන විට මද්‍යම සංස්කෘථක අරමුදලේ මූල්‍ය තත්වය යහපත් අතට හැරී ඇති බැවින් ස්ථාවර තැන්පතු ආපසු ගැනීම සිදු නොකරන බව කාරුණකිව දන්වා සිටිමි.

**4.5 වෙනත් බාහිර පාර්ශවයන් හා රාජ්‍ය ආයතනයන් වෙත ලබාදුන් අරමුදලේ සම්පත්**

**(අ)** මෙම දේපල 2023.01.09 දින සිට 2053.01.03 වන දින දක්වා දීර්ඝ කාලීන බදු සී/ස සහන සේවක සමිතිය වෙත ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**(ආ)** මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා ගොඩනැලිදි දෙපාර්තමේන්තුයව මඟින් කටයුතු කරන බව කාරුණිව දන්වමි.

**4.7 කාර්යමණ්ඩල පරිපාලනය**

**(අ)** ස්ථිර වශයෙන්ම නීති නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගන්නා තෙක් මෙලෙස කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් පත්කර සේවය ලබා ගන්නා ලදි.

ස්ථිර වශයෙන් මෙම තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගැනීමට ඉදිරියේ දී ක්‍රියාකරනු ඇත.

**(ආ)** කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී නිලධාරියාගේ වයස හෝ අනෙකුත් බඳවා ගැනීම් ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත. ඉදිරියේ දී මෙවන් අතපසුවීම් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**(ඇ)** ආයතනය වෙත බඳවා ගන්නා ලද නීති නිලධාරීට විසදීමට නොහැකි නීතිමය හා විමර්ශන කටයුතු වෙනුවෙන් මෙලෙස බාහිර නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී ඇත.

**(ඈ)** කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී බඳවා ගැනීම් ක්‍රමවේදයන්, බඳවාගැනීමේ පරිපාටිය හෝ චක්‍රලේඛ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර නොමැත.

**(ඉ)** මෙම පත්වීම් ලබා දීමේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර නොමැත.

**(ඊ)** මෙම සේවකයන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමේ පදනම මත එක් වසරක කාලයක් සඳහා බඳවාගෙන තිබූ අතර, එය පාලක මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත.

**(උ)** කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී නිලධාරියාගේ වයස හෝ අනෙකුත් බඳවා ගැනීම් ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත.

**(ඌ)** කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති මෙම පත්වීම් ලබා දීමේ දී බඳවාගැනීම් ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත.

**(එ)** මෙම පත්වීම් ලබාදීමේ දී බඳවාගැනීම් පරිපාටිය කෙරෙහි හා අනෙකුත් ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත.

**(ඒ)** බඳවාගැනීම් පරිපාටිය සකස්කිරීමේ කටයුතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් හා ආදර්ශක අනුව සකස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් බඳවාගැනීම් පරිපාටිය නැවත සකස් කළ යුතුව ඇත.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019.09.26 දින විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. මෙම අවසන් මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස 2019.11..05 දින පැවති 209 වන පාලක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කිරීම සිදු විය.එම පාලක මණ්ඩල රැස්වීමේ පැවති මතභේදාත්මක තත්වය හේතුවෙන් නව පත්‍රිකාවක් 210 වන පාලක මණ්ඩල රැස්වීමට (2020.02.03) ඉදිරිපත් කරන ලදී (ඇමුණුම 01). එහිදී තීරණය වී ඇත්තේ 2018 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කොට විගණන හා කළමණාකරණ කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශය ලබා ගැනීමෙන් පසුව නැවත පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසටය. පසුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කල විට තීරණ 212.02.01 අනුව 2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා පූර්ව විගණනයක් කර ගන්නා ලෙසට විගණකාධිපතිවරයා උපදෙස් ලබා දී තිබේ (ඇමුණුම 02). ඒ අනුව විගණකාධිපතිවරයා විසින් ඒ සඳහා විශේෂ විගණනයක් සිදු කොට වාර්තාවක් 2022.03.14 දින ලබා දෙන ලදී.මෙම කරුණු හේතු කොට ගෙන 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. එසේ වුවද 2019, 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පිළියෙළ කර තිබිණි.

2025.01.17 දින වන විට 2019 වර්ෂයේ අවසන් ගිණුම් විගණනය කර ලබා දී ඇත. 2019 වර්ෂයේ පෙන්වා දී ඇති වැරදි හා අඩු පාඩු 2020 වර්ෂයෙන් ගිණුමට ගලපා විගණනය වෙත ලබා දිය යුතු වේ. එම කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

**6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.2.1 ප්‍රසම්පාදනයන්**

**(අ)** බඳවා ගැනීම් පරිපාටිය සකස් කිරීමේ කටයුතු කෙරෙමින් පවතින අතර, සේවා පැවරුම් කොන්දේසි ලේඛනයක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ (TOR).

**(ආ)** බඳවාගැනීම සකස් කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ සුදුසුකම් පිළිබඳව ක්‍රමවේදයන් පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නොමැත.

**(ඇ)** ඉදිරියේ දී කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹී කොන්ත්‍රාත් බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

**(ඇ)** වර්තමානයේදී නීතිමය ආකාරයට අත්තිකාරම් සුරක්ෂණයන් ලබාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නීතිරීති වලට අනුකූලව අත්තිකාරම් ගෙවීම් සිදුකරන බව කාරුණිකව දන්වමි.

**(ඉ)** ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩිය කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉඩමේ අයිතිය පවරා ගැනීම සිදුකල යුතුව ඇත. මේ වන විට ප්‍රධාන කාර්යාලයේ ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

**( උ)** මේ වන විට සකසා ඇති ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**6.3 අයවැය පාලනය**

2017 වර්ෂය සඳහා වූ සංශෝධිත අයවැය ලේඛනය යටතේ රු.මි. 03 ක් වෙන්කර තිබුන ද එම වැය ශීර්ෂය යටතේ මුදල ඉක්මවා ගොස් ඇත්තේ පාලක මණ්ඩල අනුමැතිය සහිතව ජාතික ලේඛණාරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලද රු.13,235,000.00 ත් හා අරමුදලේ අරමුණු ශාක්සාත් කර ගැනීම සඳහා වන උත්සව ආදිය සංවිධානය කිරීම සඳහා අනුරු මධ්‍යස්ථානය විසින් ඉදිකරනු ලබන තොරණ හා වෙනත් සැරසිලි කටයුතු වල පිරිවැය ඇතුලත් කර තිබීම හේතුවෙනි.

**6.4 වාර්ෂික වාර්තා සභාගත කිරිම**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2012, 2013, 2014 හා 2015 වාර්ෂික වාර්තා සභාගත කිරීමට අවශ්‍ය කටයුතු අවසන් කර ඇත.

2016 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

**7. පද්ධති හා පාලනයන්**

**(අ)**

(i) වර්තමානය වන විට අනුරු, අරමුදලේ ප්‍රකාශන හා ලේඛකාධාර ප්‍රකාශන පිරිවැයට ගිණුම්ගත කරන බව කාරුණිව දන්වා සිටිමි.

(ii) මේ වන විට ණය ශේෂවල ගැලපුම්වලට ආදළ ජ'නල් සටහන් නිවැරදිව ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**ආ) කාර්ය මණ්ඩල පරිපාලනය**

**(i)** වර්තමානය වන විට පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ප්‍රකාරව කටයුතු කරමින් සිටී.

**(ii)** අවස්ථා ගණනාවකදී ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ආදර්ශකයට අනුව බඳවාගැනීම් පරිපා සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
මධ්‍යම සංස්කෘතික අරමුදලේ වෘත්තිය සමිති වල විරෝධතා හා බලපෑම් හේතුවෙන් බඳවාගැනීම් පරිපාටිය සකස් කිරීමේ කටයුතු මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇත.

(iii) පෞද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී.

(iv) වර්තමානයේ බඳවාගැනීම් සිදුකිරීමේ දී චක්‍රලේඛ අනුව කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.

**(ඇ) ප්‍රසම්පාදනය**

(i) මේ වන විට සියළු ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කරමින් සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ii) මේ වන විට නිවැරදි ප්‍රසම්පාදන සැලැස්මක් සකසා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**(ඇ) අයවැය පාලනය**

මේ වන විට ප්‍රධාන කාර්යාලය ඇතුළත්ව ව්‍යාපෘති 27 ක් සඳහා වෙන වෙනම අයවැය සකස්කර ඒ සියල්ලේ එකතුව සඳහා වෙනම ප්‍රධාන අයවැයක් සකසනු ලැබේ. මෙම ප්‍රධාන අයවැය පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් පසුව එම සීමාවන් යටතේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් කටයුතු කරන බව කාර්ණිකව දන්වමි.

**ආචාර්ය නිලාන් කුරේ**
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම සංස්කෘතික අරමුදල.

දුරකථන අංකය :- 011-2508964
ෆැක්ස් අංකය :- 011-2500802
විද්‍යුත් ලිපිනය :- info@ccf.gov.lk

## 04. කාර්ය සාධන දර්ශකය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | ව්‍යාපෘතිය | විස්තරය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0 - 25% | 26% - 50% | 51% - 75% | 76% - 100% |
| 01 | අභයගිරිය ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 02 | මහාවිහාර ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 03 | ජේතවනය ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 04 | පොළොන්නරුව ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 05 | සීගිරිය ව්‍යාපෘතිය | සංරක්ෂණ | | | ✓ | |
| 06 | දඹුල්ල ව්‍යාපෘතිය | සංරක්ෂණ | | ✓ | | |
| 07 | මහනුවර ව්‍යාපෘතිය | කැණීම් | | | ✓ | |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 08 | රම්බා විහාර ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 09 | තිස්සමහාරාම ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 10 | ගාල්ල ව්‍යාපෘතිය | කැණීම් | | | ✓ | |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 11 | මාතර ව්‍යාපෘතිය | කැණීම් | | ✓ | | |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 12 | මොණරාගල ව්‍යාපෘතිය | කැණීම් | | ✓ | | |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 13 | යාපහුව ව්‍යාපෘතිය | කැණීම් | | ✓ | | |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 14 | දඹදෙණිය ව්‍යාපෘතිය | කැණීම් | | | ✓ | |
| 15 | පඬුවස්නුවර ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | | | ✓ |
| 16 | කුරුණෑගල ව්‍යාපෘතිය | කැණීම් | | ✓ | | |
| | | සංරක්ෂණ | | | ✓ | |
| 17 | යාපනය ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | ✓ | | |
| 18 | බදුල්ල ව්‍යාපෘතිය | සංරක්ෂණ | | | ✓ | |
| 19 | අපේ ගම ව්‍යාපෘතිය | සංවර්ධන | | | ✓ | ✓ |
| 20 | රත්නපුරය ව්‍යාපෘතිය | කැණීම් | | | | ✓ |
| | | සංරක්ෂණ | | ✓ | | |
| 21 | ගම්පහ ව්‍යාපෘතිය | කැණීම් | | ✓ | | |
| | | සංරක්ෂණ | | ✓ | | |
| 22 | කොළඹ ව්‍යාපෘතිය | සංරක්ෂණ | | | | ✓ |
| 23 | කෑගල්ල ව්‍යාපෘතිය | සංරක්ෂණ | | | ✓ | |

## 05. තිරසර සංවර්ධනය (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

**තිරසර අරමුණු 04 - සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම හා දිවිය පුරා ම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම**

- මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන ව්‍යාපෘති කිහිපයකට අනුයුක්තව කෞතුකාගාර පිහිටුවා ඇති අතර, එම කෞතුකාගාර නැරඹීමට පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන පැවැත්වීම සිදු කිරීම
- ප්‍රකාශන අංශයේ ඇති පුස්තකාලය මඟින් තොරතුරු සොයා පැමිණෙන සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට ඒ අදාළ අධ්‍යාපනික තොරතුරු ලබාගැනීමට අවශ්‍ය සියළු පහසුකම් සම්පාදනය කර දීම
- පුවත්පත් දැන්වීම් පළකිරීම මඟින් බටලීය ජාතික අනුරූ පාසල වෙත වසර දෙකක අධ්‍යයන කාලයකට යටත්ව සිසුන් බඳවා ගැනීමට කටයුතු කර න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමට කටයුතු කිරීම
- පාසල්වල හා අනෙකුත් බාහිර ආයතනයන්ගේ ඉල්ලීම පරිදි අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි පැවැත්වීම
- විශ්වවිද්‍යාලවල ඉල්ලීම් පරිදි විශ්වවිද්‍යාල සිසුන්ට කැණීම් හා සංරක්ෂණ කටයුතු සම්බන්ධ මාස 06 ක පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම

**තිරසර අරමුණු 08 - සියලුදෙනා සඳහා කල්පවත්නා, පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම**

- මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත බඳවාගෙන ඇති කාර්ය මණ්ඩලය සඳහා ඒ ඒ අදාළ කාලයන් තුළ දී උසස්වීම් ලබා දීම තුළින් ඔවුන්ගේ රැකියාව පිළිබඳ තෘප්තිය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- රජය විසින් නිකුත් කරනු ලබන විවිධ චක්‍රලේඛයන්ට අනුකූලවන පරිදි කාර්ය මණ්ඩලයේ රැකියා ස්ථායිතාව ආරක්ෂා කිරීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකිරීම

**තිරසර අරමුණු 09 - ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ සහ තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය**

- සංචාරක ස්ථානයන් නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ අවශ්‍යතා හා වුවමනා වඩාත් ඵලදායි ලෙස සපුරාගැනීමට හා සංචාරක ආකර්ශනය වැඩිකර ගැනීම සඳහා සියළු සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වර්ධනය කිරීම හා දෛනික නඩත්තු කටයුතු සිදු කිරීම
- නවීන තාක්ෂණය භාවිතා කර කාර්යාලීය කටයුතු, කැණීම් හා සංරක්ෂණ පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කර දීම

**තිරසර අරමුණු 14 - තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සාගර සම්පත් සුරක්ෂිතව, කල්පවත්නා පරිදි භාවිත කිරීම**

- ශ්‍රී ලංකාවේ මුහුදු පුරාවිද්‍යා කැණීම්, ගවේෂණ හා පර්යේෂණ කටයුතු විද්‍යාත්මක පදනමකින් යුතුව සිදුකිරීම සඳහා මුහුදු පුරාවිද්‍යා ඒකකය, රසායනාගාරය හා කෞතුකාගාරයත් ආරම්භ කර සාගර සම්පත් සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අතීත උරුමයන් අනාගත පරපුර උදෙසා දායාද කිරීමේ අරමුණින් සිදුකරනු ලබන පුරාවිද්‍යාත්මක උරුම ස්ථාන රැක ගැනීමේ කටයුතු සම්බන්ධව ප්‍රජාව තුළ ඇති දැනුවත් බව අඩුවීම හා එම උරුම ස්ථාන රැකගැනීම වෙනුවට ඒවා කඩා බිඳ දැමීමට කටයුතු කරනු ලබන සමාජයක් වර්තමානයේ බිහිවීමත් සමඟ උරුම ස්ථාන ආරක්ෂා කර ගැනීම ගැටළුකාරී වී ඇත. තත්ත්වය එසේ වුවද හැකි උපරිමයෙන් ප්‍රජාව හා අධ්‍යාපනය ලබන සිසුන් තුළ උරුම ස්ථාන රැක ගැනීමේ ඇති වැදගත්කම පැහැදිළි කර දීම මඟින් හා ඒ සඳහා ඔවුන් පොළඹවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම මඟින් ප්‍රජාව විසින් සිදුකරනු ලබන හානිය වළක්වා ගැනීමට කටයුතු කර, අදාළ කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි. එමෙන්ම ආයතනය සතුව පවතින් සීමිත මානව සම්පත උපයෝගී කර ගනිමින් පුස්කොළපොත් සංරක්ෂණය කිරිමේ කටයුතු හා නව පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම, ලේඛන ගත කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරිම සහ මහජන ප්‍රදර්ශන කටයුතු වර්ෂය පුරාම අඛණ්ඩව සිදුකරන ලදි.

## 06. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යාව

2016.12.31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | ඌණ සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 16 | 07 (05 කොන්ත්‍රාත්) | 09 | - |
| තෘතිය | 46 | 33 | 13 | - |
| ද්විතියික | 478 | 398 | 80 | - |
| ප්‍රාථමික | 2,468 | 2,155 | 313 | - |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත යොදාගත් ආකාරය

ආයතනයේ පරිපාලන කටයුතු හා ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතිය හා ද්විතියික මට්ටමේ කාර්ය මණ්ඩලයේ සේවක ඌණතාවය 2017 වසරේ දී යම්තාක් දුරට අඩුකර ගැනීනමට හැකි වුවද තවදුරටත් ඌණතාවය පවතී. එනමුදු පවත්නා මානව සම්පත උපරිම අයුරින් යොදා ගනිමින් පහළ ශ්‍රේණි මගින් හෝ ආවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබූ අතර, ඒ මගින් ආයතනයේ අරමුණු හා ඉලක්ක ගත සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

ප්‍රාථමික PL-1 ශ්‍රේණියේ අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

- කැණීම්, සංරක්ෂණ මෙන් ම ශාස්ත්‍රීය කටයුතු හා සම්බන්ධ ආයතනයක් බැවින් ඒ හා සම්බන්ධව කටයුතු කරනු ලබන නිලධාරීන්ගේ හා සේවකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය දේශීය හා විදේශීය පුහුණු ලබාදීමට අවශ්‍ය කටයුතු හැකි සෑම අවස්ථාවකදීම ලබාදීමට කටයුතු කළ යුතු වේ.
- ආයතනික නීති රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිළිබඳව, සේවක දැනුම අල්ප බැවින් ඒ සඳහා අදාළ දැනුම හා පුහුණුව නිසි පරිදි ලබාදිය යුතු වේ.
- සේවක අභිප්‍රේරණය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යහපත් ආකල්ප නිරන්තරයෙන්ම ගොඩනැඟිය යුතු බැවින් ආකල්ප සංවර්ධන වැඩසටහන් නිරන්තරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.
- පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මධ්‍යම සංස්කෘතික අරමුදලට අනුයුක්ත කෞතුකාගාර සම්බන්ධ කර ගනිමින් කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට, තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වීම වර්ෂය පුරාම සිදුකරන ලදි.

පාසල්වල හා පන්සල්වල පවත්නා ශාස්ත්‍රීය උත්සව හා ප්‍රදර්ශන කටයුතුවලට සමගාමීව ඉල්ලීම් අනුව ප්‍රදර්ශන පැවැත්වීම සිදු කර ඇත.

## 07. අනුකූලතා වාර්තාව

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | - | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | - | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | - | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මූ.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | - | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස්ක කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ (වාර්ෂික හා කාර්තුමය වශයෙන් සකස් කරනු ලැබේ) | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | - | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | තොරතුරු එක් රැස්කර ගැනීමට ප්‍රමාද වීම හේතුවෙන් බොහෝ අවස්ථාවල දී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | නියම කර ඇති දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට තොරතුරු රැස්කර තබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල නොවේ | විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු නොලැබේ | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ | මාස 06 ක් ඇතුළත කර නොමැත. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ඇත. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල නොවේ | අවශ්‍ය අවස්ථාවල දී පරික්ෂාවට ලක්කරනු ලැබේ. | ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කරනු ඇත. |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | - | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම. | - | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | - | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | - | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | - | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | - | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | - | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | - | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | - | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | - | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | - | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | - | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | ක.සේ.දෙ. වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ අවස්ථා ඇත. | ක.සේ.දෙ. වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | වාර්තා ඉදිරිපත් කර නොමැත | වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල නොවේ | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොමැත | ඉදිරියේදී සකස් කිරීමට නියමිතය |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර නැත. | ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්මක් සකස් කර නැත | ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල නොවේ | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කර නැත | ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය. |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නැත | ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය. |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල නොවේ | නිලධාරියෙකු පත් කර නොමැති අතර, පුහුණු හා වැඩමුළුවලට අදාළ කටයුතු පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. | ඉදිරියේ දී නිලධාරියෙකු පත්කර අදාළ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |